# 3

# ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

## 3.1 සමස්ත නිරීක්ෂණ

සැලකිය යුතු මට්ටමේ සමාජ ආර්ථික බලපෑම් ඇති කරමින්, විදුලි හා බලශක්ති මෙන්ම මානුෂීය අර්බුද වෙත මග පෑදූ, උග්‍ර වූ ගෙවුම් ශේෂ සහ ස්වෛරීත්ව ණය අර්බුද මධ්‍යයේ, 2022 වසරේ දී ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සේවා සැපයීම පෙර නොවූ අන්දමේ අභියෝගවලට ලක් විය. රජය සතු වාණිජ ව්‍යවසායයන් කිහිපයක් සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණ හඳුන්වාදීම ඇතුළු සැපයුම් සහ ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ, 2022 වසරේ අග භාගයේ දී ආර්ථික සේවා සැපයීමෙහි යම් ප්‍රගතියක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, ආර්ථික අභියෝග හේතුවෙන් තීව්‍ර වූ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සේවා සැපයීමේ දී පැවති දුර්වලතා තුළින්, රාජ්‍ය අංශයේ දිගු කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක නොවුණු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි. විශේෂයෙන් ම, 2022 වසරේ මැද භාගයේ දී පැවති සැලකිය යුතු අන්දමේ විදුලිය විසන්ධි කිරීම් සහ ඉන්ධන හිඟය මගින් සමාජ ආර්ථික ක්‍රියාකාරකම්වලට පෙර නොවූ අන්දමේ අවහිරතා ඇති කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසර තුළ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල විශාල පසුබෑමක් සිදු විය. කෙසේ වෙතත්, ජලවිදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ යෑම මෙන්ම, ඉන්ධන සැපයීම සඳහා ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය (QR Code) හඳුන්වා දීම, ගෑස් ආනයනය සඳහා විදේශීය මූල්‍ය සහාය ලබා ගැනීම, දිගු කාලයක් මුළුල්ලේ අවශ්‍යව පැවති ඉන්ධන නිෂ්පාදිත සහ විදුලිය ගාස්තු සඳහා වන පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍ර පදනම් මිල සංශෝධන හඳුන්වා දීම ඇතුළු සැපයුම් සහ ඉල්ලුම් අසමතුලිතතාවන් විසඳාලීමට හඳුන්වා දුන් ක්‍රියාමාර්ග මධ්‍යයේ, 2022 වසරේ දෙවන භාගය තුළ දී බලශක්ති අර්බුදයේ තීව්‍රතාව පහව ගියේය. ඒ අනුව, වෙනත් සාධක අතර, ගෝලීය බලශක්ති මිල ගණන්වල වෙනස්වීම පිළිබිඹු කරමින්, ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් 2022 වසරේ අවස්ථා කිහිපයක දී සංශෝධනය කරන ලද අතර, 2022 වසරේ මැයි මාසයේ සිට මිල සූත්‍රයක් මත පදනම්ව, එම මිල සංශෝධන සිදු කෙරිණි. වසර අටකට වඩා වැඩි කාලයකට පසුව 2022 වසරේ අගෝස්තු මාසයේ දී විදුලි ගාස්තු ඉහළ නැංවූ අතර, 2023 වසරේ සිට මාස හයකට වරක් විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ යාන්ත්‍රණය ආරම්භ කිරීමෙන් අනතුරුව 2023 වසරේ පෙබරවාරි මාසයේ දී විදුලි ගාස්තු යළි ඉහළ නංවන ලදී. ජල ගාස්තු ද 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉහළ නංවන ලදී. මෙම මිල සංශෝධන ද ඇතුළුව, 2022 වසර තුළ දී සමස්ත මිල මට්ටම්වල සිදු වූ කැපී පෙනෙන ඉහළ යෑම් තුළින් ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කුටුම්භවලට සැලකිය යුතු පීඩාවක් ඇති වූ අතර, එමගින් දරිද්‍රතා මට්ටම් වඩාත් අයහපත් තත්ත්වයකට පත් විය.

2022 වසර තුළ දී රජය සතු මූල්‍ය අවකාශය සීමා වීම මධ්‍යයේ යටිතල පහසුකම් මත කෙරෙන ආයෝජන වියදම් දැරීම දුෂ්කර විය. ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ, ආනයනික අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී පැවති දුෂ්කරතා මගින් යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ඉදිකිරීම් කටයුතුවලට බලපෑම් ඇති විය. කොවිඩ්-19 වසංගතය පාලනය කිරීමේ දී ශ්‍රී ලංකාව ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ඇත. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම මධ්‍යයේ ඖෂධ නිෂ්පාදිත සහ අනෙකුත් වෛද්‍ය සැපයුම්වල හිඟතාව සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපෑ අතර, එම සැපයුම් හිඟය යම්තාක් දුරකට අඩු කර ගැනීමට විදේශීය ආධාර උපකාරී විය. බලශක්ති අර්බුදය සහ කොවිඩ්-19 හේතුවෙන් අධ්‍යාපන

*පද්ධතියට ඇති වූ බාධා බොහෝ දුරට පහව යෑමත් සමඟ, 2022 වසරේ දෙවන භාගයේ දී අධ්‍යාපන ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් විය. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ අධ්‍යයන කටයුතුවලට වරින්වර බාධා සිදු වීම හේතුවෙන් ඇති වූ ඉගෙනුම් අවස්ථා අහිමිවීමේ බලපෑම අඛණ්ඩව පැවති අතර, අඩු වරප්‍රසාද සහිත පසුබිමක සිටින ළමුන් අතර අධ්‍යාපනික ප්‍රතිඵලවල අසමානතා පුළුල් වීම මගින් අධ්‍යාපන පද්ධතියේ විෂමතා විසඳාලීම සඳහා වන සාමූහික ප්‍රයත්නවල අවශ්‍යතාව අවධාරණය කරනු ලබයි. ආර්ථික අවහිරතා හා ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමීත්වය හේතුවෙන් ජනගහනය තුළ වඩාත් අවදානමට ලක් වන ප්‍රතිශතය ශීඝ්‍රයෙන් ඉහළ යෑම තුළින් දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රගතිය අඩාල විය. සමස්ත ජනගහනයෙන් අවදානමට ලක්වූ ජන කොටස්වල ජීවන තත්ත්වයන් වෙත ආර්ථික අර්බුදය මගින් ඇති කළ පුළුල් ප්‍රතිවිපාක සැලකිල්ලට ගනිමින්, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් යටතේ සහන සැලසීමට පියවර කිහිපයක් ගනු ලැබූ අතර, ඒවායෙහි කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහ එවැනි යෝජනා ක්‍රම සඳහා ප්‍රතිලාභීන් ඉලක්ක කිරීම විධිමත් කිරීමට පියවර ගන්නා ලදී. මැදි කාලීනව, භෞතික ප්‍රාග්ධනය හා මානව ප්‍රාග්ධනය යන දෙඅංශයම වැඩිදියුණු කිරීම තුළින් ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමට, තිරසාර හා සැමට ප්‍රතිලාභ ලැබෙන පරිදි ආර්ථිකයේ ඇති ගැටලු විසඳීම සඳහා වන සාමූහික ප්‍රයත්නවල අවශ්‍යතාවය, නිදහසින් පසු ශ්‍රී ලංකාව මුහුණ දුන් උච්චතම ආර්ථික අර්බුදය මගින් නිර්මාණය කළ සමාජ ආර්ථික ප්‍රතිවිපාක මගින් මනාව අවධාරණය කරනු ලබයි.*




## 3.2 ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### ඛනිජ තෙල්

**2022 වසරේ දී රටේ පැවති පෙර නොවූ අන්දමේ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ, ඉන්ධන සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමේ දී රජය දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නේය.** මෙම වසර තුළ දී, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතා හිඟය සමඟ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි (ලං.ඛ.නී.සං.) මූල්‍ය තත්ත්වය අයහපත් වීම හේතුවෙන් ලං.ඛ.නී.සං.හි ඉන්ධන ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැඩි ලෙස අභියෝගයට ලක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රට තුළ සමාජ නොසන්සුන්තාවයකට තුඩුදුන් ඉන්ධන අර්බුදයක් ඇති විය. ඉන්ධන බෙදාහැරීමේ අවිධිමත්භාවයන් සහ ඉන්ධන සැපයුම පිළිබඳ අවිනිශ්චිතතා, අධික ලෙස ඉන්ධන තොග ගබඩා කිරීමට මෙන්ම ඉන්ධන ලබා ගැනීම සඳහා දිගු පෝලිම් නිර්මාණය කිරීමට හේතු විය. ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ඉන්ධන ආනයනයෙහි ඇති අත්‍යවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, ලං.ඛ.නී.සං.ට අවශ්‍ය විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම හරහා නිසි කලට ඉන්ධන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට මහ බැංකුව අඛණ්ඩව පහසුකම් සැලසුවේය. තවද, රටේ පැවති දරුණුතම ආර්ථික අර්බුදය මධ්‍යයේ, 2022 වසර තුළ දී ඛනිජ තෙල් නිෂ්පාදිත මිලදී ගැනීම මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ඉන්දියානු ආනයන අපනයන බැංකුව වෙතින් එ.ජ. ඩොලර් මිලියන 500ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගත් අතර, ඉන්දියානු රාජ්‍ය බැංකුව වෙතින් ලබාගත් එ.ජ. ඩොලර් මිලියන 1,000ක ණය පහසුකමෙන් ඩොලර් මිලියන 200ක් ද ඛනිජ තෙල් නිෂ්පාදිත මිලදී ගැනීම සඳහා භාවිත කළේය. මේ අතර, 2022 වසරේ මැයි මාසයේ දී, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා නව මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර, ඒ අනුව, පිරිවැය පිළිබිඹු කෙරෙන සුදුසු මිල සූත්‍රයක් සැකසීමට කමිටුවක් පත් කරන ලදී. 2018 වසරේ දී සම්මත කරන ලද මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීමට සහ මාසික පදනමින් දේශීය ඛනිජ තෙල් මිල ගණන් සංශෝධනය කිරීමට රජය තීරණය කිරීමත් සමඟ, 2022 වසරේ මැයි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද මිල සූත්‍රය, පසුව 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී අවලංගු කරන ලදී. මේ අතර, නාවික කටයුතු වෙනුවෙන් ඉන්ධන ලබාදෙන සමාගම් කිහිපයක් සඳහා ජයා බහලු පර්යන්තයේ පවත්වාගෙන යන තෙල් ගබඩාව හරහා අපනයනකරුවන්ට, බලශක්ති උත්පාදන සමාගම්වලට, සංචාරක සේවා සපයන්නන්ට, බලපත්‍රලාභී විදුලි සංදේශ සේවා සපයන්නන්ට සහ වෙනත් කර්මාන්තවලට නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා, එ.ජ. ඩොලර්වලින් ගෙවීම් සිදු කිරීමේ පදනම මත, තෝරාගත් ඉන්ධන නිෂ්පාදිත සැපයීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඉන්ධන මිලදී ගැනීම සඳහා එ.ජ. ඩොලර්වලින් ගෙවීම් සිදු කළ හැකි, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ලියාපදිංචි කළ අපනයන ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු ප්‍රමුඛ පාරිභෝගිකයින් ලියාපදිංචි කිරීම 2022 වසරේ ජූලි මාසය ආරම්භයේ දී, ලං.ඛ.නී.සං. විසින් ආරම්භ කරන ලද අතර, එම පාර්ශ්වයන් සඳහා සහතික කළ ඉන්ධන කෝටාවක් යටතේ ඉන්ධන නිකුත් කරන ලදී. ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර, ලං.ඛ.නී.සං. විසින් ප්‍රවාහන අංශය වෙත අඛණ්ඩව ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා 2022

**3.1 රූප සටහන**
**ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්වල කාර්යසාධනය**




3


3

වසරේ ජූලි මාසයේ අවසාන භාගයේ සිට වාහන අංක තහඩුවේ අවසාන අංකයට අනුව ලං.බ.නී.සං.ට අයත් පිරවුම්හල් හරහා ඉන්ධන නිකුත් කරන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. 2022 වසරේ අගෝස්තු මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වූ ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය යටතේ නියමිත වාහන කාණ්ඩ සඳහා සතිපතා ඉන්ධන කෝටා ලබා දුන් අතර, දැඩි අවහිරතා මධ්‍යයේ සීමිත ඉන්ධන තොග ක්‍රමානුකූලව දීපව්‍යාප්තව බෙදා හැරීම එමගින් සිදු කරන ලදී. තවද, වසර තුළ දී කර්මාන්ත, කෘෂිකාර්මික අංශය සහ ධීවර අංශය වෙත ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව සංචාරක කර්මාන්තයෙහි යථා තත්ත්වයට පත් වීමට පහසුකම් සැලසීමේ අරමුණින්, 2022 වසරේ ඔක්තෝබර් මාසය ආරම්භයේ දී සංචාරක ඉන්ධන අවසර පත්‍ර පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් එ.ජ. ඩොලර් අගයක් සහිත පෙරගෙවුම් කාඩ්පතක් භාවිතයෙන් දිවයින පුරා පිහිටි පිරවුම්හල් හරහා ඉන්ධන මිලදී ගැනීම සඳහා සංචාරකයින්ට අවස්ථාව හිමි විය. මේ අතර, ලං.බ.නී.සං. 2022 වසර අග භාගයේ දී බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සඳහා ගබඩා මොඩියුල සංකල්පය (Storage Module Concept) ක්‍රියාවට නංවන ලද අතර, එමගින් ලං.බ.නී.සං.වේ සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්හි (CPSTL) ගබඩා පර්යන්තවලින් ඉන්ධන ලබා ගන්නා අවස්ථාවේදී ගෙවීම් සිදු කෙරෙන පදනමක් මත, ප්‍රමාදයකින් තොරව නැව්වලින් ඉන්ධන ගොඩබෑමට හැකි විය. යම් සීමා පැනවීම් මධ්‍යයේ වුවද, මෙම ක්‍රමය හරහා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සඳහා පහසුකම් සැලසීමට හැකිවූ අතර, ලං.බ.නී.සං.හි මුදල් ප්‍රවාහ ඌනතාවන් බොහෝ දුරට අඩු කිරීමට එය උපකාරී විය.

**ගෝලීය ආර්ථිකය මන්දගාමී වීම පිළිබඳ අවිනිශ්චිතතා සමග වසරේ දෙවන භාගයේ දී මිල පීඩන පහළ යෑමේ නැඹුරුවක් දක්නට ලැබුණ ද, මූලික වශයෙන් නැගෙනහිර යුරෝපයේ පවතින භූ දේශපාලනික අර්බුද සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය තෙල් සැපයුම් තත්ත්වය දැඩි වීම හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල ගණන් 2022 වසරේ දී ඉහළ මට්ටමක පැවතුණි.** ප්‍රධාන වශයෙන් ලොව ප්‍රමුඛතම ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනකරුවෙකු වන රුසියාව වෙත බටහිර රටවල් විසින් පනවන ලද සම්බාධක හේතුවෙන්, 2008 වසරේ ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2022 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් (බ්‍රෙන්ට්) බැරලයක දෛනික මිල ගණන් එ.ජ. ඩොලර් 140ක් දක්වා කෙටි කාලයක් තුළ ඉහළ යෑමත් සමග, 2022 වසරේ පළමු භාගය තුළ බොරතෙල් මිල ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ලෝකයේ ප්‍රධාන මහ බැංකුවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ පියවර හා සමගාමීව ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමී වීම තුළින් ගෝලීය වශයෙන් බලශක්තිය සඳහා වන ඉල්ලුම පහළ යනු ඇතැයි අපේක්ෂා කිරීම, චීනය විසින් කොවිඩ්-19 ආශ්‍රිත සීමා අඛණ්ඩව පවත්වා ගෙන යෑම සහ එක්සත් ජනපදයේ උපායමාර්ගික සංචිතවලින් බොරතෙල් සැලකිය යුතු ලෙස මුදා හැරීම හේතුවෙන් 2022 වසරේ දෙවන භාගය ආරම්භයේ සිට බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC) සහ එහි පාර්ශ්වකරුවන් විසින් නිෂ්පාදන කප්පාදුවක් නිවේදනය කිරීම, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී යුරෝපීය සංගමය රුසියානු බොරතෙල් ආනයනය තහනම් කිරීමත් සමග ජී7 කණ්ඩායමේ (G7) රටවල් විසින් රුසියානු බොරතෙල් සඳහා මිල සීමාවක් පැනවීම, සහ චීනයේ ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමේ ලක්ෂණ පෙන්නුම් කිරීමත් හේතුවෙන් 2022 වසරේ දෙවන භාගයේ අවසාන කාලයේදී කෙටි කාලීනව මිල පීඩනයන්ගේ ඉහළ යෑම් දක්නට ලැබුණි. බොරතෙල් (බ්‍රෙන්ට්) බැරලයක මිලෙහි සාමාන්‍යය පෙර වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 70.80ක සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් 99.06ක් දක්වා සියයට 39.9කින් ඉහළ ගියේය. වෙස්ට් ටෙක්සාස් ඉන්ටමීඩියට් (ඩබ්.ටී.අයි) බොරතෙල් මිල ගණන් ද ඉහළ යන ප්‍රවණතාවක් වාර්තා කළ අතර, 2021 වසරේ දී එ.ජ. ඩොලර් 67.94ක් ලෙස පැවති බැරලයක මිලට සාපේක්ෂව 2022 වසරේ දී බැරලයක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 94.41ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු කාර්තුවේ දී ගෝලීය බොරතෙල් මිල ගණන් සුළු වශයෙන් පහළ යෑමක් පෙන්නුම් කළේය. පෙට්‍රල් ඔක්ටේන් 92, පෙට්‍රල් ඔක්ටේන් 95, සුදු ඩීසල්, සුපිරි ඩීසල් සහ භූමිතෙල් ඇතුළු පිරිපහදු කළ ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන්හි සාමාන්‍යය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 40-75 දක්වා පරාසය තුළ ඉහළ ගියේය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවට අනුව, ලං.බ.නී.සං. විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2021 වසර තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් 68.86ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් 100.11ක් දක්වා සියයට 45.4කින් ඉහළ ගියේය.

**ලං.බ.නී.සං.හි මූල්‍ය අලාභවලට විසඳුමක් ලෙස මෙන්ම, ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ගයේ කොටසක් ලෙස, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ**

**3.2 රූප සටහන**
**ගෝලීය බොරතෙල් මිල ගණන්වල ප්‍රවණතා**





මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

**සහයෝගීතාව ඇතිව ලං.ඛ.නී.සං. විසින් 2022 වසරේ මාර්තු මාසයේ සිට ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් අවස්ථා කිහිපයකදී සංශෝධනය කරන ලදී.** ඒ අනුව, 2022 වසරේ මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි හා නොවැම්බර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන් ඉහළ යෑම හා අනුකූලව ලං.ඛ.නී.සං. විසින් අලෙවි කරන ලද ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ඉහළ නංවන ලදී. එසේම, ගෝලීය වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් වල පහළ යෑම් හා අනුව යමින් 2022 වසරේ ජූලි, අගෝස්තු, ඔක්තෝබර් හා දෙසැම්බර් මාසවල සහ 2023 වසරේ ජනවාරි හා මාර්තු මාසවලදී ඛනිජ තෙල් මිල ගණන් අවස්ථා කිහිපයකදී පහළ දමන ලදී. තවද, සැලකිය යුතු මට්ටමේ සහනදායි මිලකට භූමිතෙල් අලෙවි කිරීමෙන් ලං.ඛ.නී.සං.ට සිදුව ඇති විශාල අලාභය අවම කර ගැනීම සඳහා 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට ලං.ඛ.නී.සං. විසින් භූමිතෙල් සිල්ලර මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ නංවන ලදී. ලං.ඛ.නී.සං.හි මෙම මිල සංශෝධන හා සමගාමීව ලංකා අයිඕසී පොදු සීමිත සමාගම (LIOC) විසින් ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ලං.ඛ.නී.සං.වේ මිල ගණන් හා සමාන වන පරිදි අවස්ථා එකොළහක දී ඉහළ නංවන ලද අතර, අවස්ථා අටක දී මිල ගණන් පහළ දැමීය. මේ අතර, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී රජයේ ණය තොගයට එකතු කරන ලද ලං.ඛ.නී.සං.හි විදේශීය ණය තොගයට අදාළ ණය සේවාකරණ වගකීම් සපුරාලීම සඳහා 2023 වසරේ ජනවාරි මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, පිරිපහදු කළ ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය මත රජය ලීටරයකට රුපියල් 25.00ක නිෂ්පාදන බද්දක් පැනවීය. ඒ අනුව, 2023 වසරේ ජනවාරි මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් ඔක්ටේන් 92 සහ පෙට්‍රල් ඔක්ටේන් 95 ලීටරයක් සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද රුපියල් 52.00ක් දක්වා ඉහළ නංවන ලද අතර, සුපිරි ඩීසල් සහ සුදු ඩීසල් ලීටරයක් සඳහා වන නිෂ්පාදන බද්ද, පිළිවෙළින්, රුපියල් 38.00ක් සහ රුපියල් 31.00ක් දක්වා වැඩි කිරීමත් සමග ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ඉහළ ගියේය.

**විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ ඉන්ධන ආනයන අඩුවීම, දේශීය ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් ඉහළ යෑම, ඇතැම් සීමාවන්ට යටත්ව ඉන්ධන**


3

**3.3 රූප සටහන**
**දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**




මූලය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**3.4 රූප සටහන**
**දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන**
**ලංකා අයිඕසී පොදු සීමිත සමාගම**





මූලය: ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

3

**නිකුත් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම යනාදියෙහි ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2022 වසර තුළ දී දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදිතවල සමස්ත විකුණුම් පරිමාව පහළ යෑමක් වාර්තා කළේය.** දේශීය වෙළඳපොළෙහි ඉන්ධන සැපයුම සහ ඉල්ලුම සුමට කිරීමේ අරමුණින් 2022 වසරේ අගෝස්තු මාසයේ සිට ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය මත පදනම්ව, ඉන්ධන සැපයීම ක්‍රියාත්මක කරමින් ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ග හඳුන්වා දීමට රජය පියවර ගත්තේය. 2022 වසරේ දී, ලං.ඛ.නී.සං.හි විකුණුම් පරිමාව පහත වැටීමත් සමඟ සමස්ත ඛනිජ තෙල් අලෙවිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.8ක පහළ යෑමක් වාර්තා කළ අතර, ලං.ඛ.නී.සං.හි ඉන්ධන සැපයුම අවහිර වීම මධ්‍යයේ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ලංකා අයිඕසී පොදු සීමිත සමාගමෙහි අලෙවි පරිමාව කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ලං.ඛ.නී.සං.හි සමස්ත විකුණුම්වලින් සියයට 73ක් වූ ප්‍රවාහන අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 17.1ක පහළ යෑමක් වාර්තා කළ අතර, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 වසරේ දී අලෙවිය පහළ යෑමේ පදනම් බලපෑම පිළිබිඹු කරමින්, ගුවන් සේවා අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.8ක වර්ධනයක් වාර්තා කළේය. විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ඉන්ධන සැපයුම සීමිත වීම මධ්‍යයේ අඛණ්ඩව සිදු කෙරුණු විදුලි කප්පාදුව සහ ජලාශවල පැවති හිතකර ජල මට්ටම් සමඟ වැඩි වශයෙන් ජලවිදුලි උත්පාදනය මත පදනම් වීමේ ප්‍රතිඵලයක් ලෙස සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ විදුලි උත්පාදන අංශයෙන් ඉන්ධන සඳහා වූ සමස්ත ඉල්ලුම පහත

**3.5 රූප සටහන**
**ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය**




මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

**3.1 සංඛ්‍යා සටහන**
**ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | | 2021 (අ) | 2022 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|---|
| | | | | 2021(අ) | 2022(ආ) |
| ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000) | | | | | |
| බොරතෙල් | | 1,182 | 649 | -29.1 | -45.1 |
| පිරිපහදු නිෂ්පාදිත | | 4,553 | 3,927 | 13.0 | -13.8 |
| ගල් අඟුරු | | 2,206 | 1,707 | -15.1 | -22.6 |
| එල්.පී. ගෑස් | | 422 | 290 | -3.3 | -31.2 |
| දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000) | | 17 | 6 | -34.1 | -65.8 |
| ආනයන වටිනාකම (මි.ර.ගැ.) | | | | | |
| බොරතෙල් | (රු.මිලියන) | 123,865 | 157,408 | 15.0 | 27.1 |
| | (එ.ජ.ඩො. මිලියන) | 625 | 484 | 7.2 | -22.6 |
| පිරිපහදු නිෂ්පාදිත | (රු. මිලියන) | 564,681 | 1,294,311 | 75.5 | 129.2 |
| | (එ.ජ.ඩො. මිලියන) | 2,840 | 4,048 | 63.0 | 42.5 |
| ගල් අඟුරු | (රු.මිලියන) | 55,118 | 99,949 | 37.1 | 81.3 |
| | (එ.ජ.ඩො. මිලියන) | 278 | 365 | 27.8 | 31.3 |
| එල්. පී. ගෑස් | (රු.මිලියන) | 64,436 | 75,882 | 47.1 | 17.8 |
| | (එ.ජ.ඩො. මිලියන) | 324 | 234 | 37.2 | -27.8 |
| බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.) | | | | | |
| | (රු./බැරල්) | 13,645 | 32,573 | 62.2 | 138.7 |
| | (එ.ජ.ඩො./බැරල්) | 68.86 | 100.11 | 51.1 | 45.4 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය | | | | | |
| | (මෙ.ටො. '000) | 853 | 641 | 7.0 | -24.9 |
| ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම | | | | | |
| | (රු.මිලියන) | 100,975 | 177,194 | 46.7 | 75.5 |
| | (එ.ජ.ඩො. මිලියන) | 506 | 568 | 35.6 | 12.2 |
| දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000) | | 4,447 | 3,833 | -3.3 | -13.8 |
| ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (ඇ) | | 1,238 | 1,119 | 8.7 | -9.6 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | | 116 | 69 | -3.5 | -40.7 |
| සුදු ඩීසල් (ඈ) | | 1,875 | 1,693 | 7.1 | -9.7 |
| සුපිරි ඩීසල් | | 75 | 78 | 8.2 | 5.0 |
| භූමිතෙල් | | 185 | 98 | 5.6 | -46.9 |
| දැවිතෙල් | | 720 | 496 | -25.8 | -31.1 |
| ගුවන්යානා ඉන්ධන | | 224 | 246 | 18.6 | 9.8 |
| නැප්තා | | 11 | 32 | -93.5 | 203.6 |
| දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000) | | 457 | 294 | -3.3 | -35.6 |
| දේශීය මිල (වසර අවසානයේ දී) (රු./ලීටර) | | | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | | 177.00 | 370.00 | 29.2 | 109.0 |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | | 207.00 | 510.00 | 28.6 | 146.4 |
| සුදු ඩීසල් | | 121.00 | 420.00 | 16.3 | 247.1 |
| සුපිරි ඩීසල් | | 159.00 | 510.00 | 20.5 | 220.8 |
| භූමිතෙල් | | 87.00 | 365.00 | 24.3 | 319.5 |
| දැවිතෙල් | | | | | |
| තත්පර 800 | | 110.00 | 320.00 | 57.1 | 190.9 |
| තත්පර 1,500 | | 110.00 | 320.00 | 57.1 | 190.9 |
| එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්) | | | | | |
| ලිට්‍රෝ ගෑස් | | 214.00 | 368.80 | 79.2 | 72.3 |
| ලාෆ්ස් ගෑස් | | 227.20 | 424.00 | 90.2 | 86.6 |
| ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් (එ.ජ.ඩො./බැරල්) | | | | | |
| බ්‍රෙන්ට් | | 70.80 | 99.06 | 63.3 | 39.9 |
| ඩබ්.ටී.අයි. | | 67.94 | 94.41 | 70.8 | 39.0 |
| ඛනිජ තෙල් සහ අනෙකුත් ද්‍රව ඉන්ධන | | | | | |
| ලෝක සැපයුම (දිනකට බැරල් මිලියන) | | 95.7 | 99.9 | 1.9 | 4.3 |
| ලෝක ඉල්ලුම (දිනකට බැරල් මිලියන) | | 97.1 | 99.4 | 5.6 | 2.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ඈ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම
ලංකා මැරින් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය
එ.ජ. බලශක්ති තොරතුරු පරිපාලනය

වැටුණි. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන අලෙවිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.8ක පහළ යෑමක් වාර්තා කළේය.

**විදේශ විනිමය හිඟය සමඟ විධිමත් ලෙස බොරතෙල් ආනයනය නොකිරීම නිසා සපුගස්කන්ද පිරිපහදුව නිරන්තරයෙන් වසා දැමීම හේතුවෙන්, 2022 වසරේ දී සමස්ත ඛනිජ තෙල් පිරිපහදු නිෂ්පාදනය සියයට 55.4ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය.** 2022 වසර තුළ, පිරිපහදු කටයුතු සඳහා බොරතෙල් නොමැතිවීම හේතුවෙන් සපුගස්කන්ද පිරිපහදුව දින 225කට ආසන්න කාලයක් වසා දමා තිබුණි. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ සමස්ත බොරතෙල් නිෂ්පාදනය සියයට 58.4කින් පහත වැටුණු අතර, ඩීසල්, පෙට්‍රල්, දැවි තෙල් සහ නැප්තා වැනි ප්‍රධාන නිෂ්පාදිතවල පිරිපහදු නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 65.4කින්, සියයට 68.8කින්, සියයට 45.7කින් සහ සියයට 71.2කින් පහත වැටුණි.

**2022 වසරේ දෙවන භාගයේ දී වැඩි වශයෙන් ක්‍රියාත්මක කරන ලද පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සංශෝධන මධ්‍යයේ වුවද, විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් සිදු වූ මූල්‍යමය අලාභ පදනම් කර ගනිමින් ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්යසාධනය 2022 වසරේ දී තවදුරටත් අයහපත් විය.** ගෝලීය බොරතෙල් මිල ගණන්වල සැලකිය යුතු ඉහළ යෑම මධ්‍යයේ සිදුකරන ලද දේශීය මිල සංශෝධනවල බලපෑම කිසියම් දුරකට පිළිබිඹු කරමින්, විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, පෙර වසරේ රුපියල් බිලියන 41.3ක් වූ ලං.ඛ.නී.සං.වේ මෙහෙයුම් අලාභය, 2022 වසරේ දී රුපියල් බිලියන 6.2කට සීමා විය. 2022 වසරේ මාර්තු සිට මැයි දක්වා කාලසීමාව තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල නාමික වශයෙන් තියුණු ලෙස අවප්‍රමාණය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ලං.ඛ.නී.සං.වේ විනිමය අනුපාත විචල්‍යතා අලාභය රුපියල් බිලියන 527.0ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ලං.ඛ.නී.සං.හි මූල්‍යමය ක්‍රියාකාරිත්වයට අහිතකර බලපෑමක් සිදු වී ඇත. ඒ අනුව, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 81.8ක අලාභයට (බදු පෙර) සාපේක්ෂව 2022 වසර තුළ දී ලං.ඛ.නී.සං.වේ සමස්ත අලාභය රුපියල් බිලියන 615.1ක් විය. කෙසේ වෙතත්, පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සංශෝධන සහ විනිමය අනුපාතික විචල්‍යතාවන් ක්‍රමානුකූලව ස්ථාවර වීම හේතුවෙන් ලං.ඛ.නී.සං. 2022 වසරේ ජූලි මාසයේ සිට මාසික පදනම මත ලාභයක් (බදු පෙර) වාර්තා කළේය. මේ අතර, ලං.ඛ.නී.සං.හි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස, රජය විසින් සහතික කරන ලද එ.ජ. ඩොලර් බිලියන 2.5ක් වූ ලං.ඛ.නී.සං.හි විදේශ විනිමය ණය තොගය රාජ්‍ය ණය වගකීම් යටතට පැවරීමට රජය තීරණය කිරීමත් සමඟ, බැංකු ක්ෂේත්‍රය වෙත වූ ලං.ඛ.නී.සං.හි විදේශ මුදලින් නාමනය කරන ලද නොපියවූ ණය ප්‍රමාණය සහ ආනයන බිල්පත් 2021 වසරේ අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.4 සිට 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 0.2ක් දක්වා අඩු විය. රාජ්‍ය ආයතනවලින් ලං.ඛ.නී.සං.ට අයවිය යුතු සමස්ත හිඟ ණය මුදල, 2021 වසර අවසානයේ සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 220.3ක් දක්වා රුපියල් බිලියන 59.3කින් ඉහළ ගියේය. 2022 වසර අවසානයේ දී, ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) හා ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් අය විය යුතු හිඟ මුදල, ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු සමස්ත හිඟ මුදලින්, 2021 වසර අවසානයේ දී, වාර්තා වූ, පිළිවෙළින්, සියයට 38.6 සහ සියයට 51.5ට සාපේක්ෂව 2022 වසර අවසානයේ දී පිළිවෙළින්, සියයට 49.3ක් සහ සියයට 31.1ක් විය. විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීමට සමගාමීව, විනිමය අනුපාතික බලපෑම හා ගැළපීම හේතුවෙන් 2022 වසර තුළ ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු හිඟ මුදලෙහි රුපියල් අගය කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

**ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කරගත් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් කිහිපයක් සහ නීති බලගැන්වීමේ ක්‍රියාමාර්ග 2022 වසරේ දී ක්‍රියාත්මක විය.** ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරමින් ශ්‍රී ලංකාව මුහුණ දුන් පෙර නොවූ අන්දමේ ඉන්ධන අර්බුදය මධ්‍යයේ රට තුළ ඉන්ධන සැපයීම විධිමත් කිරීම සඳහා බොහෝ පාලන රීති හා සීමා ඉවත්කිරීමේ උපාය මාර්ග ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය, බෙදාහැරීම සහ විකිණීම සඳහා ශක්‍යතාවෙන් යුතු ව්‍යාපාර ආකෘතියක් ස්ථාපිත කිරීමට, ඛනිජ තෙල් නිෂ්පාදනය කරන රටවල ස්ථාපිත සමාගම් ඇතුළුව, නව ඉන්ධන සැපයුම්කරුවන්ගෙන් කැමැත්ත පළ කිරීමේ ලිපි කැඳවන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා සහාය සලසමින් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ 26 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022 අංක 27 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත බලාත්මක කරන ලදී. 2022 වසර තුළ දී, මූල්‍යමය අවහිරතා

3

3

හේතුවෙන් ලං.බ.නී.සං.හි යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්වලට බාධා ඇති වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එහි සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ඉදිකෙරෙන නව ගුවන් යානා නවත්වන E කොටස සඳහා හයිඩ්‍රන්ට් ඉන්ධන සැපයුම් පද්ධතිය ස්ථාපනය කිරීම, ලං.බ.නී.සං.හි ඉන්ධන ගබඩා සංකීර්ණයෙහි පහසුකම් වැඩිදියුණු කිරීම සහ දැනට පවතින A, B සහ C යන ගුවන් යානා නවත්වන කොටස්වල හයිඩ්‍රන්ට් ඉන්ධන සැපයුම් පද්ධතිය වෙනස් කිරීම සහ නැවත සකස් කිරීම 2022 වසර තුළ දී ක්‍රියාත්මක විය. මේ අතර, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා වන ගිවිසුම 2022 වසරේ ජනවාරි මාසයේ 06 වන දින ලං.බ.නී.සං., ලංකා අයිඕසී පොදු සීමිත සමාගම සහ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගමෙහි (TPTL) සහභාගීත්වයෙන් යුතුව අත්සන් කරන ලදී. ඒ අනුව, 2022 වසරේ දී, ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම විසින් එහි විෂය පථය යටතේ ඇති තෙල් ටැංකි 61 සංවර්ධනය කිරීමට අදාළව ක්‍රියාමාර්ග රාශියක් ගන්නා ලදී. මෙහිදී, ගබඩා ටැංකි 10කට අදාළව තත්ත්ව පරීක්ෂණයක් සහ සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් 2022 වසරේ දී සිදු කරන ලදී. මෙම වසර තුළ දී, ත්‍රිකුණාමල තෙල් ගබඩා ටැංකි සංකීර්ණයේ ලං.බ.නී.සං. සතු ටැංකි 24 සංවර්ධනය කිරීම සඳහා ලං.බ.නී.සං. විසින් සංවර්ධන සැලැස්මක් සහ මූලික අදියරේ ඉඩම් එළිපෙහෙළි කිරීම හා ඉඩම් මැනීමේ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කරන ලද අතර, ඊට අදාළව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම වසර තුළ දී සිදු විය. මේ අතර, අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදන කටයුතු සඳහා වන රජයේ නියාමන ආයතනය ලෙස, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) ශ්‍රී ලංකාවේ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය දියුණු කිරීමට අඛණ්ඩ ප්‍රයත්නයක් දැරීය. 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත මගින් දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ මෙහෙයුම් සඳහා වූ සිය කාර්යභාරය ශක්තිමත් කිරීමට කටයුතු කළේය. තවද, ජාත්‍යන්තර තෙල් නිධි සීමා නිර්ණය කිරීම් සහ වර්තමාන ප්‍රවණතා සමාලෝචනය කිරීමෙන් අනතුරුව, මන්නාරම, කාවේරි සහ ලංකා යන විශාල ද්‍රෝණි තුනක් ආවරණය වන ගවේෂණ බිම තුළ පවතින කුඩා ගවේෂණ බිම් 900කින් පමණ සමන්විත නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් සිතියමක් සකස් කර 2022 වසරේ ජූලි මාසයේ දී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. අවස්ථා ගණනක දී සයිස්මික් ධ්වනි තරංග දත්ත විශ්ලේෂණය කර ඇති අතර, ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණය සඳහා පවතින ශක්‍යතාව පිළිබඳව විශේෂඥයින් විසින් රජයට මීට දශකයකට වැඩි කාලයක සිට පෙන්වා දී ඇත. කෙසේ වෙතත්, තවමත් එම ක්‍රියාවලියම නැවත නැවතත් සිදුවන අතර බලයට පත්වන රජයන් විසින් ඊට අදාළ ප්‍රවර්ධන පිරිවැය දරා ඇත. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණයට අදාළව, සත්‍ය ලෙස ගෑස් හෝ ඛනිජ තෙල් හයිඩ්‍රෝකාබන් නිධිවලින් නිස්සාරණය කර ගැනීම තවමත් සිදුව නැත. එම නිසා, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් ඵලදායී තෙල් ගවේෂකයකු සමඟ කටයුතු කරමින් ගෑස් හෝ ඛනිජ තෙල් ගවේෂණය නුදුරු අනාගතයේදීම ආරම්භ කිරීම සඳහා ඉලක්ක කරගත යුතුය.

**ප්‍රධාන වශයෙන් 2022 වසරේ මුල් භාගය තුළ දී, විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් රටෙහි එල්.පී. ගෑස් (ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව) සැපයුම වෙත දැඩි බාධා එල්ල වූ අතර, එය නාගරික සහ අර්ධ නාගරික ප්‍රජාවට විශාල වශයෙන් බලපෑම් ඇති කළේය.** කෙසේ වෙතත්, ලෝක බැංකුව වෙතින් මූල්‍ය ආධාර ලැබීම සහ බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව ගනු ලැබූ ක්‍රියාමාර්ග මගින් එල්.පී. ගෑස් ආනයනය සඳහා පහසුකම් සැලසුණු අතර, එමගින් දේශීය වෙළඳපොළ තුළ එල්.පී. ගෑස් සැපයුම සාමාන්‍ය තත්ත්වයට පත් විය. දේශීය වශයෙන් එල්.පී. ගෑස් මිල ගණන් තීරණය කිරීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීමට 2022 වසරේ අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලද අතර, ඒ අනුව, 2022 වසරේ අගෝස්තු මාසයේ සිට මෙම මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් 2022 වසරේ අප්‍රේල්, ජූලි, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී සහ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී එල්.පී. ගෑස්වල දේශීය මිල ගණන් ඉහළ නංවන ලද අතර, ගෝලීය වශයෙන් මිල ගණන් පහළ යෑමත් සමඟ 2022 වසරේ අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී මෙන්ම, 2023 වසරේ ජනවාරි මාසයේ දී එල්.පී. ගෑස් මිල ගණන් පහත දැමීමට කටයුතු කරන ලදී. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම අනුගමනය කරමින්, ලාෆ්ස් ගෑස් පොදු සීමිත සමාගම ද 2022 වසරේ මාර්තු හා ජූනි සහ 2023 වසරේ පෙබරවාරි යන මාසවලදී අවස්ථා තුනක දී දේශීය මිල ගණන් ඉහළ නැංවූ අතර, 2022 වසරේ අගෝස්තු හා ඔක්තෝබර් සහ 2023 වසරේ ජනවාරි යන මාසවලදී තෙවරක් මිල ගණන් පහළ දැමීමට කටයුතු කළේය.


තවද, 2023 වසරේ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, එල්.පී. ගෑස් ආනයනය සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ආනයන පිරිවැයෙන් සියයට 7.5ක සිට සියයට 2.5ක් දක්වා පහත දමන ලදී.

**2022 වසරේ මැයි මාසයේ සිට දක්නට ලැබුණු මිල පහළ යෑම් මධ්‍යයේ වුවද, ගෝලීය බලශක්ති මිල ගණන්වල සමස්ත ප්‍රවණතාවයට සමගාමීව ගෝලීය වශයෙන් එල්.පී. ගෑස් මිල ගණන්හි සාමාන්‍යය 2022 වසර තුළ ඉහළ මට්ටමක පැවතුණි.** ගෝලීය වෙළඳපොළෙහි, එල්.පී. ගෑස් මිල ගණන්වල සාමාන්‍යය (ප්‍රොපේන් හා බියුටේන් අනුපාතය 30:70 මත පදනම්ව), ගෝලීය බලශක්ති වෙළඳපොළෙහි සැපයුම් අවදානම් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී, මෙට්‍රික් ටොන් එකකට එ.ජ ඩොලර් 954ක් දක්වා ඉහළ ගිය අතර, ගෝලීය පරිභෝජන ඉල්ලුම පහළ යෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මෙට්‍රික් ටොන් එකක මිල එ.ජ. ඩොලර් 650ක් දක්වා සියයට 31.9කින් පමණ පහත වැටුණි. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු කාර්තුව අවසානයේ දී ගෝලීය වශයෙන් එල්.පී. ගෑස් මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 700ට වඩා ඉහළ අගයක පැවතුණි.

### විදුලිබලය

**ප්‍රධාන වශයෙන් විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ, බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන හා ගල් අඟුරු හිඟ වීම සහ ජලාශවල ජල මට්ටම් පහත වැටීම හේතුවෙන් 2022 වසරේ දී විදුලිය සැපයුමට බාධා ඇති විය.** මේ හේතුවෙන් විදුලිබල ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු අන්දමේ ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ග අවශ්‍ය වූ අතර, ආර්ථික ක්‍රියාකාරකම් මත දැඩි බලපෑම් ඇති කරමින්, විශේෂයෙන් ම මාර්තු සහ අප්‍රේල් මාසවල, දිගු කාලයක් පුරා විදුලිය විසන්ධි කිරීම සිදු විය. ඒ අනුව, 2022 වසරේ මුල් කාලයේ දී ජලාශවල ජල මට්ටම් පහළ යෑම මධ්‍යයේ ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස, ලං.වි.ම. විසින් 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට දෛනිකව විදුලිය කප්පාදු කිරීම සිදු කරන ලදී. වියළි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ජලාශවල ජල මට්ටම් ශීඝ්‍ර ලෙස පහත වැටීම, ලං.වි.ම. මුහුණ දුන් මුදල් ප්‍රවාහ සපයා ගැනීමේ දුෂ්කරතා මධ්‍යයේ විදුලිය නිෂ්පාදනය සඳහා ඉන්ධන නොමැති වීම සහ රට තුළ පැවති විදේශ විනිමය පීඩනය හේතුවෙන් ඉන්ධන මිලදී ගැනීමේදී සිදු වූ ප්‍රමාදය පිළිබිඹු කරමින්, 2022 වසරේ අප්‍රේල් මාසය ආරම්භ වන විට විදුලිය සැපයීම විසන්ධි කිරීමේ කාලය දිනකට පැය 10ක් ඉක්මවා දීර්ඝ විය. 2022 වසරේ මැයි සිට සැප්තැම්බර් කාල සීමාව තුළ ලැබුණු ධාරානිපාත මෝසම් වර්ෂාව සමඟ විදුලි සැපයුම විශාල වශයෙන් ජල විදුලි උත්පාදනය මත පදනම් වූ අතර, එමගින් තාප ප්‍රභව මත වැඩි වශයෙන් රඳා පැවතීම සීමා විය. ඒ අනුව, ඉන්ධන හිඟය හේතුවෙන් තාප බලාගාර කිහිපයක් නිතර වසා දැමීම සහ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය තුළ කලින් සැලසුම් කළ නඩත්තු හා අළුත්වැඩියා කිරීම් සඳහා එම බලාගාරයේ ඇතැම් ඒකක වරින් වර වසා දැමීම සිදු කළද, යහපත් කාලගුණික තත්ත්වයන් සමග ජලාශ මට්ටම් හිතකර වීම හේතුවෙන් 2022 වසරේ මැයි මාසයේ සිට විදුලිබල සැපයුම විසන්ධි කිරීමේ කාලය ක්‍රමයෙන්, දිනකට පැයත් පැය තුනත් අතර කාලයකට පමණක් සීමා කරන ලදී. හිතකර ජලාශ මට්ටම් තිබියදීත්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට 2023 වසරේ අප්‍රේල් මාසය දක්වා ගල් අඟුරු ආනයනය කිරීමේ කාල සීමාව තුළ ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවහිරතා හේතුවෙන් 2022 වසරේ අවසාන කාලය තුළ විදුලිය සැපයුමට අදාළව අවදානම් ඉහළ ගියේය. විදේශ විනිමය හිඟය, ලං.වි.ම.හි මුදල් ප්‍රවාහ ගැටලු සහ ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියේ ගැටලු හේතුවෙන් ගල් අඟුරු නැව්ගත කිරීම් ප්‍රමාද විය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ගල් අඟුරු ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය ලබා දීමට නිදන් අරමුදලක් (sinking fund) ස්ථාපිත කිරීම හරහා ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා මහ බැංකුව විසින් පහසුකම් සපයන ලද අතර, විදුලිය සැපයීමට අදාළ අවදානම් අවම කිරීම සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය විධිමත් කිරීමට බලධාරීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. කෙසේ වෙතත්, දේශීය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාවය ක්‍රමානුකූලව වර්ධනය

**3.6 රූප සටහන**
**විදුලිබල උත්පාදන සංයුතිය**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

වීමත් සමඟ මහ බැංකුව විසින් ගල් අඟුරු මිලදී ගැනීම සඳහා වන අරමුදල වෙනුවෙන් විදේශ විනිමය මිලදී ගැනීම 2023 වසරේ මුල් කාලයේ දී නවතා දැමීමට කටයුතු කරන ලදී.

**තාප විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය ගල් අඟුරු සහ ඉන්ධන ආනයනය වෙත බාධා සිදු වීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ දී සමස්ත විදුලිබල උත්පාදනය සියයට 4.6කින් පහළ යෑමක් වාර්තා කළේය.** ඒ අනුව, සමස්ත විදුලිබල උත්පාදනය, 2021 වසරේ දී වාර්තා වූ ගි.වො.පැ. 16,716ට සාපේක්ෂව 2022 වසරේ දී ගි.වො.පැ. 15,942ක් දක්වා අඩු විය. 2021 වසරට සාපේක්ෂව මෙම වසර තුළ සමස්ත ජල විදුලිබල උත්පාදනය, ද්‍රව ඉන්ධන පදනම් කරගත් විදුලිබල උත්පාදනය සහ ගල් අඟුරු භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදනය, පිළිවෙළින්, ගි.වො.පැ. 5,364ක්, ගි.වො.පැ. 2,467ක් සහ ගි.වො.පැ. 5,174ක් දක්වා, පිළිවෙළින්, සියයට 4.9කින්, සියයට 6.3කින් සහ සියයට 6.3කින් පහළ ගියේය. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ගි.වො.පැ. 2,737ක් දක්වා සියයට 0.5ක සුළු වර්ධනයක් වාර්තා කළේය. වසර තුළ දී, මිල අධික තාප ප්‍රභවයන්ට සාපේක්ෂව අඩු වියදම් පුනර්ජනනීය ප්‍රභව මත වැඩි වශයෙන් පදනම් වීම පිළිබිඹු කරමින්, සමස්ත විදුලිබල උත්පාදන සංයුතිය සඳහා ජල විදුලිය, ද්‍රව ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදන දායකත්වය, පිළිවෙළින්, සියයට 33.6ක්, සියයට 15.5ක්, සියයට 32.5ක් සහ සියයට 18.4ක් විය. මීට අමතරව, සමස්ත විදුලිබල උත්පාදනයට ලං.වි.ම.හි දායකත්වය සියයට 76.7ක් වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිලදී ගන්නා ලදී. මේ අතර, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේදී සිදු වන සමස්ත විදුලිබල හානිය මුළු විදුලිබල උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී වාර්තා වූ සියයට 9.0ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 8.9ක් විය. වියළි කාලගුණික තත්ත්වය ආරම්භ වීමත් සමඟ ජලාශවල ජල මට්ටම ශීඝ්‍රයෙන් අඩු වීම හේතුවෙන් 2023 වසරේ මුල් කාලයේ සිට විදුලිබල උත්පාදනය ප්‍රධාන වශයෙන් තාප ප්‍රභව මත පදනම් විය.

**විදුලිය කප්පාදු කිරීම සහ විදුලිය පරිභෝජනය කරන ප්‍රධාන කාණ්ඩවල ඉල්ලුම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී සමස්ත විදුලිබල අලෙවිය, ගි.වො.පැ. 14,520ක් දක්වා සියයට 4.6කින් පහළ ගියේය.** කොවිඩ්-19 වසංගතයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2022 වසරේ මුල් කාලයේ දී විදුලිබල අලෙවියෙහි වර්ධනයක් පැවතියද, ඉන් අනතුරුව විදුලිය කප්පාදු කිරීම හේතුවෙන් විදුලි පරිභෝජන පරිමාව සැලකිය යුතු ලෙස අඩු විය. විදුලිබල සැපයුම සීමා කිරීමේ බලපෑම පිළිබිඹු කරමින්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ගෘහස්ථ, කර්මාන්ත, සහ රාජ්‍ය යන පරිභෝජන කාණ්ඩ වෙත සිදු කළ විදුලිබල අලෙවිය, පිළිවෙළින්, සියයට 3.7කින්, සියයට 10.1කින් සහ සියයට 8.3කින් පහළ ගියේය. මූලික වශයෙන් 2021 වසරේ දී පැවති පහළ සංඛ්‍යානමය

### 3.2 සංඛ්‍යා සටහන
### විදුලිබල අංශයේ ක්‍රියාකාරිත්වය


| ශීර්ෂය | 2021 (අ) | 2022 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021(අ) | 2022(ආ) |
| ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්) | 4,186 | 4,084 | -1.9 | -2.4 |
| ජල විදුලිබලය (ඇ) | 1,383 | 1,413 | - | 2.2 |
| ද්‍රව ඉන්ධන (ඈ) | 1,087 | 924 | -14.3 | -15.0 |
| ගල් අඟුරු | 900 | 900 | - | - |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ) | 817 | 847 | 14.3 | 3.7 |
| ජනනය කළ ඒකක (ගිගාවොට් පැය) | 16,716 | 15,942 | 6.4 | -4.6 |
| ජල විදුලිබලය (ඇ) | 5,640 | 5,364 | 44.2 | -4.9 |
| ද්‍රව ඉන්ධන (ඈ) | 2,634 | 2,467 | -37.0 | -6.3 |
| ගල් අඟුරු | 5,519 | 5,174 | -4.1 | -6.3 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ) | 2,922 | 2,937 | 56.6 | 0.5 |
| මුළු අලෙවිය (ලං.වි.ම.) (ගිගාවොට් පැය) | 15,214 | 14,520 | 6.5 | -4.6 |
| ගෘහස්ථ සහ ආගමික | 5,320 | 5,124 | 2.9 | -3.7 |
| කර්මාන්ත | 4,822 | 4,334 | 15.8 | -10.1 |
| පොදු සේවා, හෝටල් සහ රාජ්‍ය අංශය | 3,342 | 3,415 | 3.2 | 2.2 |
| වීදි ආලෝක කිරීම | 97 | 97 | -9.8 | -0.1 |
| ලං.වි. සමාගම (LECO) | 1,633 | 1,550 | 1.7 | -5.1 |
| ලං.වි. සමාගමේ විදුලි අලෙවියේ සංයුතිය (ගිගාවොට් පැය) | 1,603 | 1,559 | -1.3 | -2.7 |
| ගෘහස්ථ සහ ආගමික | 717 | 699 | -3.0 | -2.6 |
| කර්මාන්ත | 306 | 266 | 9.6 | -13.2 |
| පොදු සේවා, හෝටල් සහ රාජ්‍ය අංශය | 557 | 569 | -4.5 | 2.2 |
| වීදි ආලෝක කිරීම | 23 | 26 | 3.4 | 10.7 |
| ලං.වි.ම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය (%) | 9.0 | 8.9 | -1.1 | -0.7 |
| පාරිභෝගිකයන් සංඛ්‍යාව ('000) (ඊ) | 7,401 | 7,531 | 2.6 | 1.7 |
| ඉන්, ගෘහස්ථ සහ ආගමික | 6,411 | 6,509 | 2.2 | 1.5 |
| කාර්මික | 73 | 75 | 4.2 | 2.5 |
| පොදු සේවා, හෝටල් සහ රාජ්‍ය අංශය | 915 | 944 | 5.5 | 3.2 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර ඇතුළත් නොවේ
(ඈ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිල දී ගත් විදුලිබලය ද ඇතුළත්ය
(ඉ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත්ව
(ඊ) සී.ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පාරිභෝගිකයින් ද ඇතුළත්ව

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

**3.7 රූප සටහන**

**විදුලි බලය : සාමාන්‍ය පිරිවැය හා සාමාන්‍ය ගාස්තුව**




(අ) උත්පාදන අන්තයේ සාමාන්‍ය පිරිවැය

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

පදනම් බලපෑම හේතුවෙන් හෝටල් සහ පොදු සේවා යන අංශ වෙත සිදු කළ විදුලිබල අලෙවිය, පිළිවෙළින්, සියයට 11.7ක සහ සියයට 2.3ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, අති නවීන තාක්ෂණික ක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, විදුලි පරිභෝජන මට්ටම් පිළිබඳව පරිශීලකයින් දැනුම්වත් කරන අතර ම, බලශක්ති භාවිතය පිළිබඳ නිවැරදි හා තත්කාලීන අලෙවි දත්ත රැස් කිරීම සඳහා ලං.වි.ම සුහුරු මනු කියවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළේය. කෙසේ වෙතත්, සුහුරු මනු කියවීමේ උපකරණවල අධික පිරිවැය, පරිශීලකයින් අතර පවතින දුර්වල දැනුම්වත්භාවය සහ තාක්ෂණික ගැටලු ඇතුළු කරුණු කිහිපයක් හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියට බාධා ඇති විය. කාර්යක්ෂම මනු කියවීමේ ක්‍රමයක් සක්‍රීය කිරීම සහ බිල්පත් ක්‍රියා පටිපාටියේ ඇති ගැටලු අවම කිරීම සඳහා නිසි සැලකිල්ලක් දක්වමින්, ලං.වි.ම.හි මුදල් ප්‍රවාහය වැඩි දියුණු කර ගැනීම සඳහා තත්කාලීන පදනමින් නිවැරදි දත්ත රැස් කිරීමට ලං.වි.ම. විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ.

**ලං.වි.ම.හි දුර්වල මූල්‍ය තත්ත්වය තවදුරටත් තීව්‍ර කරමින් ඉහළ ගිය විදුලි උත්පාදන පිරිවැය සැලකිල්ලට ගනිමින්, වසර අටකට වැඩි කාලයකට පසුව 2022 වසරේ දී විදුලිය ගාස්තු ඉහළ නංවන ලදී.** 2022 වසරේ අගෝස්තු මාසයේ 10 වන දින, විදුලිය ගාස්තු සියයට 75ක සාමාන්‍යයකින් ඉහළ නංවන ලද අතර, අඩු ආදායම්ලාභී කුටුම්භවල බලශක්ති මිලදී ගැනීමේ හැකියාව සැලකිල්ලට ගනිමින්, අඩු පරිභෝජනයක් සහිත ඒකක 0-30 සහ ඒකක 31-60 කාණ්ඩ සඳහා ස්ථාවර ගාස්තුවලට අදාළව සහනයක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ලං.වි.ම.හි මූල්‍ය ප්‍රකාශන තුළින් පිළිබිඹු වන පරිදි මෙම ගාස්තු ඉහළ නංවමින් සිදුකරන ලද සංශෝධනවලින් අනතුරුව ද, ලං.වි.ම.හි ආදායම හා පිරිවැය සමාන වන මට්ටමක මූල්‍ය කාර්යසාධනයක් ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, එමගින් ලං.වි.ම.හි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සංශෝධන අඛණ්ඩව සිදු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඒ පිළිබඳව සලකා බලමින් ස්වයංක්‍රීය පිරිවැය ආවරණය වන ගාස්තු සංශෝධනයක් හරහා මාස හයකට වරක් ගාස්තු සංශෝධන කිරීමේ යාන්ත්‍රණයක් 2023 වසරේ සිට ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, 2023 වසරේ පෙබරවාරි මාසයේ 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය ගාස්තු සාමාන්‍යය සියයට 66කින් පමණ නැවත ඉහළ නංවන ලදී. මෙම විදුලිය ගාස්තු සංශෝධනය යටතේ, ගෘහස්ථ විදුලි පාරිභෝගිකයින්ගෙන් සියයට 75කට වඩා වැඩි ප්‍රමාණයක් අයත් වන මසකට විදුලි ඒකක 0-90ත් අතර පරිභෝජන පරාසයක් තුළ සිටින ගෘහස්ථ පාරිභෝගික කාණ්ඩය සඳහා වන ස්ථාවර ගාස්තු සහ බලශක්ති ගාස්තු සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. ඒ අනුව, ඒකක 90ට අඩුවෙන් පරිශීලනය කරන පාරිභෝගික කාණ්ඩ සඳහා විදුලි ඒකකයක මිල සියයට 160 සිට සියයට 275ක් දක්වා පරාසයකින් ඉහළ නංවා ඇත.

**3.3 සංඛ්‍යා සටහන**

**සාමාන්‍ය විදුලිබල පිරිවැය සහ සාමාන්‍ය විදුලිබල ගාස්තු**

| ශීර්ෂය | 2021 අවසානයට (අ) | 2022 අවසානයට (ආ) | වර්ධන අනුපාතය (%) | |
|---|---|---|---|---|
| | | | 2021(අ) | 2022(ආ) |
| **ලංකා විදුලිබල මණ්ඩලයේ සමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)** | **9.61** | **20.35** | **-7.1** | **111.8** |
| ජල විදුලිය | 1.72 | 1.80 | -26.2 | 4.7 |
| ද්‍රව ඉන්ධන | 32.03 | 67.69 | 10.4 | 111.3 |
| ගල් අඟුරු | 12.43 | 27.32 | 14.4 | 119.8 |
| **පෞද්ගලික අංශයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)** | **21.67** | **32.04** | **-5.5** | **47.9** |
| ද්‍රව ඉන්ධන | 30.35 | 69.65 | 10.2 | 129.5 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව | 16.22 | 14.98 | -14.6 | -7.6 |
| **සමස්ත සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)** | | | | |
| උත්පාදන අවස්ථාවේ දී | 12.38 | 23.01 | -11.5 | 85.9 |
| විකුණුම් අවස්ථාවේ දී | 19.42 | 33.65 | -10.4 | 73.3 |
| **සාමාන්‍ය ගාස්තුව (රු./කි.වො.පැ.)** | **16.35** | **21.25** | **-2.2** | **30.0** |
| ගෘහස්ථ | 14.91 | 19.11 | 0.3 | 28.2 |
| පොදු සේවා | 23.42 | 27.36 | -2.0 | 16.8 |
| රාජ්‍ය අංශය | 18.25 | 23.84 | 1.1 | 30.6 |
| කර්මාන්ත | 14.70 | 20.63 | -0.9 | 40.3 |
| හෝටල් | 17.79 | 21.39 | -1.9 | 20.2 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

තවද, භාවිත කරන ඒකක ප්‍රමාණයට අය කිරීම් කරන විදුලි සම්බන්ධතා වර්ගීකරණය අනුව, පොදු සේවා, හෝටල් සහ රජයේ අනෙකුත් අංශවල විදුලි ඒකකයක මිල සියයට 70 සිට සියයට 100ක් දක්වා පරාසයකින් ඉහළ නංවා ඇති අතර, විදුලි ගාස්තු පිළිබඳ නවතම සංශෝධනයේ දී කර්මාන්ත කාණ්ඩය යටතේ ඇති පාරිභෝගික කාණ්ඩවල විදුලි ඒකකයක මිල සියයට 25කින් ඉහළ ගොස් ඇත. විදුලි ගාස්තු ඉහළ නංවමින් නව සංශෝධන සිදු කළ ද, 2023 වසර සඳහා ලං.වි.ම.යේ ඇස්තමේන්තුගත සාමාන්‍ය විකුණුම් මිල වන, ඒකකයක් (කි.වො.පැ. 1ක්) සඳහා රුපියල් 48.74 හා සැසඳීමේදී සමහර විදුලි පරිභෝජන කණ්ඩායම් තවදුරටත් සහනාධාර මිල ප්‍රතිලාභ අත්විඳිමින් සිටී. කෙසේ වෙතත්, ලං.වි.ම. විස්තීර්ණ ලෙස ප්‍රතිව්‍යුහගත නොකර පාරිභෝගිකයින් සඳහා ප්‍රතිලාභ ලබා දිය නොහැක. විදුලිය ගාස්තු මිල ගණන් අඛණ්ඩව ඉහළ දැමීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇති අතර, සමාජයේ සමහර කාණ්ඩවලට විදුලිය බිල්පත් සඳහා ගෙවීම් කිරීමට නොහැකි වීමත් සමඟ සමාජ නොසන්සුන්තාවක් නිර්මාණය විය. මේ සම්බන්ධයෙන් ගත්කල, සමහර පුද්ගලයින් හා ආයතන විසින් මේ දක්වා නොගෙවා ඇති හිඟ බිල්පත් අයකර ගතයුතු අතර, ගෙවීම් දීර්ඝ කාලීනව ප්‍රමාද වූ බිල්පත් සඳහා ගෙවීම් කඩිනම් කිරීම කළ යුතු වේ.

**තාප විදුලිබල උත්පාදනයේ පිරිවැය ඉහළ ගියද, ජල විදුලි උත්පාදනය මත වැඩි වශයෙන් රඳා පැවතීම මෙන්ම විදුලි ගාස්තු ඉහළ නැංවීම, 2022 වසරේ දී ලං.වි.ම.හි මූල්‍ය කාර්යසාධනය වර්ධනය කිරීමට උපකාරී විය.** ඒ අනුව, විදුලි ගාස්තු සංශෝධනයත් සමග මුදල් ප්‍රවාහය වර්ධනය වීම කිසියම් දුරකට හේතු කොට ගෙන, 2022 වසරේ අගෝස්තු මාසයේ සිට ලං.වි.ම.හි මෙහෙයුම් අලාභය තරමක් පහළ ගොස් ඇත. කෙසේ වෙතත්, සමුච්චිත පදනම මත, ලං.වි.ම. 2021 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 34.6ක අලාභය සමඟ සැසඳීමේදී 2022 වසරේ දී රුපියල් බිලියන 272.9ක අලාභයක් වාර්තා කළේය. නොරොච්චෝල ගල් අඟුරු බලාගාරයට අදාළව නොපියවා ඇති විදේශ ණය තොගයෙහි ප්‍රත්‍යාගණන අලාභ (revaluation loss) වලින් කොටසක්, එනම්, රුපියල් බිලියන 94.7ක් මෙම අලාභය තුළ ඇතුළත් කර ඇත. ලං.වි.ම. විසින් බැංකු අංශයෙන් ලබාගත් කෙටිකාලීන ණය සහ ලං.ඛ.නි.සං. හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත වූ නොපියවූ වගකීම් 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 289.0ක සිට 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 361.9ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් සඳහා වූ රුපියල් බිලියන 37.3ක මුදලක් 2021 වසර අග භාගයේ සිට ලං.වි.ම. විසින් නොපියවීම, බලශක්ති උත්පාදනය සඳහා පුනර්ජනනීය අංශයේ දායකත්වය පුළුල් කිරීමට බාධාවක්ව පැවතුණි. මේ අතර, රජය සතු ව්‍යවසායන්හි මූල්‍ය ශක්‍යතාව ශක්තිමත් කිරීමට, එම ආයතනවල හඳුනාගත් වගකීම් රජයේ ශේෂ පත්‍රයට පැවරීම සඳහා වන රජයේ ක්‍රියාමාර්ග යටතේ, ව්‍යාපෘති හතක් යටතේ ලං.වි.ම. වෙත ලබා දුන් රුපියල් බිලියන 61.0ක ණය වගකීම් සහ නොරෝච්චෝලේ ව්‍යාපෘතියෙහි රුපියල් බිලියන 85.6ක ණය සේවාකරණය රජය වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ලං.වි.ම.හි දිගු කාලීන වගකීම් 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් 541.2ක සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 346.0ක් දක්වා අඩු විය. මෙම ක්‍රියාමාර්ග ඇතුළුව විධිමත් ලෙස පිරිවැය පිළිබිඹු කෙරෙන විදුලි ගාස්තු සංශෝධන සමඟින් ලං.වි.ම.යේ මුදල් ප්‍රවාහයේ සැලකිය යුතු දියුණුවක් අපේක්ෂා කරන අතර, එමගින් රජයේ මුදල් ප්‍රවාහය සහ සමස්ත ආර්ථිකය මත ඇති පීඩනය අඩු කරමින් විදුලි ඉල්ලුම බාධාවකින් තොරව සපුරාලීමට හැකි වනු ඇත.

**අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම අඛණ්ඩව ප්‍රමාද වීම හේතුවෙන් විදුලිබල හා බලශක්ති අංශයේ ඉහළ ගිය අවදානම් මගින් 2022 වසරේ දී ඇතිකළ සැලකිය යුතු සමාජ ආර්ථික පිරිවැය හරහා රටේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.** රජයේ අයවැය මත වන පීඩනය අඩු කරමින් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය ආර්ථික වශයෙන් ශක්තිමත් අංශයක් බවට පත්කිරීමේ අරමුණින් යුතුව, රජය 2022 වසරේ දී ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නැංවීය. 2022 වසරේ දී, මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද, රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය හරහා ලං.වි.ම. ඇතුළු රජය සතු වාණිජ ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. මේ අතර, බලශක්ති ක්ෂේත්‍රය තිරසාර ලෙස සංවර්ධනය කිරීම සඳහා ලං.වි.ම.හි ප්‍රධාන මෙහෙයුම් වන විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ අනෙකුත් කාර්යයන් විමධ්‍යගත කිරීම හරහා ලං.වි.ම. ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු ප්‍රතිපත්ති සහ උපාය මාර්ග හඳුනාගැනීම, යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සහ තීරණ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබා දීමට 2022 වසරේ අගෝස්තු මාසයේ දී කැබිනට් අනුකමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, 'ඉදිරි

දශකය සඳහා ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම' පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව 2022 වසරේ අවසාන කාලයේ දී අනුමත කරන ලදී. මීට අමතරව, 2022-2041 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම 2022 වසර තුළ දී සකස් කරන ලදී. එම සංවර්ධන සැලැස්මට අනුව, 2030 වසර වන විට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 70ක් පමණ පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් සිදු කිරීමට මෙන්ම 2050 වසර වන විට කාබන් විමෝචනය අඩු කිරීමටත්, එමගින් නව ගල් අඟුරු බලාගාර ඉදිකිරීම නතර කිරීම මෙන්ම පරිසරයට හානි සිදු නොවන පිරිසිදු බලශක්තිය සැපයීමත් අපේක්ෂා කෙරේ. යාවත්කාලීන කරන ලද 2023-2042 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කෙටුම්පත් කර ඇති අතර, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ඒ සඳහා අනුමැතිය හිමිවිය. මේ අතර, පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා කාර්ය පටිපාටියට අදාළ බාධා ඉවත් කරමින්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරන ලද අතර, 2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත 2022 ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

**ඉදිරි කාලසීමාව තුළ, ඉහළ යන බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සහ බලශක්ති උත්පාදන ධාරිතාව පුළුල් කිරීම රජයේ ප්‍රධාන ප්‍රමුඛතාවයන් ලෙස පවතී.** මන්දගාමීව වුවද, නව බලාගාර කිහිපයක් ඉදිකිරීමේ සැලසුම් සහ ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ගල් අඟුරු සහ ඉන්ධන මත පදනම් වූ සාම්ප්‍රදායික බලශක්ති උත්පාදනයේ ආර්ථික හා පාරිසරික ගැටලු සැලකිල්ලට ගෙන, ස්වභාවික ද්‍රවීකෘත වායුව වැනි නව බලශක්ති ප්‍රභවයන් ඇතුළත් කරමින් බලශක්ති සංයුතිය විවිධාංගීකරණය කිරීමට රජය තීරණය කර ඇත. ඒ අනුව, මෙ.වො. 300ක ධාරිතාවයකින් යුතු කෙරවලපිටිය සොබාදනව් ස්වභාවික ද්‍රවීකෘත වායු බලාගාරය ඉදිවෙමින් පවතින අතර, එය 2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. 2025 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මෙ.වො. 300ක ධාරිතාවයකින් යුතු දෙවන ස්වභාවික ද්‍රවීකෘත වායු බලාගාරයක් කෙරවලපිටියේ ඉදිකිරීමේ මූලික කටයුතු ද මේ වන විට සිදුවෙමින් පවතී. 2023-2042 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්මට අනුව, 2026 සහ 2027 යන වසරවලදී, පිළිවෙළින්, මෙ.වො. 100ක ධාරිතාවයකින් යුත් ගෑස් ටර්බයින බලාගාරයක් (තාප පදනම් වූ) සහ මෙ.වො. 200ක ධාරිතාවයකින් යුත් අභ්‍යන්තර දහන එන්ජින් බලාගාරයක් විදුලිබල පද්ධතියට එක් කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2023-2042 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම අනුව, පැරණි තාප විදුලි බලාගාර කිහිපයක කාලසීමාව අවසන් වීමත් සමග රටෙහි ස්ථාපිත ධාරිතාව පුළුල් කිරීම සඳහා ඉදිරි වසරවලදී තාප විදුලි බලාගාර සහ ස්වභාවික ද්‍රවීකෘත වායු බලාගාර කිහිපයක් විදුලිබල පද්ධතියට එක් කෙරෙනු ඇත. මේ අතර, පද්ධති හානි (system losses) අවම කිරීම, බලශක්ති ප්‍රභවයන් වැඩි ප්‍රමාණයක් විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම සහ පද්ධති විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා, විවිධ ව්‍යාපෘති හරහා විදුලි සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ පද්ධතිය පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සිදු කෙරෙමින් පවතී.

3

**පාරිසරික, සමාජයීය සහ යහපාලනය යනාදියට අදාළ ගැටලු පිළිබඳ වාස්තවික විශ්ලේෂණ මත පදනම්ව, පිරිවැය අධික තාප බලශක්තිය මත රඳා පැවතීම අවම කිරීමේ අරමුණින් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදිකිරීමට කටයුතු කරමින් පවතී.** ඒ අනුව, මෙ.වො. 35ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතියෙහි මෙහෙයුම් කටයුතු 2022 වසර අවසානය වන විට ආරම්භ කිරීමට ආසන්නව පැවති අතර, අනෙකුත් ජල විදුලි බලාගාර ව්‍යාපෘති වන උමා ඔය (මෙ.වො. 120), මොරගොල්ල (මෙ.වො. 31), ගිං ගඟ (මෙ.වො. 20) සහ තල්පිටිගල (මෙ.වො. 15) යන ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු 2022 වසරේ දී සිදු වෙමින් පැවතුණි. 2021 වසරේ මැද භාගය වන විට මෙ.වො. 100ක ධාරිතාවයකින් යුතු මහා පරිමාණ මන්නාරම සුළං විදුලි බලාගාරය විදුලිබල පද්ධතියට එකතු කිරීමෙන් අනතුරුව, දැනට පවතින මන්නාරම විදුලි බලාගාරයේ දිගුවක් ලෙස මෙ.වො. 50ක විදුලි ජනන ධාරිතාවක් සහිත සුළං බල උද්‍යානය සහ තවත් සුළං විදුලි බලාගාර දෙකක් (අදියර II සහ III යටතේ, එක් බලාගාරයක් සඳහා මෙ.වො. 100ක් බැගින් වූ ධාරිතාවයක් සහිත) ඇතුළුව නව සුළං විදුලි බලාගාර කිහිපයකට අදාළ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී. තවද, වෛරවිල් සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 200), කරච්චි සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 100), පොන්නාලෙයි සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 100) සහ මාන්තායි බටහිර සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 100) ඇතුළු පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන

3

සැලැස්ම (2021-2026 වසර සඳහා) මගින් හඳුනාගත් ව්‍යාපෘති සුළං විභවය සහිත ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම, මූලික අදියරයන්හි පවතී. බලශක්ති උද්‍යාන සංවර්ධන ව්‍යාපෘති යටතේ වන මෙ.වො. 233ක සුළං බල ධාරිතාවක් හා මෙ.වො. 150ක සූර්ය බල ධාරිතාවක් සහිත පුනරීන් පුනර්ජනනීය බලශක්ති උද්‍යාන ව්‍යාපෘතියට අදාළව මෙ.වො. 100ක සුළං බල ධාරිතාවක් ස්ථාපනය කිරීමේ මූලික සංවර්ධන කටයුතු 2022 වසරේ දී සිදු කරන ලදී. මෙ.වො. 100ක ධාරිතාවයකින් යුතු සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මෙම වසර තුළ ආරම්භ වූ අතර, මෙම විදුලි බලාගාරයේ සැලසුම සඳහා භාවිත කරන දත්ත රැස් කිරීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශය තුළ කාලගුණික මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී. තවද, සූර්ය බලශක්ති ධාරිතාව පුළුල් කිරීම සඳහා හම්බන්තොට සහ ත්‍රිකුණාමලය ප්‍රදේශවල මහා පරිමාණ සූර්ය ව්‍යාපෘති ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් ආරම්භ කරන ලදී. සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය යටතේ, 2022 වසරේ දී වහල මත සූර්ය පැනල ස්ථාපිත කිරීම මගින් ජාතික විදුලිබල පද්ධතියට එකතු කළ විදුලිය ධාරිතාව මෙ.වො. 231ක් පමණ වූ අතර, සම්පූර්ණ ධාරිතාවය මෙ.වො. 32කින් යුතු ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ ආරම්භයේ සිටම සමස්තයක් ලෙස මෙ.වො. 670ක් පමණ ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. එ.ජ. ඩොලර් මිලියන 100ක් වන ඉන්දියානු ණය ආධාර යටතේ රජයේ ගොඩනැගිලිවල වහල මත සූර්ය පැනල ස්ථාපිත කිරීම, අඩු ආදායම්ලාභී නිවාස ඒකක, ආගමික ස්ථාන සඳහා බලශක්ති ගබඩා පහසුකම් සහිත සූර්ය බල කට්ටල, සහ ප්‍රතිලෝම ඔස්මෝසිස් බලාගාර ස්ථාපිත කිරීම මෙන්ම, ජලාශ මත පාවෙන සූර්යබල පැනල සවිකිරීමේ නියමු ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති මගින් සූර්ය බලශක්ති ධාරිතාවට මෙ.වො. 135ක් එකතු කිරීම 2022 වසරේ දී ආරම්භ කරන ලදී. ඉන්දියාවෙන් ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 11ක ආධාර යටතේ යාපනයේ අනලයිතිව්, ඩෙල්ෆ් සහ නයිනතිව් යන දූපත්වල පුනර්ජනනීය ද්වි ප්‍රභව බලශක්ති පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතියට සූර්ය, සුළං, ඩීසල් සහ ලිතියම්-අයන බැටරි මත පදනම් වූ ද්වි ප්‍රභව බලාගාර ඇතුළත් වන අතර, එම ව්‍යාපෘතිය 2024 වසරේ මුල් භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කාල සීමාව තුළ පිරිවැය සඳහා වන පරාමිතීන්හි සිදු වූ කැපී පෙනෙන වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, පුනර්ජනනීය බලශක්ති අංශය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2012 වසරෙන් පසු ප්‍රථම වතාවට, ලං.වි.ම. විසින් පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් සඳහා අදාළ වන ගාස්තු 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සංශෝධනය කරන ලදී. මේ අතර, සූර්ය බලශක්ති උත්පාදනය ව්‍යාප්ත කිරීමට සහාය දැක්වීම සඳහා සූර්ය පැනල ස්ථිතික පරිවර්තක ආනයනය සඳහා අදාළ වන වරාය සහ ගුවන් තොටුපළ බදු 2023 වසරේ මුල් කාලයේ දී ඉවත් කරන ලදී. 2022 වසරේ දී පුනර්ජනනීය බලශක්ති අංශය සංවර්ධනය කිරීම සඳහා නොයෙකුත් ප්‍රයත්න දැරුවද, එම අංශය මුහුණදුන් දුෂ්කරතා රාශියක් හේතුවෙන් එහි ප්‍රගතියට බාධා ඇතිවිය. ප්‍රාග්ධන පිරිවැය සහ ආනයන වියදම් ඉහළ යෑම, කුඩා බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවීම් සිදු කිරීමේදී ඇති වූ ප්‍රමාදය, ජාතික විදුලිබල පද්ධතියේ පවතින ධාරිතා සංරෝධක යනාදී සාධක මගින්, රටේ පුනර්ජනනීය බලශක්ති අංශයේ ප්‍රසාරණය සඳහා අඛණ්ඩව බාධා සිදු කරන ලදී. මෙවැනි පසුබිමක් තුළ, රටේ බලශක්ති සුරක්ෂිතභාවය තිරසාර ලෙස සහතික කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති අංශයේ ආයෝජන ප්‍රවර්ධනය සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීමේ දී විදුලිබල හා බලශක්ති අංශයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් අත්‍යවශ්‍ය වේ.

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය රට තුළ තිරසාර බලශක්ති සංවර්ධනය දිරිගැන්වීම සඳහා වන සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය.** බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, බලශක්ති නාස්තිය අවම කිරීම මගින් බලශක්ති සංරක්ෂණය දිරිගැන්වීම, හිතකර ප්‍රතිපත්ති සැකසීම, බලශක්ති තොරතුරු කළමනාකරණය සහ විශ්ලේෂණය, තිරසාර බලශක්ති ක්ෂේත්‍රය තුළ අවශ්‍ය ආයෝජන සහතික කිරීම සහ ශ්‍රී ලංකාව බලශක්තිය මූලික කරගත් සමාජ ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම යනාදී සෑම ආකාරයකම පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීමේ කටයුතුවල ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අඛණ්ඩව නිරත විය. බලශක්ති කළමනාකරණය හා සංරක්ෂණ වැඩසටහන්, සම්පත් හඳුනාගැනීමේ වැඩසටහන් හා ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද අතර, බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණින් 2024-2029 වසර සඳහා වන පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම සංශෝධනය කිරීම ද 2022 වසරේ දී ආරම්භ කරන ලදී. 'ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය සඳහා පුහුණු මධ්‍යස්ථාන (THREE Lanka) ව්‍යාපෘතිය' යුරෝපයේ හා ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සහයෝගීතාවයෙන් යුතුව ක්‍රියාත්මක විය. යුරෝපා සංගමය, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යටතේ, දැරිය හැකි පිරිවැයක් යටතේ පාරිසරික වශයෙන් හිතකර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා ගැනීමට හැකියාවක් පවතින අතර, එය සලකා

බලන රටවල් විසින් අනුගමනය කරන ක්‍රියාවලි සහ පිළිවෙත්වල පාරදෘශ්‍යභාවය අනුව තීරණය වේ. ශ්‍රී ලංකාව ද මෙවැනි ව්‍යාපෘති සඳහා කඩිනමින් ප්‍රවේශයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

## මාර්ග සංවර්ධනය

**මුදල් ප්‍රවාහ පීඩන මධ්‍යයේ, දැඩි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් පිළිබිඹු කරමින්, 2022 වසරේ රජයේ මාර්ග යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** අධිවේගී මාර්ග, මහාමාර්ග සහ මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වාභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හරහා මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විවිධ ක්‍රියාකාරකම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය රුපියල් බිලියන 195.4ක් පමණ වැය කර ඇත. ඒ අනුව, මෙම වසර තුළ අධිවේගී මාර්ග සහ මහාමාර්ග සංවර්ධනය සඳහා දරන ලද වියදම, පිළිවෙළින්, රුපියල් බිලියන 34.4ක් සහ රුපියල් බිලියන 145.0ක් වූ අතර, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 6.6ක් වැය කර ඇත. වියදම් කපා හැරීමේ රජයේ ප්‍රයත්නයන් යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ලබා දෙන වාර්ෂික අයවැය ප්‍රතිපාදන අවස්ථා ගණනාවකදී සංශෝධනය වුවද, 2022 වසර සඳහා දරන ලද වියදම වාර්ෂික ප්‍රතිපාදන යටතේ වෙන් කරන ලද රුපියල් බිලියන 247.8ට වඩා පහළ මට්ටමක පැවතුණි. මේ අතර, පසුගිය වසර කිහිපය තුළ මාර්ග ජාලය පුළුල් කිරීම සඳහා ආයෝජන අඩු මට්ටමක පැවතීම පිළිබිඹු කරමින්, 2020 වසරේ සිට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලැබූ A සහ B කාණ්ඩයේ ජාතික මහාමාර්ග සහ අධිවේගී මාර්ගවල සමස්ත දිග පෙර වසරට සාපේක්ෂව 2022 වසර අවසන් වන විට පිළිවෙලින් කිලෝමීටර් 12,225ක් හා කිලෝමීටර් 312.6ක් ලෙස පුළුල් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

**අධිවේගී මාර්ග ජාලයේ සංවර්ධන කටයුතු මෙම වසර තුළ දී මන්දගාමී විය.** බොහෝ දුරට රජයේ දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන්, කඩවත සිට දඹුල්ල දක්වා දිවෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ සමස්ත ඉදිකිරීම් කටයුතු 2022 වසරේ දී ඉතා සුළු ප්‍රගතියක් වාර්තා කළේය. කඩවත සිට මීරිගම දක්වා විහිදෙන අධිවේගී මාර්ග කොටසට අදාළ සිවිල් වැඩ කටයුතු වල සමුච්චිත ප්‍රගතිය 2021 වසර අවසානයේ පැවති සියයට 19.4 සිට 2022 වසර අවසානය වන විට සියයට 34.8ක් දක්වා වර්ධනය වී ඇත. මීට අමතරව, මීරිගම සිට කුරුණෑගල දක්වා විහිදෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ II කොටස 2022 වසරේ ජනවාරි මාසය මැද භාගයේ දී අවසන් කර මහජනතාව සඳහා විවෘත කරන ලදී. මේ අතර, කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා දිවෙන රුවන්පුර අධිවේගී මාර්ගය යටතේ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ දී මන්දගාමී වේගයකින් සිදු විය. තවද, මහාමාර්ග අමාත්‍යාංශයේ තීරණයට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුවන්පුර අධිවේගී මාර්ගයේ II සහ III අදියරවලට අදාළ ශක්‍යතා අධ්‍යයනය නැවත සමාලෝචනය කරන ලදී. අමුද්‍රව්‍ය හිඟය, යෙදවුම් පිරිවැය ඉහළ යෑම සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය වැනි බාධක හමුවේ වුවද, වරාය නගරය සහ ගාලු මුවදොර අධිවේගී මාර්ග ජාලයට සම්බන්ධ කරමින් කුළුණු මතින් දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් වසර පුරා අඛණ්ඩව සිදු වූ අතර, 2022 වසර අවසන් වන විට සියයට 54.3ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

**2022 වසරේ දී අධිවේගී මාර්ග තුළ ධාවනය කළ සමස්ත රථ වාහන සංඛ්‍යාව පහළ ගියේය.** ඉන්ධන හිඟයේ බලපෑම පිළිබිඹු කරමින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට ගොඩගම දක්වා සහ පාලටුව සිට මත්තල දක්වා දෛනිකව ධාවනය කළ රථ වාහන සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, 28,448ක් සහ 6,425 දක්වා, පිළිවෙළින්, සියයට 13.3කින් සහ සියයට 18.2කින් පහළ ගියේය. පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ දෛනිකව ධාවනය වූ රථ වාහන සංඛ්‍යාව ද 2021 වසරේ වාර්තා කළ 37,219ක සිට 28,291ක් දක්වා සියයට 24.0කින් පහළ ගියේය. මේ අතර, කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ දෛනිකව ධාවනය වූ රථ වාහන සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 14.0කින් ඉහළ ගියේය. 2021 වසරට සාපේක්ෂව මෙම වසර තුළ දී, අධිවේගී මාර්ගවල ආදායම සියයට 10.1ක පහත වැටීමක් වාර්තා කරමින් රුපියල් බිලියන 7.9ක් පමණ දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, මධ්‍යම අධිවේගී මාර්ගයේ අලුතින් විවෘත කරන ලද මීරිගම සිට කුරුණෑගල දක්වා කොටසෙහි දිනකට සාමාන්‍යයෙන් වාහන 9,106ක් පමණ ගමන් කිරීම සිදු වූ අතර, 2022 වසරේ දී එමගින් රුපියල් මිලියන 703.8ක ආදායමක් උපයා ඇත. එය, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ අධිවේගී මාර්ගවලින් ලැබුණු වාර්ෂික ආදායමේ සමස්ත අඩුවීම යම්තාක් දුරට පියවා ගැනීමට උපකාරී වී ඇත.

**2022 වසර තුළ මාර්ග පද්ධති සහ පාලම් සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු මන්දගාමීව සිදුවිය.** මෙම වසර තුළ දී දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය

බොහෝ දුරට අවසන් කරන ලද අතර, බදුල්ල සිට චෙන්කලඩි දක්වා මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලුණුගල - බිබිල කොටසේ මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ I අදියර සහ II අදියර, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සහ අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළු තවත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 2022 වසරේ දී ජාතික මාර්ගවල ඇතැම් පාලම් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද අතර, බාලදක්ෂ මාවත සහ ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත යා කෙරෙන ගුවන් පාලම්, විනිසුරු අක්බර් මාවතේ දුම්රිය හරස් මාර්ගය සහ උත්තරානන්ද මාවතේ දුම්රිය හරස් මාර්ගයට අදාළ ඉදිකිරීම් කටයුතු ද සිදු වෙමින් පැවතුණි.

## මාර්ගස්ථ මගී ප්‍රවාහනය

**ඉන්ධන හිඟය මෙන්ම ඉහළ ගිය පිරිවැය යටතේ වුවද, කොවිඩ්-19 ආශ්‍රිත අවදානම් පහළ යෑම හේතුවෙන් පුද්ගල සංචරණ කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී මාර්ගස්ථ මගී ප්‍රවාහන ක්‍රියාකාරකම් වැඩිදියුණු විය.** ඒ අනුව, මෙම වසර තුළ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලං.ග.ම.) ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන, පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 41.2කින් සහ සියයට 141.0කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දී ශ්‍රී ලං.ග.ම. සතු මුළු බස් රථ සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 6,932ක් දක්වා සියයට 1.2කින් සුළු වශයෙන් අඩු වූ අතර, නව බස් රථ කිසිවක් ශ්‍රී ලං.ග.ම. යටතේ ධාවනයේ යොදවා නොතිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලං.ග.ම. මගින් ධාවනය කළ බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය 4,279ක් දක්වා සියයට 216.3කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, එම බස් රථ සංඛ්‍යාව ශ්‍රී ලං.ග.ම.යේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා ඵලදායි ලෙස යොදා ගත හැකි බස් රථ සංඛ්‍යාවෙන් සියයට 84.2ක් පමණ විය. මේ අතර, වසර තුළ දී පෞද්ගලික අංශයේ ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන ද, පිළිවෙළින්, සියයට 24.4කින් සහ සියයට 23.4කින් ඉහළ ගියේය. පෞද්ගලික අංශය මගින් ධාවනයේ යෙදවූ බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය 2021 වසරේ වාර්තා කළ බස් රථ 9,053ක සිට 2022 වසර අවසානයේ දී බස් රථ 9,807ක් දක්වා සියයට 8.3කින් ඉහළ ගියේය. 2022 වසර අවසානය වන විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පෞද්ගලික අංශය වෙත පළාත් අතර බස් රථ ධාවනය සහ පළාත තුළ බස් රථ ධාවනය සඳහා ලබා දුන් බලපත්‍ර සංඛ්‍යාව, පිළිවෙළින්, 3,129ක් සහ 16,733ක් ලෙස වාර්තා විය.

**ඉන්ධන මිල ගණන් ඉහළ යෑමෙන් අනතුරුව පොදු ප්‍රවාහන පහසුකම් සඳහා වන ඉල්ලුමෙහි ඇති වූ සැලකිය යුතු ඉහළ යෑම සපුරාලීම සඳහා පොදු ප්‍රවාහන අංශයේ දියුණුව මධ්‍යස්ථව පැවතුණි.** 2022 වසර තුළ දී, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ප්‍රවාහන පහසුකම් අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සිය දෛනික වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, ජාතික ගමනාගමන කොමිෂන් සභාව මුහුණ දුන් මූල්‍ය අවහිරතා මධ්‍යයේ පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග කිහිපයක ප්‍රගතිය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ ඇති විශේෂ බස් රථ සේවා වන 'සිසු සැරිය' සහ 'නිසි සැරිය' යන සේවා සඳහා, පිළිවෙළින්, නව සේවා 52ක් සහ 25ක් යෙදවීම තුළින් එම සේවා තවදුරටත් වැඩි දියුණු කරන ලදී. ඒ අනුව, 2022 වසර අවසන් වන විට 'සිසු සැරිය' යටතේ බස් රථ සේවා 1,617ක් ක්‍රියාත්මක වූ අතර, 'නිසි සැරිය' වැඩසටහන යටතේ බස් රථ සේවා 219ක් ක්‍රියාත්මක විය. මේ අතර, ඉන්ධන මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ පෞද්ගලික පාසල් ප්‍රවාහන සේවාවල මිල ගණන් ඉහළ යෑමත් සමඟ, ඉහළ යන ඉල්ලුම සපුරාලමින්, පාසල් සිසුන්ට පහසුකම් සැලසීමේ නව වැඩසටහනක් ආරම්භ කරන ලදී. 'සිසු සැරිය' යටතේ නව සේවා සඳහා පහසුකම් සැලසීමට 2022 වසර සඳහා රජය විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, මෙම නව වැඩසටහන සහනාධාර මිලක් නොමැතිව, සාමාන්‍ය ගාස්තු යටතේ ක්‍රියාවට නැංවීය. 2022 වසරේ දී, ශ්‍රී ලං.ග.ම.හි සහයෝගය ඇතිව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථ සහ පාසල් ප්‍රවාහන සේවා සඳහා ප්‍රමාණවත් පරිදි ඉන්ධන සැපයීමට ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබීය. මේ අතර, ඉන්ධන හිඟයන් සහ ඉන්ධන මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මධ්‍යයේ පුද්ගලයන්ට රාජ්‍ය අංශයේ ප්‍රවාහන සේවා තෝරා ගැනීමට සිදු වීමත් සමඟ 2022 වසරේ දී පොදු ප්‍රවාහන පහසුකම් සඳහා ඇති ඉල්ලුමෙහි වර්ධනයක් දක්නට ලැබිණි. ඉන්ධන මිල ගණන් ඉහළ යෑම සහ බදු ප්‍රතිසංස්කරණ මධ්‍යයේ ආදායම් පහළ යෑම ආදිය හේතුවෙන් ඉදිරියේ දී පොදු ප්‍රවාහන පහසුකම් සඳහා ඇති ඉල්ලුම තවදුරටත් ඉහළ යා හැකිය.

මෙමගින් රටේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා ක්ෂණික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අවශ්‍ය බව පිළිබිඹු කෙරේ.

**බොහෝ දුරට, දේශීය වශයෙන් සිදු කරන ලද ඉන්ධන මිල සංශෝධනයන්ට සමගාමීව, මෙම වසර තුළ දී බස් ගාස්තු අවස්ථා හතක දී සංශෝධනය කරන ලදී.** ඒ අනුව, වසර තුළ දී බස් ගාස්තු සංශෝධනය කළ මුල් අවස්ථා පහ ඇතුළත අවම බස් ගාස්තුව රුපියල් 17.00 සිට රුපියල් 40.00 දක්වා වැඩි කරන ලදී. කෙසේ වෙතත්, අවසානයට සිදු කළ බස් ගාස්තු සංශෝධන ද්විත්වය මගින් 2022 වසර අවසන් වන විට අවම බස් ගාස්තුව රුපියල් 34.00ක් දක්වා අඩු කරන ලදී. සාමාන්‍ය, සුඛෝපබෝගී සහ අර්ධ සුඛෝපභෝගී බස් සේවාවල ගාස්තු වසර තුළ දෙගුණයකින් පමණ ඉහළ ගියේය. වසර තුළ දී, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමට සමගාමීව 'සිසු සැරිය', 'නිසි සැරිය' සහ 'ගැමි සැරිය' යන සේවාවල බස් ගාස්තු, පිළිවෙළින්, සියයට 135.1කින්, සියයට 136.8කින් සහ සියයට 134.2කින්, ඉහළ නංවා ඇති අතර, නව ගාස්තු, පිළිවෙළින්, රුපියල් 134.00ක්, රුපියල් 45.00ක්, සහ රුපියල් 89.00ක් ලෙස සටහන් වේ.

**ආදායම් අංශයේ හිතකර වර්ධනයන් පැවතියද, 2022 වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ මූල්‍ය කාර්යසාධනය අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතුණි.** අවස්ථා කිහිපයකදී බස් ගාස්තු සංශෝධනය කිරීම හේතුවෙන් වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ ආදායමේ යම් හිතකර දියුණුවක් දක්නට ලැබුණද, එමගින් ඇති වූ බලපෑම අභිබවමින් ඉන්ධන මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ වියදම් කැපී පෙනෙන ලෙස වැඩි විය. විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.ග.ම.හි සමස්ත ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 69.3ක් දක්වා සියයට 147.0කින් ඉහළ ගිය අතර, සමස්ත වියදම ද රුපියල් බිලියන 69.5ක් දක්වා සියයට 123.7කින් පමණ වැඩි විය. ශ්‍රී ලං.ග.ම. පසුගිය වසරේ වාර්තා කළ රුපියල් බිලියන 3.1ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 0.3ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. බස් ගාස්තු කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හමුවේ, වාර ප්‍රවේශපත්‍ර සඳහා ඇති ඉල්ලුමේ සැලකිය යුතු වැඩි වීමක් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සිසුන් සඳහා සහනාධාර වාර ප්‍රවේශපත්‍ර සඳහා පහසුකම් සැලසීමට රජය විසින් සපයනු ලබන සහනාධාරය 2021 වසරේ දී පැවති රුපියල් බිලියන 5.3 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 6.1ක් දක්වා ඉහළ ගිය නමුත්, ආර්ථික වශයෙන් ප්‍රතිලාභ නොලැබෙන මාර්ගවල ප්‍රවාහන සේවා යෙදවීමට රජය විසින් ලබාදුන් සහනාධාර මුදල 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 5.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 2.7ක් විය. 2023 වසරේ මුල් කාලයේ දී, ඉන්දියානු ණය ආධාර යටතේ ලැබුණු නව බස් රථ 125කින් බස්රථ 75ක්, ශ්‍රී ලං.ග.ම. විසින් ප්‍රාදේශීය ඩිපෝ අතර බෙදාහරින ලද අතර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ බස් රථ 50ක් ලියාපදිංචි කරන ලදී. ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලං.ග.ම. සමඟ එක්ව මගීන්ගේ පහසුව සඳහා පෙරගෙවුම් කාඩ්පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට ගාල්ල දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවනය වන පෞද්ගලික බස් රථවල ඊට අදාළ නවතම නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය මාර්ගස්ථ මගී අංශය තුළ සාර්ථක

**3.4 සංඛ්‍යා සටහන**

**රථවාහන නව ලියාපදිංචි කිරීම**


| ශීර්ෂය | 2021 | 2022 (අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021 | 2022 (අ) |
| **රථවාහන නව ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව)** | **33,850** | **20,510** | **-83.3** | **-39.4** |
| බස් රථ | 281 | 404 | -51.4 | 43.8 |
| මෝටර් රථ | 3,495 | 1,489 | -83.4 | -57.4 |
| ත්‍රිරෝද රථ | 2,093 | 36 | -70.7 | -98.3 |
| ද්විත්ව කාර්ය වාහන | 771 | 760 | -91.9 | -1.4 |
| යතුරු පැදි | 8,011 | 9,060 | -94.7 | 13.1 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 4,432 | 1,832 | 12.5 | -58.7 |
| ඉඩම් වාහන | 14,764 | 6,929 | 77.8 | -53.1 |
| රෝද හතරේ සයිකල් සහ මෝටර් නිවාස | 3 | - | -99.4 | - |

(අ) තාවකාලික

මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**3.8 රූප සටහන**

**රථවාහන නව ලියාපදිංචිය**




මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3

3

**3.5 සංඛ්‍යා සටහන**

**ගමනාගමන අංශයේ රජය සතු ව්‍යවසායවල මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2021 (අ) | 2022 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021 (අ) | 2022 (ආ) |
| **2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය** | | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 248 | 350 | -19.7 | 41.2 |
| මගී කිලෝමීටර් (මිලියන) | 6,225 | 15,000 | -27.8 | 141.0 |
| මුළු ආදායම (රු. මිලියන) | 28,035 | 69,258 | -10.2 | 147.0 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 31,089 | 69,545 | -7.0 | 123.7 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | -3,054 | -287 | -38.6 | 90.6 |
| **3. ශ්‍රී ලංකා දුම්රිය සේවය** | | | | |
| ධාවන කිලෝමීටර් ('000) | 6,281 | 10,510 | -21.4 | 67.3 |
| මගී කිලෝමීටර් (මිලියන) | 2,158 | 6,602 | -44.7 | 205.9 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 162 | 139 | 41.3 | -14.2 |
| මුළු ආදායම (රු. මිලියන) | 2,679 | 11,076 | -41.3 | 313.5 |
| මෙහෙයුම් වියදම (රු. මිලියන) | 12,979 | 23,513 | -11.2 | 81.2 |
| මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන) | -10,300 | -12,437 | -2.5 | -20.7 |
| **4. ශ්‍රීලංකන් ගුවන් සේවය** | | | | |
| පියාසර කරන ලද පැය ගණන | 50,287 | 84,325 | 20.9 | 67.7 |
| මගී කිලෝමීටර් ප්‍රමාණය (මිලියන) | 2,868 | 11,042 | -21.2 | 285.0 |
| මගී ආසන පිරීමේ අනුපාතය (%) | 36 | 74 | -36.0 | 106.8 |
| බර පැටවීමේ අනුපාතය (%) | 74 | 64 | 19.6 | -13.8 |
| භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො. '000) | 93 | 88 | 66.0 | -5.4 |
| සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 5,732 | 5,572 | -11.7 | -2.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

ලෙස ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, දුම්රිය මගීන් සඳහා ද හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී, අභ්‍යන්තර දහන එන්ජින්වලින් සමන්විත ත්‍රිරෝද රථ සහ යතුරුපැදි විද්‍යුත්කරණයට අදාළ මූලික කටයුතු ද ආරම්භ කරන ලදී.

**2020 වසරේ සිට බල පැවැත්වෙන මෝටර් රථ ආනයන සීමා හේතුවෙන් 2022 වසරේ දී අඛණ්ඩව තුන්වන වසර සඳහාත් නව මෝටර් රථ ලියාපදිංචියෙහි කැපී පෙනෙන පහළ යැමක් වාර්තා විය.** ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ මෝටර් රථ, ත්‍රිරෝද රථ, භාණ්ඩ ප්‍රවාහන වාහන සහ ඉඩම් වාහන ලියාපදිංචි කිරීම්හි පහළ යැම බොහෝ දුරට පිළිබිඹු කරමින්, 2022 වසරේ දී නව මෝටර් රථ ලියාපදිංචිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 39.4කින් පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරට සාපේක්ෂව, මෙම වසරේ දී යතුරුපැදි සහ බස් රථ ලියාපදිංචිය, පිළිවෙළින්, සියයට 13.1කින් සහ සියයට 43.8කින් ඉහළ ගියේය.

## දුම්රිය ප්‍රවාහනය

**කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව පුද්ගල සංචරණ කටයුතු ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) 2022 වසර තුළ මධ්‍යස්ථ මෙහෙයුම් වර්ධනයක් වාර්තා කළේය.** ශ්‍රී ලං.දු.සේ.හි ඇස්තමේන්තුගත සමස්ත ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 67.3කින් සහ සියයට 205.9කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, භාණ්ඩ කිලෝමීටර් ගණන, පෙර වසරේ වාර්තා වූ මෙ.ටො. මිලියන 161.6 හා සැසඳීමේදී සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මෙ.ටො. මිලියන 138.7ක් දක්වා සියයට 14.2ක පහළ යැමක් වාර්තා කළේය.

**ශ්‍රී ලං.දු.සේ.හි මූල්‍ය කාර්යසාධනය 2022 වසරේ දී පහළ මට්ටමක පැවතුණි.** තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.දු.සේ. 2021 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 10.3ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී, 2022 වසර තුළ දී රුපියල් බිලියන 12.4ක මෙහෙයුම් අලාභයක් වාර්තා විය. ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත ආදායම, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 11.1ක් දක්වා රුපියල් බිලියන 8.4කින් ඉහළ ගියේය. මේ සඳහා මූලික වශයෙන් 2022 වසරේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි දුම්රිය ගාස්තු ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස මගී ප්‍රවාහන කටයුතුවලින් උපයාගත් ආදායම වර්ධනය වීම හේතු විය. මේ අතර, මූලික වශයෙන් වසර තුළ දී ඉන්ධන මිල ගණන් ඉහළ යැමත් සමග පුනරාවර්තන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යැම හේතුවෙන්, 2022 වසරේ දී ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත වියදම රුපියල් බිලියන 42.5ක් දක්වා රුපියල් බිලියන 2.1කින් ඉහළ ගියේය. වසර තුළ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 23.5ක් දක්වා සියයට 81.2කින් ඉහළ ගිය අතර, ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 19.0ක් දක්වා සියයට 30.7කින් පහළ ගියේය. ඉන්ධන මිල ගණන් ඉහළ යැමට සමගාමීව, මගීන්, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය සඳහා වන දුම්රිය ගාස්තු, වසර හතරකට පමණ පසු, 2022 වසරේ ජූලි මාසයේ 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නංවන ලදී.


**ශ්‍රී ලං.දු.සේ. විසින් මගී සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් ලබා දීම සහතික කිරීමට යටිතල පහසුකම් සහ සේවා සංවර්ධනය කිරීමේ කටයුතු මධ්‍යස්ථ වේගයකින් වුවද, සිදු කරන ලදී.** කෙසේ වෙතත්, මූල්‍යමය අවහිරතා හේතුවෙන් දුම්රිය මාර්ග පද්ධති, දුම්රිය ඒකක සහ දුම්රිය සංඥා හා විදුලි සංදේශ සේවාවලට

අදාළ සියලුම නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම් මන්දගාමී වේගයකින් සිදු විය. 2022 වසරේ අගෝස්තු මාසයේ දී ශ්‍රී ලං.දු.සේ. විසින් කොළඹ සහ බදුල්ල අතර ධාවනය වන 'ඇල්ල ඔඩිසි' (Ella Odyssey) නගරාන්තර අධි සුඛෝපභෝගී දුම්රිය හඳුන්වා දුන් අතර, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මගීන් හට ඉතා සුවපහසු මෙන්ම ලෝකයේ වඩාත්ම දර්ශනීය දුම්රිය ගමනක අත්දැකීමක් ලබා දීමට එමගින් කටයුතු කෙරිණි. මගී දුම්රිය මැදිරි 100ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, 2022 වසර අවසානයේ දී දුම්රිය මැදිරි 50ක් නැවත ධාවනයට මුදා හරින ලදී. මීට අමතරව, 2017 වසරේ දී ලබා දුන් ඉන්දීය ණය ආධාර යටතේ මගී දුම්රිය මැදිරි 160ක් මිලදී ගැනීමේ කටයුතු මෙම වසර තුළ දී අවසන් කරන ලදී. මේ අතර, දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, දුම්රිය ස්ථාන සහ පාලම් නඩත්තු කිරීම, දුම්රිය වේදිකා පුළුල් කිරීම, දුම්රිය සංඥා හා විදුලි සංදේශ පද්ධති සැපයීමට අදාළ ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක විය.

### සිවිල් ගුවන් සේවය

**කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව ලෝකය යථා තත්ත්වයට පත්වීමත් සමග ගෝලීය සංචාරක කටයුතු ක්‍රමයෙන් ප්‍රකෘතිමත් වීම හේතුවෙන් 2022 වසරේ දී සිවිල් ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය වර්ධනය විය.** ඒ අනුව, ගෝලීය සංචාරක කටයුතු යළි ආරම්භ වීම මෙන්ම, 2021 වසරේ දී පහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑමේ සහාය බොහෝදුරට හේතු කොටගෙන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 266.8ක වර්ධනයක් වාර්තා කරමින්, 2022 වසරේ දී මගී පැමිණීම් සංඛ්‍යාව මිලියන 5.5ක් දක්වා ඉහළ ගියේය. වසර තුළ දී, භාණ්ඩ මෙහෙයුම් මෙ.ටො. 166,969ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.3කින් අඩු විය. 2022 වසර අවසානය වන විට ජාත්‍යන්තර ගුවන් සේවා 33ක් සහ අභ්‍යන්තර ගුවන් සේවා පහක් රට තුළ ක්‍රියාත්මක විය. වසර තුළ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා සිදු වූ ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව 41,547ක් දක්වා සියයට 70.7කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ, සමස්ත ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව 42,196ක් දක්වා සියයට 68.2කින් ඉහළ ගියේය. සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රුසියාව, උස්බෙකිස්තානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ තායිලන්තය යන රටවලින් නව ගුවන් සේවා සමාගම් මෙරටට ආකර්ෂණය කර ගැනීමට රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, එයාර් ෆ්‍රාන්ස්, ස්විස් ඉන්ටර්නැෂනල් එයාර් ලයින්, එලායන්ස් එයාර් ඇතුළු ජාත්‍යන්තර ගුවන් සේවා සමාගම් කිහිපයක මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ නැවත ආරම්භ කරන ලදී. දේශීය ගුවන් මගී ප්‍රවාහන කටයුතු ද 2022 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. විශේෂයෙන් ම 2022 වසරේ මැද භාගයේ දී දේශීය වශයෙන් පැවති ඉන්ධන හිඟය හේතුවෙන් ගුවන් සේවා කටයුතුවලට අභියෝග එල්ල වුවද, වසර පුරා ගුවන් යානා මෙහෙයුම් සඳහා ස්ථාවර ලෙස ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය, රජය සමඟ එක්ව ගුවන් සමාගම් සහ ගුවන් සේවා කර්මාන්තයේ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග සහයෝගයෙන් කටයුතු කළේය.

**3.9 රූප සටහන**
**ගුවන් මගී හා ගුවන් භාණ්ඩ හැසිරවීම්**




මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**3.6 සංඛ්‍යා සටහන**
**ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2021 (අ) | 2022 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021(අ) | 2022(ආ) |
| **1. මගීන් (ගණන) (ඇ)** | **1,500,078** | **5,502,539** | **-36.8** | **266.8** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 857,158 | 3,295,841 | -30.8 | 284.5 |
| විදේශ ගුවන් සේවා | 642,920 | 2,206,698 | -43.4 | 243.2 |
| **2. භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො)** | **184,139** | **166,969** | **35.3** | **-9.3** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 93,195 | 88,170 | 66.0 | -5.4 |
| විදේශ ගුවන් සේවා | 90,944 | 78,799 | 13.8 | -13.4 |
| **3. ගුවන්යානා ගමනාගමනය (ගණන) (ඈ)** | **25,090** | **42,196** | **-1.9** | **68.2** |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ | 24,336 | 41,547 | -2.4 | 70.7 |
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ | 722 | 266 | 43.0 | -63.2 |
| යාපනය ජාත්‍යාන්තර ගුවන් තොටුපොළ | 32 | 383 | -77.1 | 1,096.9 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ
(ඈ) දේශීය ගුවන් ගමන් ඇතුළත් වේ

මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

3

3

මේ අතර, ශ්‍රී ලංකා ගුවන් තොටුපළ වෙත ගුවන් සමාගම් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට නව ගුවන් සමාගම් සහ දැනට මෙහෙයුම් කටයුතු සිදු කරන සමාගම් සඳහා ගුවන්ගත වීමේ බද්ද මෙන්ම, ගුවන් යානා ගොඩ බෑමේ සහ ගුවන් යානා නැවැත්වීමේ ගාස්තුවලට අදාළව සහන කිහිපයක් ලබා දෙන ලදී.


**ආර්ථික අර්බුදය උග්‍ර වීම හේතුවෙන් ඇති වූ ඇතැම් අවහිරතා මධ්‍යයේ වුවද, 2022 වසරේ දී ගුවන් සේවා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් කටයුතු සිදු කෙරිණි.** ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සීමිත සමාගම විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි දැනට පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ල ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ව්‍යාපෘති වසර තුළ සිදු කරන ලද අතර, එමගින් ගුවන් තොටුපළ භූමි ප්‍රමාණය ඵලදායී ලෙස භාවිත කිරීමට ප්‍රයත්න දරන ලදී. එමෙන්ම, ආනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි අභ්‍යන්තර සහ බාහිර මාර්ග වැඩි දියුණු කිරීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ස්ථාපිත ඉලෙක්ට්‍රොනික වෙළඳ සංකීර්ණය සඳහා අනුබද්ධිත ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ කටයුතු ද මෙම වසර තුළ දී සිදු විය. තවද, ඉදිරි වසර 30ක කාලය තුළ ගුවන් ගමන් ක්ෂේත්‍රයට අදාළව ඉල්ලුම සඳහා පහසුකම් සැපයීමට හැකිවන පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ක්‍රමානුකූල ලෙස සංවර්ධනය කිරීම සහතික කිරීම සඳහා නව ගුවන් තොටුපළ සැලැස්මක් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදී. මේ අතර, 'කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - රත්මලාන සංවර්ධන ප්‍රධාන සැලැස්ම - 2030 වසර උදෙසා වන දැක්ම' (Colombo International Airport Ratmalana Master Plan-Way to 2030) යටතේ අතිරේක ගුවන් යානා නවත්වන කොටසක් සහිත නව ගුවන් යානා බැහැරුම් පථයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 වසරේ මාර්තු මාසයේ දී නිම කරන ලදී.

**ශ්‍රී ලංකන් ගුවන් සේවයෙහි මූල්‍ය කාර්යසාධනය සාපේක්ෂ වශයෙන් දුර්වල වූ අතර, සංචාරක කටයුතු සඳහා ගෝලීය වශයෙන් ඇති රුචිකත්වය ඉහළ යෑම පිළිබිඹු කරමින් ගුවන් සේවා කටයුතු තරමක් දුරට වර්ධනය විය.** තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 වසරේ දෙසැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් අලාභය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රුපියල් බිලියන 15.6ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව රුපියල් බිලියන 4.4කට සීමා විය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි ආදායම සියයට 222.9ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, මෙහෙයුම් වියදම සියයට 176.0කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ ඉන්ධන අර්බුදය මධ්‍යයේ ගුවන් යානා ඉන්ධන හිඟය උග්‍රවීම සහ ඊට සමගාමීව, සාමාන්‍ය පරිදි ගුවන් යානා සඳහා නැවත ඉන්ධන පිරවීමට ඉන්ධන නොමැති බවට සිවිල් ගුවන් සේවා අධිකාරිය ප්‍රකාශ කිරීමත් සමඟ, ගුවන් සමාගම් ආපසු ගුවන් ගමන් සඳහා ප්‍රමාණවත් තරම් ඉන්ධන රැගෙන යෑමට (Tankering) යොමු වීම සහ නැවත ඉන්ධන පිරවීම වෙනත් නැවතුම් හරහා සිදු කිරීමත් හේතුවෙන්, මෙහෙයුම් සම්බන්ධයෙන් අධික පිරිවැයක් දැරීමට සිදු විය. ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මූල්‍ය සංරෝධක මගින් රාජ්‍ය මූල්‍ය මත ඇති කරන පීඩනය සැලකිල්ලට ගනිමින්, පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා තෝරා ගැනීමට නියමිත ආයෝජකයින් වෙත ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි සහ එහි අනුබද්ධ සමාගම්වල සැලකිය යුතු කොටස් ප්‍රමාණයක් සහ කළමනාකාරීත්වය පැවරීම හරහා එම සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය ප්‍රධාන ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඒ අනුව, ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ස්ථාපිත රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය වෙත පවරා ඇත.

### වරාය සේවා

**ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ ආනයන සීමා මධ්‍යයේ ආනයන ඉල්ලුම පහළ යෑම මගින් 2022 වසර තුළ දී වරාය ක්‍රියාකාරකම්වලට අහිතකර බලපෑම් ඇති කළේය.** වසරේ පළමු කාර්තුව තුළ හිතකර කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, උග්‍ර ආර්ථික අර්බුදය මධ්‍යයේ වරාය මෙහෙයුම් පිළිබඳ ජාත්‍යන්තර විශ්වාසය දුර්වල වීම මෙන්ම ආනයන සීමා හේතුවෙන් දේශීය ආනයන පරිමා පහත වැටීමේ බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී වරාය කටයුතු සමස්තයක් ලෙස පහළ ගියේය. මේ අතර, මෙම වසර තුළ වරාය ක්‍රියාකාරකම් කෙරෙහි, ගෝලීය වෙළඳ පරිමා වර්ධනය පහළ යෑම ද හේතු වී ඇත. ඒ අනුව, සමස්ත බහලු මෙහෙයුම් සහ භාණ්ඩ මෙහෙයුම්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 5.3කින් සහ සියයට 8.2කින් පහළ ගොස් ඇති අතර, වසර අවසානයේ දී යම් වර්ධනයක් දක්නට ලැබුණ ද, 2022 වසරේ නැව් පැමිණීම් සංඛ්‍යාව වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.6කින් පහළ ගොස් ඇත. කොළඹ වරායේ සියලුම පර්යන්තයන් භාණ්ඩ මෙහෙයුම්

**3.10 රූප සටහන**
**බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්**





මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

සහ බහලු මෙහෙයුම් යන දෙඅංශයෙන්ම පහළ යෑම් වාර්තා කළේය. මෙහෙයවනු ලැබූ සමස්ත බහලු ධාරිතාව සඳහා කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය (කො.ජා.බ.ප.), ජයා බහලු පර්යන්තය, යුනිටි බහලු පර්යන්තය හා නැගෙනහිර බහලු පර්යන්තයේ පළමු තොටුපළ බැම්ම ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.), පිළිවෙළින්, සියයට 46.4ක, සියයට 28.1ක, සහ සියයට 25.5ක දායකත්වයක් දැක්වූ අතර, කොළඹ වරායේ මෙහෙයවනු ලැබූ බහලු ප්‍රතිනැව්ගත කිරීම් සඳහා දායකත්වය, පිළිවෙළින්, සියයට 45.3ක්, සියයට 28.6ක්, සහ සියයට 26.1ක් විය. අවම මට්ටමක පවතින දේශීය රථ වාහන මෙහෙයුම් සම්බන්ධ ක්‍රියාකාරකම් මධ්‍යයේ රථ වාහන ප්‍රතිනැව්ගත කිරීම් ඉහළ යෑම හේතුවෙන් 2022 වසර තුළ හම්බන්තොට වරායේ සමස්ත රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසර තුළ දී හම්බන්තොට වරාය තුළ හසුරවන ලද සමස්ත රථ වාහන සංඛ්‍යාව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.1ක වර්ධනයක් වාර්තා කරමින් 558,188ක් ලෙස වාර්තා විය. වසර තුළ දී, සමස්ත රථ වාහන මෙහෙයුම් සංඛ්‍යාවෙන් සියයට 99.8ක් වූ වාහන ප්‍රතිනැව්ගත කිරීම්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.8ක වර්ධනයක් වාර්තා කළ අතර, රථ වාහන ආනයන සීමා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් දේශීය අරමුණු සඳහා මෙහෙයවනු ලැබූ රථ වාහන සංඛ්‍යාව (එනම් ආනයනය කළ වාහන සංඛ්‍යාව) 1,137ක් පමණක් විය.

**වරාය යටිතල පහසුකම් සහ සේවා සංවර්ධනය** රටේ යටිතල පහසුකම් සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධාන ප්‍රමුඛතාවක්ව පවතී. ඒ අනුව, කොළඹ වරාය හා ප්‍රාදේශීය වරායන්වලට අදාළ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 2022 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. නැගෙනහිර බහලු පර්යන්තයෙහි දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු වසර තුළ සිදු වෙමින් පැවති අතර, 2022 වසර අවසානය වන විට කැණීම් සහ ගොඩකිරීම්වලට අදාළ කාර්යයන්වලින් සියයට 30ක් සම්පූර්ණ කර ඇත. මේ අතර, විදේශීය ආයෝජකයෙකු, දේශීය ආයෝජකයෙකු සහ ශ්‍රී ලං.ව.අ. අතර ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම (Build-Operate-Transfer) යන පදනම යටතේ වසර 35ක කාලයක් ආවරණය වන පරිදි කොළඹ වරායේ බටහිර පර්යන්තයේ සංවර්ධන කටයුතුවලට අදාළ ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව, එහි ඉදිකිරීම් කටයුතු 2022 වසරේ නොවැම්බර් මාසයේ දී ආරම්භ විය. නැගෙනහිර බහලු පර්යන්තය සහ බටහිර බහලු පර්යන්තය, පිළිවෙළින්, 2025 සහ 2027 වසර වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. පර්යන්ත ද්විත්වයෙහිම ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු, කොළඹ වරායේ ඇස්තමේන්තුගත වාර්ෂික ධාරිතාව අඩි විස්සේ බහලු ඒකක මිලියන 6කින් පමණ ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය කොළඹ වරායට එහි උපායමාර්ගික භූගෝලීය පිහිටීමෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි වරාය කර්මාන්තයේ අනාගත ඉල්ලුම සපුරාලීමට විශාල වශයෙන් සහාය සපයනු ඇත. තවද, උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන ශක්‍යතා අධ්‍යයනය සහ නව වරාය සන්නිවේදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික සැලසුම් සහ ශක්‍යතා අධ්‍යයනය ද 2022 වසරේ දී ක්‍රියාවට නැංවිණි. ජාත්‍යන්තර වාණිජ වරායක් ලෙස කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණ කිරීමේ කටයුතුවලට අමතරව, කන්කසන්තුරේ සහ

**3.11 රූප සටහන**
**වරාය ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

3

### 3.7 සංඛ්‍යා සටහන
### වරාය සේවා ක්‍රියාකාරිත්වය

| ශීර්ෂය | 2021 | 2022 (අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021 | 2022(අ) |
| 1. පැමිණි නැව් සංඛ්‍යාව | **4,180** | **4,073** | **-3.6** | **-2.6** |
| කොළඹ | 3,675 | 3,648 | -3.4 | -0.7 |
| ගාල්ල | 14 | 7 | -36.4 | -50.0 |
| ත්‍රිකුණාමලය | 117 | 95 | -13.3 | -18.8 |
| හම්බන්තොට | 374 | 323 | - | -13.6 |
| 2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | **109,369** | **100,376** | **6.3** | **-8.2** |
| කොළඹ | 103,824 | 96,170 | 6.3 | -7.4 |
| ද.ආ.පි.ප. | 24,062 | 22,731 | -3.3 | -5.5 |
| කො.ජා.බ.ප. | 42,400 | 41,717 | 13.6 | -1.6 |
| ශ්‍රී ලං.ව.අ. | 37,362 | 31,722 | 5.3 | -15.1 |
| ගාල්ල | 106 | 1 | -73.8 | -98.9 |
| ත්‍රිකුණාමලය | 3,190 | 2,089 | 3.8 | -34.5 |
| හම්බන්තොට | 2,249 | 2,116 | 28.5 | -5.9 |
| 3. බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ) | **7,249** | **6,862** | **5.8** | **-5.3** |
| ද.ආ.පි.ප. | 1,839 | 1,752 | -1.8 | -4.7 |
| කො.ජා.බ.ප. | 3,212 | 3,184 | 11.3 | -0.9 |
| ශ්‍රී ලං.ව.අ. | 2,198 | 1,926 | 4.8 | -12.4 |
| 4. බහලු ප්‍රතිනැව්ගත කිරීම් (TEUs '000) (ආ) (ඇ) | **6,050** | **5,832** | **4.9** | **-3.6** |
| ද.ආ.පි.ප. | 1,573 | 1,523 | -2.1 | -3.2 |
| කො.ජා.බ.ප. | 2,600 | 2,640 | 13.4 | 1.5 |
| ශ්‍රී ලං.ව.අ. | 1,877 | 1,670 | 0.6 | -11.1 |

(අ) තාවකාලික
(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක
(ඇ) නැවත ගබඩා කිරීම් ද ඇතුළත් ව

මූලයː ශ්‍රී ලංකා වරාය අධිකාරිය


දකුණු ඉන්දියාවේ පොන්ඩිචෙරි අතර යාත්‍රා සේවාවක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතියට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන්නේය. මෙහිදී, සැලසුම් කිරීම, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම (Design, Build Operate and Transfer) ගිවිසුමක් යටතේ මගී පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා වන පර්යේෂණ කටයුතු සහ යෝජනා සඳහා වන ඉල්ලීම (Request for Proposal) මෙම වසර තුළ ප්‍රගතියක් ලබා ඇත. මේ අතර, ආයෝජකයින් ලැයිස්තුගත කිරීම අවසන් කළ පසු ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යෝජනා සඳහා වන ඉල්ලීම සහ ව්‍යාපෘති ගිවිසුම සකස් කිරීම ද සිදු වෙමින් පැවතිණි.

**වරාය ක්‍රියාකාරකම් සමස්තයක් ලෙස පහළ ගියද, ප්‍රධාන වශයෙන් විනිමය අනුපාතික සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමෙහි සහාය සමඟ ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී ශ්‍රී ලං.ව.අ.යේ මූල්‍ය කාර්යසාධනය වර්ධනය විය.** 2022 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වරාය ගාස්තු ඉහළ නැංවීමද ආදායමේ ඉහළ යෑම සඳහා දායක විය. තවද, පර්යන්ත කළමනාකරණ පද්ධතියේ සහ ශ්‍රී ලං.ව.අ.හි පුහුණු ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, 2022 වසරේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දොඹකර ආශ්‍රිත ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවය මෙන්ම, කාල කළමනාකරණය පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, ශ්‍රී ලං.ව.අ.හි සමස්ත ආදායම රුපියල් බිලියන 68.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 50.5කින් ඉහළ ගිය අතර, මෙහෙයුම් වියදම රුපියල් බිලියන 43.7ක් දක්වා සියයට 33.0කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ දී රුපියල් බිලියන 25.6ක් වූ ශ්‍රී ලං.ව.අ.හි බදුවලට පෙර ලාභය, 2022 වසරේ දී රුපියල් බිලියන 57.0ක් ලෙස වාර්තා විය.

## පණිවුඩ හුවමාරු සේවා

**ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම මෙන්ම වසංගත කාලපරිච්ඡේදය තුළ ඉහළ ගිය සන්නිවේදන සේවා සඳහා ඉල්ලුම ක්‍රමයෙන් පහළ යෑම කිසියම් දුරකට හේතුකොටගෙන විදුලි සංදේශ අංශයේ කාර්යසාධනය 2022 වසරේ අග භාගය වන විට පහළ ගියේය.** බොහෝ දුරට වසංගතය ආරම්භයේ සිට රැකියා, අධ්‍යාපනය සහ අනෙකුත් දෛනික ක්‍රියාකාරකම් සඳහා අනුගමනය කරන ලද මංගත ක්‍රමවේද අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් 2022 වසරේ පළමු භාගය තුළ විදුලි සංදේශ අංශය ඉහළ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, පුද්ගල සංචරණ කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම සහ භෞතික වශයෙන් අධ්‍යාපන කටයුතු සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව, විදුලි සංදේශ ක්‍රියාකාරකම් 2022 වසරේ අවසාන කාලය වන විට පහළ ගියේය. මේ අතර, 2022 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී විදුලි සංදේශ අංශයේ කාර්යසාධනය පහළ යෑම සඳහා විදුලි සංදේශ ගාස්තු

### 3.12 රූප සටහන
### දුරකථන සහ අන්තර්ජාල ඝනත්වය





මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහළ යෑම කිසියම් දුරකට හේතු විය. 2022 වසරේ පළමු භාගයේ දී සියයට 6.3ක වර්ධනයක් වාර්තා වුවද, ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව සමස්තයක් ලෙස 2022 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 7.0කින් පහළ ගියේය. වසර තුළ දී, ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.7කින් පහළ ගිය අතර, ජංගම සහ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත් සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම සියයට 2.0කින් පහළ ගියේය. පුද්ගලයන් 100කට ග්‍රාහක සංඛ්‍යාව මනිනු ලබන ස්ථාවර සහ ජංගම දුරකථන ඝනත්වය, පිළිවෙළින්, 12.0ක් සහ 142.0ක් වූ අතර, 2022 වසර අවසන් වන විට අන්තර්ජාල ඝනත්වය පුද්ගලයන් 100කට 97.7ක් විය. කෙසේ වෙතත්, වසංගතය ආශ්‍රිත සංචරණ සීමා ඉවත් කිරීම හේතුවෙන් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ සිට පහළ යෑමක් පෙන්නුම් කළ සමස්ත දත්ත භාවිතය, 2022 වසරේ මාර්තු මාසයේ සිට ක්‍රමානුකූලව වැඩි වීමක් පෙන්නුම් කළේය. තවද, ඇඩි ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන අවහිරතා මධ්‍යයේ රැකියා සහ අධ්‍යාපන ක්‍රියාකාරකම් දුරස්ථ ක්‍රමවේද වෙත යොමු වීමත් සමඟ, 2022 වසරේ ජූලි මාසයේ දී අන්තර්ජාල දත්ත භාවිතයේ ක්ෂණික ඉහළ යෑමක් නිරීක්ෂණය විය.

**අපේක්ෂිත ඩිජිටල් ආර්ථික පරිවර්තනය සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 2022 වසර තුළ දී ඩිජිටල් යටිතල පහසුකම් පදනම වැඩිදියුණු කිරීම සඳහා රජය සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්ව ආයතන අඛණ්ඩව ක්‍රියා කළහ.** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 'ගමට සන්නිවේදනය'

**3.13 රූප සටහන**
**බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය**




මූලයන්: ඩයලොග් ඇක්සියාටා පොදු සීමිත සමාගම
ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම
මොබිටෙල් (පෞද්.) සමාගම
භාර්ති එයාර්ටෙල් ලංකා (පෞද්.) සමාගම

සටහන: පෙටාබයිට් 1 = ගිගාබයිට් මිලියන 1

**3.8 සංඛ්‍යා සටහන**
**විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2021 (අ) | 2022 (ආ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021(අ) | 2022(ආ) |
| ස්ථාවර දුරකථන සේවා ('000) | 2,852 | 2,651 | 9.1 | -7.0 |
| රැහැන් සහිත දුරකථන සංඛ්‍යාව | 1,264 | 1,263 | 1.5 | -0.1 |
| රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව | 1,587 | 1,388 | 16.1 | -12.5 |
| ජංගම දුරකථන සංඛ්‍යාව ('000) | 29,959 | 28,838 | 4.2 | -3.7 |
| අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව (ඇ) | 22,106 | 21,668 | 26.1 | -2.0 |
| ඝනත්වය (ඈ) | | | | |
| ස්ථාවර දුරකථන | 12.9 | 12.0 | 8.0 | -7.1 |
| ජංගම දුරකථන | 135.2 | 130.0 | 3.1 | -3.8 |
| අන්තර්ජාලය (ඇ) | 99.8 | 97.7 | 24.8 | -2.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඈ) පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව ලෙස අර්ථ දක්වේ.

මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3

ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ඩිජිටල් සේවාවන් වෙත බාධාවලින් තොර ප්‍රවේශයක් සහතික කිරීම උදෙසා, දීප ව්‍යාප්තව සිව්වන පරම්පරාවේ (4G) සම්බන්ධතා ආවරණය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. 2021-2024 දක්වා කාල සීමාව තුළ දිස්ත්‍රික්ක 10ක් පුරා සන්නිවේදන කුළුණු 276ක් පිහිටුවීම මූලික සැලැස්ම වුවද, ප්‍රධාන වශයෙන් ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මෙම ව්‍යාපෘතිය 2026 වසර වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2022 වසර අවසන් වන විට මෙම ව්‍යාපෘතිය යටතේ සන්නිවේදන කුළුණු 38ක් නිම කර ස්ථානගත කර ඇත. මීට අමතරව, 2023 වසර වන විට වාණිජ මට්ටමේ 5G ජාලයක් ස්ථාපිත කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අරමුණු කරයි. මේ අතර, 2022 වසරේ මාර්තු මාසයේ දී 2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත නීතිගත කිරීමත් සමග විස්තීර්ණ දත්ත ආරක්ෂණ නීති සම්පාදනය කළ පළමු දකුණු ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් විය. 2023 වසරේ දී දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමත් සමඟ මෙම පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් කාර්යක්ෂම අධීක්ෂණ හා නියාමන ක්‍රියාවලියක් හරහා මහජනතාවගේ තොරතුරු සුරක්ෂිත කිරීමට අපේක්ෂා කෙරේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් 'ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය' යටතේ රාජ්‍ය ආයතනවල සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ ක්ෂේත්‍රයේ තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා පියවර ගන්නා ලදී. මෙම වසර

තුළ, ලංකා රාජ්‍ය ජාලය 2.0, ලංකා රජයේ ක්ලවුඩ් 2.0, ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම, තාක්ෂණික ව්‍යාප්තකරණ වැඩසටහන, සහ ඩිජිටල්කරණය වූ ලංකාවක් සඳහා වන ධාරිතාව ඉහළ නැංවීම යන මහා පරිමාණ ව්‍යාපෘති ඇතුළුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ විෂය පථය යටතේ ව්‍යාපෘති 23ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මීට අමතරව, ජාතික උපාය මාර්ගය යටතේ ක්‍රියාත්මක කරන ලද තවත් ව්‍යාපෘති 17ක් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දෙන ලදී. තවද, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ තවත් ප්‍රමුඛ පෙළේ පෞද්ගලික අංශයේ විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සමාගම් දෙකක් එක්ව ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය ක්‍රියාවට නැංවීය. ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය හඳුන්වාදීම මගින් 2022 වසරේ දී ඛනිජ තෙල් බෙදා හැරීම හා සම්බන්ධ සමාජ ආතතීන් අවම කිරීමට හැකි වූ අතර, එමගින් මේ හා සමාන ක්‍රමවේද අනෙකුත් පොදු සේවාවන් සඳහා යොදා ගැනීම කෙරෙහි යම් පෙළඹවීමක් සැපයෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වසර තුළ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට විදුලි සංදේශ ගාස්තු ඉහළ නංවන ලදී. ඒ අනුව, අන්තර්ජාල, දුරකථන සහ මුදල් ගෙවා නරඹන රූපවාහිනී සේවා ගාස්තු සියයට 20කින් ඉහළ නංවන ලද අතර, එම සේවා පරිශීලක ගාස්තු නොවෙනස්ව පැවතුණි.


**2022 වසරේ දී සැපයුම් කටයුතුවලට බාධා වීම හේතුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මන්දගාමී විය.** දිවයින පුරා තැපැල් බෙදාහැරීමේ ප්‍රදේශ 8,157ක් ආවරණය වන පරිදි, ප්‍රධාන තැපැල් කාර්යාල 653ක්, උප තැපැල් කාර්යාල 3,342ක් සහ නියෝජිත තැපැල් කාර්යාල 140ක් හරහා තැපැල් සේවා සපයන ලදී. තවද, නව්‍ය සේවා ප්‍රවේශ හරහා තැපැල් දෙපාර්තමේන්තුව සිය සේවා සැපයීම අඛණ්ඩව වැඩිදියුණු කළ අතර, සමාජ මාධ්‍ය ක්‍රම හරහා එවැනි සේවා ප්‍රවර්ධනය කිරීම සහ මහජනතාව දැනුම්වත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව, 2020 වසරේ දී නැවත දියත් කරන ලද, 'ඇණවුම් ලැබුණු පසු මුදල් ගෙවීමේ සේවාව', මගින් 2021 වසරේ දී වාර්තා කරන ලද රුපියල් මිලියන 34.0ක ආදායමට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් මිලියන 269.0ක කැපී පෙනෙන ආදායමක් වාර්තා කළේය. වසර හතරකට වැඩි කාලයකට පසුව, දේශීය තැපැල් ගාස්තු 2022 වසරේ අගෝස්තු මාසයේ දී ඉහළ නංවන ලද අතර, තැපැල් සේවාවලට අදාළ සැපයුම් පිරිවැය ඉහළ යෑමට අනුකූල වන පරිදි විදේශීය තැපැල් ගාස්තු සංශෝධනය කරන ලදී. ඒ අනුව, දේශීය සාමාන්‍ය තැපැල් සේවාවට අදාළ අවම තැපැල් ගාස්තුව, සහ අවම ලියාපදිංචි ගාස්තු, පිළිවෙළින්, රුපියල් 35.00කින් සහ රුපියල් 30.00කින්, ඉහළ නැංවූ අතර නව ගාස්තු පිළිවෙළින්, රුපියල් 50.00ක් සහ රුපියල් 60.00ක් ලෙස සටහන් වේ. අනෙකුත් තැපැල් සේවා සඳහා අදාළ බොහෝ ගාස්තු ද වසර තුළ වැඩි කරන ලදී. මෙවැනි වෙනස්කම් සිදු කළද, තැපැල් දෙපාර්තමේන්තුවෙහි සමස්ත මූල්‍ය තත්ත්වය 2022 වසරේ දී දුර්වල මට්ටමක පැවතුණි. තැපැල් දෙපාර්තමේන්තුවෙහි තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ආදායම රුපියල් බිලියන 9.3ක් දක්වා සියයට 29.6කින් ඉහළ ගියද, මෙහෙයුම් වියදම් රුපියල් බිලියන 16.1ක් දක්වා සියයට 15.3කින් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී වාර්තා කරන ලද රුපියල් බිලියන 7.2ක අලාභයට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 7.0ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදී. තැපැල් දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා විධිමත් පරිදි තැපැල් ගාස්තු සංශෝධනය කිරීමට අමතරව, තැපැල් සේවයට අදාළව රටේ පාරිභෝගික අවශ්‍යතාවල වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, තැපැල් සේවා ස්වයංක්‍රීයකරණය කිරීම, මංගත සේවා පහසුකම් ලබා දීම, එක් තැපැල් ස්ථානයකින් තවත් තැපැල් ස්ථානයකට ලියුම් හුවමාරු වීම පරීක්ෂා කිරීම (point to point tracking), සේවා විවිධාංගීකරණය හරහා පික්-අප් සේවා (pick-up services යොදා ගැනීම ආදී නවීන තාක්ෂණික ක්‍රම, නව්‍ය ප්‍රවණතා සහ පාරිභෝගිකයන් මූලික කරගත් ප්‍රවේශ යොදා ගන්නා පුළුල් ක්‍රමවේදයක් තැපැල් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය වේ.

### ජල සම්පාදනය හා වාරිමාර්ග

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නල ජලය සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට ආරක්ෂිත සහ තිරසාර පදනමින් ජලය සැපයීම පිණිස වන සිය සේවා 2022 වසර තුළ දී පුළුල් කරන ලදී.** නව ජල සැපයුම් සම්බන්ධතා 153,217ක් ලබාදීමත් සමග මෙම වසර තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පාලනය කරන ලද සමස්ත ජල සැපයුම් සම්බන්ධතා ප්‍රමාණය මිලියන 2.9ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර අවසානයේ සියයට 94.4ක්ව පැවති ජනගහනයේ ආරක්ෂිත පානීය ජලය

සඳහා ප්‍රවේශය, 2022 වසරේ දී සියයට 96.0ක් දක්වා ඉහළ ගිය අතර, ගෘහ ඒකකවල නල ජල පහසුකම් ආවරණය සියයට 60.4ක් විය. තවද, රට තුළ ආදායම් නූපදවන ජල පරිභෝජනය, 2021 වසරේ දී පැවති සියයට 25.8ක සිට 2022 වසරේ දී සියයට 25.2ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මෙම වසර තුළ දී, මූල්‍යමය අවහිරතා සහ සාර්ව ආර්ථික ගැටලු හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සම්පාදන සංවර්ධන කටයුතුවලට බාධා සිදු වූ අතර, එමගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය. 2025 වන විට ශ්‍රී ලංකාවේ නල ජල පහසුකම් ආවරණය සියයට 79ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ප්‍රමුඛතම සංවර්ධන ව්‍යාපෘතිය වන 'සැමට ජලය' වැඩසටහන, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2022 වසරේ දී නවතා දමන ලදී. එම ව්‍යාපෘතිය වෙනුවට, දැනට පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමවල සැපයුම මෙන්ම බෙදාහැරීම පුළුල් කිරීම ඉහළ නැංවීමේ අරමුණින්, 'ජල සැපයුම වැඩි කිරීම සහ බෙදාහැරීම පුළුල් කිරීම' යන ව්‍යාපෘතිය මෙම වසර තුළ ආරම්භ කරන ලදී. මේ අතර, මාතලේ නගරය සහ ඒ අවට පවුල් 90,000කට සුරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දෙමින් 2017 වසරේ ආරම්භ කරන ලද විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය මෙම වසර තුළ දී නිම කරන ලද අතර, ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කොළඹ ජල සම්පාදන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිවල පළමු ව්‍යාපෘතිය ද 2022 වසරේ දී නිම කරන ලදී. මීට අමතරව අලව්ව, පොල්ගහවෙල, පොතුහැර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සහ මාතර ජල සම්පාදන ව්‍යාපෘතියෙහි

**3.14 රූප සටහන**
**ජල සැපයුම් තත්ත්වය**




මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

IV වන අදියර 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 93.1ක සහ සියයට 94.0ක භෞතික ප්‍රගතියක් ලබා ඇති අතර, මෙම ව්‍යාපෘති ද්විත්වයම 2023 වසරේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘති ද්විත්වය අවසන් වූ පසු එමගින් දකුණු සහ වයඹ පළාත්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක සුරක්ෂිත පානීය ජල පහසුකම් වැඩිදියුණු වනු ඇත. තවද, යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි, මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ප්‍රතිලාභීන් ලක්ෂ තුනකගේ ජල අවශ්‍යතාවය සපුරාලීම අරමුණු කරගත් ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය 2022 වසර අවසන් වන විට සියයට 71.4ක භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, තවත් ජල සම්පාදන ව්‍යාපෘති කිහිපයක් තාවකාලිකව අත්හිටුවන ලද අතර, මූල්‍යමය අවහිරතා මධ්‍යයේ 2022 වසර තුළ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කළ ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘති දහයක පමණ වැඩ කටයුතු නිම කිරීමට අපේක්ෂිත කාල සීමා දීර්ඝ කරන ලදී.

3

**වසර දහයකට වැඩි කාලයකට පසු, 2022 වසරේ දී ජල හා මළාපවහන ගාස්තු ඉහළ නැංවීම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි මූල්‍ය කාර්යසාධනය ශක්තිමත් කිරීමට උපකාරී විය.** රටෙහි ජල සම්පාදන සහ ජල යටිතල පහසුකම් නඩත්තු පිරිවැය ඉහළ යෑම සහ විධිමත් ලෙස ජල ගාස්තු සංශෝධන සිදු නොවීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දැරීමට සිදු වූ මූල්‍යමය අලාභ සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජල හා මළාපවහන ගාස්තු ඉහළ නැංවීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ගෘහස්ත කාණ්ඩය සඳහා වන පරිභෝජන ගාස්තු සියයට 70කින් පමණ ඉහළ දමමින්, සියලුම කාණ්ඩවල පාරිභෝගිකයන් සඳහා වන ස්ථර අනුව සිදු කෙරෙන ජල ගාස්තු ක්‍රමය සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. කෙසේ වෙතත්, පාසල්, ආගමික සහ පුණ්‍ය ආයතන සඳහා අදාළ වන ගාස්තු මෙන්ම, සමෘද්ධිලාභීන් ඇතුළුව අඩු ආදායම්ලාභී පාරිභෝගිකයින්ට අදාළ වන ජල ගාස්තු බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. තවද, නව ජල සබඳතා සඳහා අය කරනු ලබන ගාස්තු ද 2022 වසරේ ඔක්තෝබර් 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නංවන ලදී. මෙම ගාස්තු සංශෝධන වල බලපෑම් කිසියම් දුරකට හේතුකොටගෙන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි මෙහෙයුම් අලාභය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 3.1ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 1.2ක් දක්වා අඩු විය. මහජනතාවගේ දිගු කාලීන සෞඛ්‍යය

**3.9 සංඛ්‍යා සටහන**

**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය**

| ශීර්ෂය | 2021 | 2022(අ) | වර්ධන අනුපාතය % | |
|---|---|---|---|---|
| | | | 2021 | 2022(අ) |
| මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම ගණන (ආ) | 337 | 339 | 1.8 | 0.6 |
| වසර තුළ දී සපයන ලද නව ජල සම්බන්ධතා ගණන | 192,087 | 153,217 | 56.5 | -20.2 |
| සපයා ඇති මුළු ජල සම්බන්ධතා ගණන (ආ) | 2,752,324 | 2,905,541 | 7.5 | 5.6 |
| මුළු ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන) | 815 | 818 | 4.2 | 0.4 |
| ආදායම් නුපදවන ජලය (ප්‍රතිශතය) | | | | |
| කොළඹ නගරය | 34.8 | 24.1 | -11.4 | -30.6 |
| සමස්ත දිවයින | 25.8 | 25.2 | 4.8 | -2.3 |
| පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) | 94.3 | 96.0 | 1.2 | 1.8 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඇ) | 54.2 | 60.4 | 2.1 | 11.4 |

(අ) තාවකාලික

මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

(ආ) වසර අවසානයේ දී

(ඇ) අනෙකුත් බලයලත් ආයතන මගින් කළමනාකරණය කරනු ලබන පද්ධති ද ඇතුළත්ව

සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම වෙනුවෙන් රටේ ජල සම්පාදන හා සනීපාරක්ෂක පද්ධතියේ තිරසාර බව සහතික කිරීම සඳහා සැලසුම් ගත කාල පරාස තුළ ජල ගාස්තු සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික හා දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා වාරිමාර්ග ව්‍යාපෘති නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග 2022 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** මෙම වසර තුළ, සමස්ත පිරිවැය රුපියල් බිලියන 3.8ක් වැය කරමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති 19කට අදාළ කටයුතු පවත්වාගෙන යන ලදී. ඉන් රුපියල් බිලියන 2.0ක් උමා ඔය පහළ ගංගාධාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති අතර, යාන් ඔය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 616.3ක් වැය කර ඇත. උමා ඔය පහළ ගංගාධාර සංවර්ධන ව්‍යාපෘතිය 2022 වසර අවසන් වන විට සියයට 74.1ක භෞතික ප්‍රගතියක් ලබා තිබුණි. පවුල් 250,000ක් පමණ සඳහා ප්‍රතිලාභ ලබාදීමට සියලුම දිස්ත්‍රික්කවල වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම හා ධාරිතාව වැඩි කිරීම හරහා වාරි ජලය සැපයිය හැකි භූමි ප්‍රමාණය ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් වන 'වාරි සෞභාග්‍යා ජාතික වැඩසටහන', ක්‍රියාත්මක වුණු අතර, ඒ සඳහා වසර තුළ දී වැය කළ පිරිවැය රුපියල් බිලියන 1.1ක් පමණ වේ. මෙම වැඩසටහන යටතේ මූලික සැලැස්මට අනුව ප්‍රතිසංස්කරණය කිරීමට සලකා බලන ලද වැව්/අමුණු 739න්, 2022 වසර අවසන් වන විට වැව් 598ක් ප්‍රතිසංස්කරණය කර අවසන් කරන ලදී. තවද, පේරමඩුව ජලාශ ව්‍යාපෘතිය සහ පදවිය හා වාහල්කඩ යෝජනා ක්‍රමවල ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළු මධ්‍ය පරිමාණ වාරි ව්‍යාපෘති කිහිපයක භෞතික කාර්යයන් සම්බන්ධ කටයුතු 2022 වසරේ දී ආරම්භ කරන ලදී. මේ අතර, රටේ වාරිමාර්ග යෝජනා ක්‍රම 80ක ඉඩම්, ජලය සහ භෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වාරි පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, 2017 වසරේ දී ආරම්භ කරන ලද 'ඵලදායිතාව නැංවීම සහ වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය,' සීමිත අයවැය ප්‍රතිපාදන මධ්‍යයේ මන්දගාමීව වුවද, අඛණ්ඩව ක්‍රියාත්මක විය.

## 3.3. සමාජ යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

### සෞඛ්‍ය

**2022 වසර තුළ උද්ගත වූ අභියෝගාත්මක තත්ත්වයන් සමඟ රටේ සෞඛ්‍ය සේවා සැපයුම අඛණ්ඩව බලපෑමට ලක් විය.** 2022 වසරේ පළමු කාර්තුවේ දී කොවිඩ්-19 රෝගීන් වාර්තා වීමේ යම් වැඩිවීමක් දක්නට ලැබුණ ද, වසරේ දෙවන භාගය වන විට රෝග ව්‍යාප්තවීමේ අවදානම ක්‍රමයෙන් පහව ගියේය. 2021 වසර අවසානයේ දී ඔමික්‍රෝන් ප්‍රභේදයේ ව්‍යාප්තියත් සමඟ, 2022 වසරේ අප්‍රේල් මාසය අවසානය දක්වා කාල සීමාව තුළ කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාවේ අඛණ්ඩ ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, 2022 වසරේ ජූලි මාසයෙන් අනතුරුව වාර්තා වන කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ ගියේය. ඉන් අනතුරුව, ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන සහ ප්‍රතිශක්තිකරණයට වඩාත් ප්‍රතිරෝධී වන ඔමික්‍රෝන් BA.5 උප ප්‍රභේදය ව්‍යාප්ත වීම 2022 වසරේ ජූලි මාසයේ මැද කාලය තුළ වඩාත් තීව්‍ර වූ නමුත්, පසුව 2022 වසරේ අවසානයේ දී වෛරසයේ ව්‍යාප්තිය පහළ ගියේය. සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව, 2023 වසරේ මාර්තු මාසය මැද වන විට, කොවිඩ්-19 රෝගීන් 672,048ක් වාර්තා වූ අතර, මරණ සංඛ්‍යාව 16,831ක් විය. කලාපයේ අනෙකුත් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව සහ මරණ සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවති අතර, එමගින් වෛරස් ව්‍යාප්තිය පාලනය කිරීමේදී සහ නිවාරණ උපාය මාර්ග වලට අදාළව ශ්‍රී ලංකාව අත්කරගෙන ඇති සාර්ථකත්වය පිළිබිඹු කරයි. දිවයින පුරා එන්නත් කිරීමේ ක්‍රියාවලිය සීඝ්‍රයෙන් සිදු කිරීම හා සමගාමීව සංචරණ කටයුතු සීමා කිරීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ

**3.10 සංඛ්‍යා සටහන**
**සෞඛ්‍ය සේවයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2021 (අ) | 2022 (ආ) |
|---|---|---|
| 1. රාජ්‍ය අංශය | | |
| රෝහල් සංඛ්‍යාව (බටහිර වෛද්‍ය සේවය) | 618 | 617 |
| ඇඳන් සංඛ්‍යාව | 78,228 | 78,228 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | 542 | 544 |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව | 20,209 | 21,045 |
| සහකාර වෛද්‍යවරුන් සංඛ්‍යාව | 648 | 642 |
| හෙද සේවක සංඛ්‍යාව | 39,091 | 40,775 |
| උපස්ථායක සංඛ්‍යාව | 8,334 | 8,310 |
| 2. ආයුර්වේද | | |
| රෝහල් සංඛ්‍යාව | 118 | 119 |
| ඇඳන් සංඛ්‍යාව | 5,444 | 5,345 |
| සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව | 1,806 | 2,303 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව (ඇ) | 26,183 | 26,650 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍යවරුන්


මූලයන්: සෞඛ්‍ය අමාත්‍යාංශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ක්‍රියාමාර්ග වෛරසය ව්‍යාප්තිය බොහෝ දුරට පාලනය කිරීමට උපකාරී විය. 2023 වසරේ මාර්තු මාසයේ මැද භාගය වන විට, වයස අවුරුදු 12ට වැඩි ජනගහනයෙන් සියයට 97.1ක ප්‍රමාණයකට අවම වශයෙන් එක් එන්නත් මාත්‍රාවක් ලබා දීම සම්පූර්ණ කරමින් ජාතික එන්නත්කරණ වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාවට නංවා ඇති අතර, එන්නත් මාත්‍රා දෙකක මූලික අවශ්‍යතාව සම්පූර්ණ කළ ප්‍රතිශතය සියයට 83.6ක් විය. මූලික එන්නත් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති ජනගහනයෙන්, සියයට 55.7ක් පළමු වර්ධක මාත්‍රාව ලබාගෙන ඇති අතර, 2023 වසරේ මාර්තු මාසය මැද භාගය වන විට පළමු වර්ධක මාත්‍රාව සම්පූර්ණ කර ඇති පුද්ගලයින් අතරින් සියයට 2.5ක් දෙවන වර්ධක මාත්‍රාව ලබා ගෙන ඇත. සාමාන්‍ය ජනතාව එන්නත්කරණය කිරීමට පෙර, වැඩිහිටි ජනගහනය සහ ප්‍රතිශක්තිය අඩු පුද්ගලයින්හට ප්‍රමුඛත්වය ලබා දෙමින්, ෆයිසර් එන්නතෙහි දෙවන වර්ධක මාත්‍රාව ලබා දීම 2022 වසරේ මැයි මාසයේ දී අදියර වශයෙන් ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, දෙවන වර්ධක මාත්‍රාව සඳහා මහජනතාවගේ රුචිකත්වය අඩු වීම කිසියම් දුරකට පෙන්නුම් කරමින්, දෙවන මාත්‍රාව ලබා දීමේ ප්‍රගතිය 2022 වසර අවසානය වන විට පහළ මට්ටමක පැවතුණි. සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් තුළින් කොවිඩ්-19 වසංගතය සාර්ථකව පාලනය කළ ද, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ දුර්වලතා මගින් ඇති කළ වෛද්‍ය සැපයුම් සහ ඖෂධ හිඟතාව හේතුවෙන් දැනටමත් අස්ථාවර මට්ටමක පවතින සෞඛ්‍ය සේවා පද්ධතිය තුළ, ඉදිරි කාලයේ දී එවැනි හදිසි සෞඛ්‍ය අවදානමක් පැන නැගුණහොත් එය සෞඛ්‍ය පද්ධතිය මත ඉහළ පීඩනයක් ඇති කරනු ඇත. සෞඛ්‍ය අංශයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ස්වයංක්‍රීය කිරීම කරන අතරතුර, රටේ සෞඛ්‍ය පද්ධතියෙහි ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, සෞඛ්‍ය යටිතල පහසුකම් අංශය තුළ කෙරෙන රාජ්‍ය ආයෝජනවලට අමතරව, පෞද්ගලික අංශයේ ආයෝජනද ප්‍රවර්ධනය කිරීම හරහා බාහිර කම්පන සඳහා සෞඛ්‍ය පද්ධතියේ සූදානම ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

**2022 වසරේ දී, රට තුළ අනෙකුත් බෝවන රෝග ව්‍යාප්ත වීමත් සමඟ, සෞඛ්‍ය සේවා පද්ධතිය පීඩාවට පත් විය.** ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, පසුගිය වසරේ වාර්තා වූ 35,924ක සිට 76,689ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2021 වසරේ දී 28ක් වූ ඩෙංගු මරණ සංඛ්‍යාව 2022 වසරේ දී 72ක් දක්වා ඉහළ ගියේය. අධික ජන ඝනත්වය හේතුවෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානම සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත. 2022 වසරේ දී ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ඉහළ යෑම සඳහා පළිබෝධනාශක සහ ඉන්ධන හිඟය හේතුවෙන් ඩෙංගු රෝගය වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුර්වලතා බොහෝ දුරට හේතු විය. එවැනි පළිබෝධනාශක සහ ඉන්ධන හිඟයන් දීර්ඝ කාලයක් පුරා පැවතීම 2023 වසරේ මුල් භාගයේ දී ඩෙංගු රෝගය ආසාදනය වීම් ඉහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවතීමට හේතු විය හැක. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මහජන සෞඛ්‍ය ගැටලුවක් වන බරවා රෝගය ශ්‍රී ලංකාවෙන් තුරන් කර ඇති බව 2016 වසරේ දී සහතික කර ඇතත්, 2022 වසරේ දී බරවා රෝගීන් 73ක් පමණ වාර්තා වී ඇත. රටේ බරවා පාලන වැඩසටහන පශ්චාත් නිරීක්ෂණ මට්ටමේ පවතින අතර, 2030 වසර වන විට මෙම රෝගය ව්‍යාප්ත වීම සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට ඉලක්ක කර ඇත. 2022 වසරේ දී වාර්තා වූ මී උණ රෝගීන් සංඛ්‍යාව, 2021 වසරේ දී වාර්තා වූ රෝගීන් 6,946ට සාපේක්ෂව 6,970ක් වූ අතර, වැඩිම ආසාදිතයන් පිරිසක් රත්නපුර, කෑගල්ල, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2016 වසරේ දී ශ්‍රී ලංකාව මැලේරියාවෙන් තොර රටක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණ ද, කොවිඩ්-19 ආශ්‍රිත සීමා ලිහිල් කිරීමෙන් පසු දේශසීමා හරහා සංචරණ කටයුතු ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ රටවලදී මැලේරියා රෝගය ආසාදනය වී මෙරටට පැමිණි රෝගීන් සංඛ්‍යාව 2021 වසරේ දී වාර්තා වූ රෝගීන් 26 දෙනාට සාපේක්ෂව 2022 වසරේ දී

3

**3.15 රූප සටහන**
**වාර්ෂික ඩෙංගු රෝගීන් සහ මරණ**




මූලය: සෞඛ්‍ය අමාත්‍යාංශය

3

37ක් වූ අතර, එමගින් රට තුළ මැලේරියාව නැවත ඉස්මතු වීමේ අවදානමක් නිර්මාණය කර ඇත.

**තීව්‍ර වූ සමාජ ආර්ථික ගැටලු මධ්‍යයේ, බෝ නොවන රෝගවලට අදාළ රෝග හා සම්බන්ධ අභියෝගවලට සෞඛ්‍ය අංශය අඛණ්ඩව මුහුණ දුන්නේය.** සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පුරුදු, ව්‍යායාම නොමැතිකම, දුම්පානය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය සහ මානසික සෞඛ්‍ය පිරිහීම වැනි අහිතකර ජීවන රටා හේතුවෙන් පසුගිය වසර කිහිපය මුළුල්ලේ රට තුළ බෝ නොවන රෝග අඛණ්ඩව ඉහළ ගියේය. බෝ නොවන රෝග වැළැක්වීම, රෝග විනිශ්චය, පාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම ප්‍රවර්ධනය කිරීමෙහි, සෞඛ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව නිරත විය. ඒ අනුව, 'ශ්‍රී ලංකාව තුළ නිදන්ගත බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය හා උපායමාර්ගික සැලැස්ම' සංශෝධනය කර මහජන අදහස් විමසීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද අතර, ඉලක්කගත සැලසුම්කරණය සහ සේවා සම්බන්ධීකරණය හරහා අනතුරු සිදු වීම වැළැක්වීම සඳහා උපායමාර්ගික නායකත්වය සැපයීමට '2021-2025 සඳහා වන අනතුරු වැළැක්වීම සහ කළමනාකරණය පිළිබඳ බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම' 2022 වසරේ දී දියත් කරන ලදී. විශේෂයෙන් ම තරුණ ජනගහනය ඉලක්ක කර ගනිමින් බෝ නොවන රෝග ඇතිවීමේ අවදානම අවම කිරීමේ අරමුණින් ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධන වැඩසටහන් සහ සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. තවද, පිළිකාව කල් ඇතිව හඳුනා ගැනීම සහ වැළැක්වීම ඇතුළුව ප්‍රාථමික මට්ටමින් පිළියම් කර පාලනය කිරීමේ ක්‍රියාකාරකම්වල සෞඛ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව නිරත විය. ඒ අනුව, රත්නපුර ශික්ෂණ රෝහලේ, පිළිකා කල්තියා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයක් වසර තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. කෙසේ වෙතත්, රට තුළ වෛද්‍ය සහ ඖෂධ සැපයුම් හිඟවීම මධ්‍යයේ, බෝ නොවන රෝග වැළඳෙන රෝගීන් සඳහා අඛණ්ඩව ප්‍රතිකාර සැපයීම අභියෝගාත්මක වන බව පෙනී ගොස් ඇති අතර, එමගින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි විෂමාකාර බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් ඇත. මෙවැනි පසුබිමක් තුළ, හදිසි සෞඛ්‍ය තත්ත්වයන්වලට අවශ්‍ය කෙරෙන වුවමනාවන් සඳහා ප්‍රමුඛතාව ලබා දීම සහ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි වෙන් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින අතර, ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය සැපයුම් දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම මෙන්ම, රටෙහි පුරවැසියන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය කළ යුතු වේ.

**සෞඛ්‍ය සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කරගත් යටිතල පහසුකම් සංවර්ධන සහ සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාව ඉහළ නැංවීමේ වැඩසටහන් කිහිපයක් 2022 වසරේ දී ක්‍රියාත්මක විය.** ඒ අනුව, 'ප්‍රාථමික සෞඛ්‍ය සේවා සත්කාර සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය' යටතේ ලෝක බැංකුව විසින් ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක හරහා ගුණාත්මක සේවා සැපයීම සඳහා ලබා දුන් අරමුදල් යොදා ගනිමින් රෝහල් පහක ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් සංවර්ධනය කර ශක්තිමත් කරන ලදී. 2022 වසරේ දී කළුතර සහ අම්පාර දිස්ත්‍රික් මහ රෝහල් ඇතුළු තෝරාගත් රෝහල්වල හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර සේවා ස්ථාපිත කිරීම සිදු විය. තවද, රත්නපුර, කරාපිටිය සහ මොණරාගල වැනි රජයේ රෝහල්වල හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීමේ විවිධ ව්‍යාපෘති ද ක්‍රියාත්මක විය. ඊට අමතරව, ආඝාත රෝගය නිවාරණය (stroke care) සඳහා ජාතික මධ්‍යස්ථානයක් ලෙස මුල්ලේරියාව මූලික රෝහලේ ජාතික ආදර්ශකරණ පුහුණු මධ්‍යස්ථානයක් (simulation centre) ඉදිකිරීම 2022 වසරේ දී සිදු විය. මේ අතර, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම ඉලක්ක කරගත් වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක විය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉහළ නිපුණතා සහිත වෘත්තිකයන්ගේ හිඟය සැලකිල්ලට ගනිමින්, අතුරු ප්‍රතිපත්තියක් ලෙස, වෛද්‍ය උපදේශකවරුන්, රජයේ වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා විශ්‍රාම යන වයස, 2022 වසරේ දෙසැම්බර් මාසයේ 12 වන දින සිට

**විශේෂ සටහන 5**

**ආර්ථික අර්බුදය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය තුරන් කරලීම**

**හැඳින්වීම**


2022 වසරේ ආර්ථික අර්බුදය හමුවේ උග්‍ර වූ සමාජ ආර්ථික ගැටලු ගණනාවක් හේතුවෙන් කුටුම්භවල ආහාර අනාරක්ෂිතතා ඉහළ යෑම මධ්‍යයේ, ළමයින් අතර ඉහළ යමින් පවතින මන්දපෝෂණය, සැලකිල්ලක් යොමු විය යුතු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලුවක් බවට පත්ව ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, පෝෂණය ලබාගැනීමේ දී පවතින ඌනතාවන් හෝ අධි පෝෂණ මට්ටම්, අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථයන්ගේ අසමතුලිතතාවන් හෝ දුර්වල පෝෂණ තත්ත්වයන් මන්දපෝෂණය (malnutrition) යන්නෙන් හඳුන්වයි. මන්දපෝෂණයෙහි ප්‍රධාන ද්විත්ව ගැටලු වන්නේ ඌන පෝෂණය (under nutrition) සහ අධි පෝෂණයයි (over nutrition). උසට සරිලන බරක් නොමැති වීම (කෘෂවීම), වයසට සරිලන උසක් නොතිබීම (මිටිබව), වයසට සරිලන බරක් නොතිබීම (අඩු බර) සහ ක්ෂුද්‍ර පෝෂක ඌනතාවය යන ආකාරයෙන් ඌන පෝෂණය ඇතිවිය හැක. අධි පෝෂණය, මිනිස් සිරුරේ අසාමාන්‍ය හෝ අධික ලෙස මේදය තැන්පත් වීමෙන් ඇතිවන සෞඛ්‍ය අවදානමක් වන අතර, එය අධිබර හා අවසානයේ ස්ථූලතාව වැනි ගැටලු වලට හේතු විය හැක. ජනගහනය අතර පවතින මන්දපෝෂණය මානව ප්‍රාග්ධනයේ ඵලදායීතාව මත ඇති කරන සෘජු බලපෑම සහ මානව ප්‍රාග්ධන වර්ධනය මත පරම්පරා වශයෙන් ඇති කරන දිගු කාලීන බලපෑම හේතුවෙන්, ආර්ථික වර්ධනය පසුගාමී කරවන සාධකයක් ලෙස එය හඳුනාගෙන ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය මගින් 2013 වසරේ ප්‍රකාශයට පත් කරන ලද ආහාර සහ කෘෂිකර්මාන්ත අංශයේ තත්ත්වය පිළිබඳ වාර්තාවට (The State of Food and Agriculture) අනුව, මන්දපෝෂණය මගින් ගෝලීය ආර්ථිකය මත ඇති කරන සමාජ ආර්ථික බලපෑම වාර්ෂිකව එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 3.5ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, එම අගය පුද්ගලයෙකු සඳහා ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් 500කට සමාන වේ. ආර්ථික වර්ධනය තුළ මානව ප්‍රාග්ධනයට හිමිවන වැදගත් භූමිකාව සැලකිල්ලට ගෙන මන්දපෝෂණ ගැටලුව පිළිබඳ සැලකිය යුතු ගෝලීය අවධානයක් යොමු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලොව පුරා පවතින මන්දපෝෂණ ගැටලු වළක්වාලීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාවට නංවා ඇත. ශ්‍රී ලංකාව, සිය ප්‍රථම ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 1986 වසරේ දී ක්‍රියාවට නංවන ලද අතර, මන්දපෝෂණය අවම කිරීමට සහ ජනතාවගේ පෝෂණ මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා පෝෂණ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළේය. මානව සංවර්ධන දර්ශක, ඉහළ මට්ටමක් ළඟා කරගෙන තිබුණ ද, රට තුළ පවතින පෝෂණ වැඩසටහන්වල දුර්වලතා සහ දිගු කාලීනව පවතින අදායම් විෂමතාවන් ඉස්මතු කරමින්, ළමා මන්දපෝෂණය දුරලීමෙහි ලා පසුගිය දශක ගණනාවක් තුළ මෙරට අත්කරගෙන ඇති ප්‍රගතිය මන්දගාමී මට්ටමක පවතී. මෙවැනි පසුබිමක් තුළ, ජනතාව මේ වන විටත් මුහුණ දෙමින් සිටින ආහාර සුරක්ෂිතතාව හා පෝෂණයට අදාළ විෂමතාවන්, වසංගතය හේතුවෙන් සහ ඉන් අනතුරුව උත්සන්න වුණු ආර්ථික අර්බුදය මගින් ඇතිකළ ආහාර මිල ගණන් ඉහළ යෑම, බලශක්ති අර්බුදය මගින් ඇතිකළ සැපයුම් දාමයේ අවහිරතා, ආහාර ද්‍රව්‍යවල පැවති හිඟයන්, ජීවනෝපායයන් අහිමිවීම සහ වැය කළ හැකි අදායම සංකෝචනය වීම යනාදී බලපෑම් මගින් තවදුරටත් උග්‍ර කර ඇත.

**2022 වසරේ ආර්ථික අර්බුදයට පෙර ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය**

නිදහසෙන් පසු කාලය තුළ, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, සමාජ ආරක්ෂණ ජාල, යනාදී විවිධ මැදිහත්වීම් හරහා පුරවැසියන්ගේ සමාජ ආර්ථික යහපැවැත්ම නංවාලීමට ශ්‍රී ලංකාව පියවර රැසක් ගෙන ඇත. මෙම පියවර අතරට, පාසල් සඳහා ආහාර වේල් සැපයීම, ගර්භණී සහ කිරිදෙන මව්වරුන් හට ආහාර/මුදල් ආධාර ලබාදීම, ත්‍රිපෝෂ වැඩසටහන, පාසල් සඳහා ජල, සනීපාරක්ෂාව හා සෞඛ්‍ය වැඩසටහන් මෙන්ම, අයඩීන් ලුණු භාවිතය ප්‍රවර්ධන කිරීම වැනි වැඩසටහන් ඇතුළත් වේ. දශක ගණනාවක් පුරා ක්‍රියාවට නැංවුණු මෙම ප්‍රයත්නයන්ගේ සහ කැපවීම්වල ප්‍රතිඵලයක් ලෙස, 1975 වසරේ සිට 1995 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ ළමයින් අතර මන්දපෝෂණය කැපී පෙනෙන ලෙස පහළ වැටිණි. ඒ අනුව, වයස අවුරුදු පහට අඩු ළමුන් අතර වයසට සරිලන උස නොමැති දරුවන් ප්‍රතිශතය 1975 වසරේ දී වාර්තා වූ සියයට 49.9ක සිට 1995 වසර වනවිට සියයට 26.1ක් දක්වා පහළ ගොස් ඇති අතර, අඩු බර ළමා ජනගහන ප්‍රතිශතය 1975 වසරේ වාර්තා වූ සියයට 57.3ක සිට 1995 වසරේ දී සියයට 29.3ක් දක්වා අඩු විය. කෙසේවෙතත්, පසුගිය දශක කිහිපය තුළ මන්දපෝෂණය තුරන් කිරීමෙහි ප්‍රගතිය මන්දගාමී වී ඇත. 2016 නවතම ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණයෙන් පිළිබිඹු වන පරිදි, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර උසට සරිලන බර නොමැති දරුවන්ගේ ප්‍රතිශතය, සියයට 15.1ක මට්ටමේ පවතින අතර, එය දරුවන් අතර උසට සරිලන බර නොමැති ප්‍රතිශතයට අදාළව ජාත්‍යන්තර ලෙස පිළිගත් ඉහළ අවදානම් සීමාවක් වෙත ළඟා වීමකි. එසේම, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර උසට සරිලන බර නොමැති දරුවන්ගේ ප්‍රතිශතය 1995/96 වසර සිට 2016 දක්වා කාලය තුළ සමීක්ෂණ සිදුවන අවස්ථාවලදී සැලකියයුතු ප්‍රගතියක් පෙන්වා නැත. ලෝක බැංකු සංඛ්‍යා ලේඛන වලට අනුව, අවුරුදු පහට අඩු දරුවන් අතර උසට සරිලන බර නොමැති දරුවන් ප්‍රතිශතය සැලකීමේ දී, ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපය තුළ වඩාත් බලපෑමට ලක්වූ රටවල් අතර දෙවන ස්ථානයට පත්ව ඇත. තවද, මෙම කාණ්ඩය තුළ අඩු බර ළමුන් ප්‍රතිශතය, 2000 වසරේ සිට සියයට 20.0ක් ආසන්නයේ පවතින අතර, වයසට සරිලන උස නොමැති ළමුන් ප්‍රතිශතයෙහි ද සැලකියයුතු ප්‍රගතියක් වාර්තා වී නොමැත.

3

**රූප සටහන වි.ස. 5.1**
**ළමා මන්දපෝෂණ තත්ත්වය (වයස අවුරුදු 5ට අඩු දරුවන්) (1975-2016)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ අතර, රටෙහි ප්‍රාදේශීය වශයෙන් සහ ආර්ථික අංශ අතර පවතින මන්දපෝෂණ තත්ත්වයේ විෂමතා මගින් පෙන්නුම් කෙරෙන්නේ, පෝෂණ විෂමතා දිගු කාලයක් මුළුල්ලේ නොවිසිඳී පවතින බවයි. නේවාසික අංශ සැලකීමේදී, අවුරුදු පහට අඩු ළමුන් අතර වයසට සරිලන උස අඩු බව සහ අඩු බර දර්ශකවලට අදාළ ඉහළම ප්‍රතිශත වාර්තා කරමින්, වතු අංශය වඩාත් අවදානමට ලක් විය හැකි අංශය බවට පත්ව ඇත. 2016 වසරේ ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණයට අනුව, නාගරික අංශයේ සියයට 14.7කට සහ ග්‍රාමීය අංශයේ සියයට 17.0කට සාපේක්ෂව වයස අවුරුදු පහට අඩු ළමුන්ගෙන් වයසට සරිලන උසක් නොමැති ප්‍රතිශතය වතු අංශයෙහි සියයට 31.7ක් පමණ වේ. තව ද, වතු අංශයේ වෙසෙන වයස අවුරුදු පහට අඩු දරුවන්ගෙන් සියයට 29.7ක් අඩු බර සහිත දරුවන් වේ. දිස්ත්‍රික්ක අතර සැලකුවිට, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර වයසට සරිලන උස නොමැතිවීමේ සහ අඩු බරට අදාළ ඉහළ ම ප්‍රතිශතයන් නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. පෝෂණයට අදාළව ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතා සඳහා මූලික වශයෙන් ආර්ථික සුරක්ෂිතතාව, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් සඳහා ඇති ප්‍රවේශය, ප්‍රදේශ අතර සබඳතා සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සමාජ ආර්ථික සාධක හේතුවේ. උදාහරණයක් ලෙස මවගේ අධ්‍යාපනික මට්ටම ළමයින්ගේ පෝෂණ මට්ටම කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, උපාධි හෝ ඉන් ඉහළ මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිත මව්වරුන් කාණ්ඩය තුළ උපදින දරුවන් අතර, පිළිවෙළින්, සියයට 12.1ක් හා සියයට 10.0ක් ලෙස වාර්තා වී ඇති වයසට සරිලන උස නොමැති දරුවන්ගේ ප්‍රතිශතය සහ අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය හා සැසඳීමේ දී, විධිමත් අධ්‍යාපනයක් නොලත් මව්වරුන්ට උපදින දරුවන් අතර, මෙම ප්‍රතිශත, පිළිවෙළින්, සියයට 37.6ක් හා සියයට 33.9ක් ලෙස සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී. 2019 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය පදනම්ව ගණනය කරන ලද ශ්‍රී ලංකාවේ ළමයින් සඳහා වූ බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් වයස අවුරුදු 0-4 අතර ළමයින්ගෙන් තුනෙන් එකක් බහුමාන වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන අතර, ඔවුන් අඩු බර හෝ වයසට සරිලන උස නොමැති වීම යන මන්දපෝෂණ ගැටලු වලින් පීඩා විඳින බව පෙන්නුම් කරයි. මේ අතර, 2022 තිරසාර සංවර්ධන වාර්තාවට (Sustainable Development Report 2022) (Sachs. J et al. 2022) අනුව, අපේක්ෂිත සහශ්‍ර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට ප්‍රමාණවත් වන පරිදි ප්‍රගතියක් නොපෙන්වන කුසගින්නට අදාළ දර්ශක මගින් පිළිබිඹු වන අයුරින්, 2030 වසර වනවිට කුසගින්න සම්පූර්ණයෙන්ම තුරන් කරලීමේ ඉලක්කය කරා ළඟාකර ගැනීමට ශ්‍රී ලංකාව පෙන්නුම් කරන ප්‍රගතිය මන්දගාමී මට්ටමක පසු වේ.

**ළමුන්ගේ පෝෂණ මට්ටම් කෙරෙහි වර්තමාන ආර්ථික අර්බුදයෙන් ඇති බලපෑම**

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් ප්‍රකාශිත මන්දපෝෂණයට අදාළ සංකල්පමය රාමුවට[1] අනුව, මන්ද පෝෂණය සඳහා ප්‍රධාන හේතුවක් ලෙස ආර්ථික සාධක හඳුනාගෙන ඇති අතර, මෙම ආර්ථික සාධක මගින් ජනතාවගේ පෝෂණ මට්ටම් කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැක. ව්‍යසනකාරී ආර්ථික තත්ත්වයන් මගින්, විශේෂයෙන් ම සැපයුම් මාර්ග සහ ආහාර සැපයුම් පද්ධති මෙන්ම, ජනතාවගේ ආදායම් මාර්ග මත අවහිරතා ඇති කිරීම හරහා පෝෂණීය ආහාර සඳහා කුටුම්භවලට ඇති ප්‍රවේශය මෙන්ම, මිලදී ගැනීමේ හැකියාව මත බලපෑම් කරමින් ජනතාවගේ පෝෂණ යහ පැවැත්මට සෘජු බලපෑම් ඇති කරයි. ආර්ථික කම්පන මගින් බොහෝ අවස්ථාවලදී අවදානමට ලක්විය හැකි ජන කොටස් කැලරි අධික, නමුත් පෝෂණයෙන් අඩු ආහාර වෙත ප්‍රමුඛත්වය දීමට පොළඹවන අතර, එය පුද්ගලයන්ගේ ආහාර වේලෙහි ගුණාත්මකභාවය පිරිහීමට තුඩු දෙන බැවින් එහි අවසාන ප්‍රතිඵලයක් ලෙස මන්දපෝෂණය ඉහළ යෑමක් සිදුවේ.

ශ්‍රී ලංකාව, දැනට වාර්තාගත ස්වකීය දරුණුතම ආර්ථික අවපාතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස උත්සන්න වූ සාර්ව ආර්ථික අස්ථායිතා මගින් ඇති වූ පෙර නොවූ විරූ මෙන්ම, පුළුල් වූ සමාජ හා ආර්ථික බලපෑම් නිර්මාණය වූ ආකාරය නිදර්ශනය කරන අතර, එම බලපෑම් අතුරින් ජනගහනයේ පෝෂණ යහපැවැත්මෙහි පිරිහීම, විශේෂයෙන් ම පරම්පරා ගණනාවකට බලපෑම් ඇති කෙරෙන ළමා මන්දපෝෂණය ඉහළ යෑම, බරපතල ගැටලුවක්ව පවතී. පොහොර හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ආහාර සැපයුමෙහි පහළ යෑම හා සමගාමීව ආර්ථික අර්බුදය නිසා සැපයුම් දාමයේ ඇතිවූ අවහිරතා සහ පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආහාර මිල ගණන් 2021 වසරේ

1 මන්දපෝෂණය ඇති වීමේ ආසන්නතම හේතු වන්නේ පෝෂණය අඩු ආහාර ගැනීම (ප්‍රමාණය හා ගුණත්වය), කායිකව ක්‍රියාකාරකම්වල නොයෙදීම හා රෝග තත්ත්වයන් වන අතර, කුටුම්භවල ආහාර අනාරක්ෂිතතාව, ළමුන් හා කාන්තාවන් සඳහා ප්‍රමාණවත් නොවන සැලකිල්ල, ප්‍රශස්ත නොවන මට්ටමේ සෞඛ්‍ය සේවාවන් සහ උදාසීන ජීවන රටා සහ හැසිරීම් යනාදිය මන්දපෝෂණය සඳහා බලපාන මූලික හේතු වේ. මන්දපෝෂණය සඳහා හේතුවන පදනම් සාධක වන්නේ සමාජ-සංස්කෘතික, ආර්ථික හා දේශපාලන මෙන්ම දේශගුණික විචලතාවන්ය. මෙම සාධක ආහාර සඳහා වන ප්‍රවේශය මෙන්ම මිල දී ගැනීමේ හැකියාව මත බලපෑම් ඇති කළ හැක.

**සංඛ්‍යා සටහන වි.ස. 5.1**
**ළමා මන්දපෝෂණ තත්ත්වය පිළිබඳ මෑත කාලීන දත්ත**

| දර්ශකය | වයස අවු: 05ට අඩු ළමුන්ගේ ප්‍රතිශතය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| අඩු බර | 15.6 | 14.5 | 14.3 | 14.0 | 13.1 | 12.2 | 15.3 |
| වයසට සරිලන උස නොමැතිවීම | 9.2 | 9.0 | 8.9 | 8.4 | 8.2 | 7.4 | 9.2 |
| උසට සරිලන බර නොමැතිවීම | 11.3 | 11.1 | 10.2 | 9.9 | 8.6 | 8.2 | 10.1 |
| අධි බර | 0.5 | 0.5 | 0.6 | 0.6 | 0.8 | 0.8 | 0.6 |


මූලය: පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

අවසාන කාලපරිච්ඡේදයේ සිට ඉහළ යෑමට පටන් ගත් අතර, ආහාර උද්ධමනය, 2020 වසර අවසානයේ පැවති සියයට 9.2ට සහ 2021 වසර අවසානයේ පැවති සියයට 22.1ට සාපේක්ෂව, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටම වන සියයට 94.9ක් දක්වා ළඟාවිය. 2022 වසර අග කාලයේ දී ආහාර උද්ධමනයෙහි යම් පහළ යෑමක් දක්නට ලැබුණ ද, 2022 වසර තුළ ආහාර මිල ගණන් සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි. උද්ධමනයෙහි ඉහළ යෑම කුටුම්භ වල මූර්ත ආදායම සැලකිය යුතු ලෙස පිරිහීමට හේතු වූ අතර, අර්බුදය හේතුවෙන්, විශේෂයෙන් ම අවිධිමත් අංශයේ ජීවනෝපායයන් අහිමිවීම හරහා කුටුම්භ මත ඇති පීඩනය උග්‍ර විය. සමස්ත සේවා නියුක්තියෙන් සියයට 58.4ක ප්‍රතිශතයක් අවිධිමත් අංශයේ සේවා නියුක්තිවීම සහ ජනගහනයෙන් සියයට 14.3ක් දරිද්‍රතා මට්ටමට පහළින් පසුවෙන වාතාවරණයක් තුළ, ජීවනෝපායයන්, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ මට්ටම් කෙරෙහි ආර්ථික අර්බුදය මගින් ඇති කළ හැකි බලපෑම සැලකිය යුතු මට්ටමක පවතී. ඒ අනුව, අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ කුටුම්භ වලට එම අභියෝගයන්ට මුහුණදීම සඳහා විකල්ප උපායමාර්ග අනුගමනය කිරීමට සිදුව ඇත.

පරිගණක ආධාරක දුරකථන සම්මුඛ පරීක්ෂණ (Computer Assisted Telephone Interviewing) පදනම්වූ දත්ත රැස් කිරීමේ ප්‍රවේශය හරහා පළාත් නවයම ආවරණය වන පරිදි සිදුකළ සමීක්ෂණ 2,137කින් සමන්විත, ලෝක ආහාර සංවිධානයේ දුරස්ථ කුටුම්භ ආහාර සුරක්ෂිතතා සමීක්ෂණයට අනුව, 2022 වසර අවසානය වනවිට රටේ ආහාර සුරක්ෂිතතාව අවදානම් සහගත මට්ටමක පැවති අතර, ජනගහනයෙන් සියයට 68.0ක් පමණ ආහාර ගන්නා ප්‍රමාණය අඩු කිරීම, ආහාර වේල් ගණන අඩු කිරීම සහ අඩු රුචිකත්වයක් දක්වන ආහාර මත යැපීම වැනි විකල්ප ආහාර උපායමාර්ග වෙත යොමු වී තිබුණි. මේ අතර, ජනගහනයෙන් සියයට 40ක් පමණ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා වූ වියදම් කපා හැරීම වැනි ක්‍රියාමාර්ග හරහා ජීවනෝපාය මත පදනම් විකල්ප උපාය මාර්ග වෙත යොමු වී ඇති අතර, එය අවසානයේ දී දිගු කාලීන වශයෙන් පෝෂණ මට්ටම් සහ යහපැවැත්ම පිරිහීම කෙරෙහි හේතුවිය හැක. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් "පෝෂණ මාසය" සංකල්පය යටතේ 2022 ඔක්තෝබර් මාසයේ දී අවුරුදු පහට අඩු දරුවන්ගේ පෝෂණ මට්ටම පිළිබඳව සිදු කරන ලද නවතම නිල සමීක්ෂණය මගින් ආර්ථිකයේ අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ කුටුම්භ වල යහපැවත්මෙහි සිදු වූ පරිහානිය පිළිබිඹු කරමින් ළමුන්ගේ පෝෂණ මට්ටම් 2022 වසර තුළ දී පිරිහීමකට ලක්ව ඇති බව අනාවරණය කරයි. මෙම අධ්‍යයනයෙහි ප්‍රතිඵල අනුව ළමුන් සඳහා අදාළ වන සියලුම ප්‍රධාන පෝෂණ තත්ත්ව දර්ශකයන්, විශේෂයෙන් ම අවුරුදු පහට අඩු දරුවන් අතර වයසට සරිලන උස නොමැතිවීම, උසට සරිලන බර නොමැතිවීම සහ අඩු බර යන දර්ශක වල තවදුරටත් අයහපත් වීමක් පෙන්නුම් කරයි. ජාතික මට්ටමෙන් සැලකූ විට, අවුරුදු පහට අඩු ළමුන් අතර අඩු බර ළමුන්ගේ ප්‍රතිශතය 2021 වසරේ වාර්තා වූ සියයට 12.2ක සිට 2022 වසර වනවිට සියයට 15.3ක් දක්වා ඉහළ ගොස් ඇත. අවුරුදු පහට අඩු ළමුන් අතර වයසට සරිලන උස නොමැති සහ උසට සරිලන බර නොමැති ප්‍රතිශත, පිළිවෙළින්, 2021 වසරේ වාර්තා වූ සියයට 7.4ක සහ සියයට 8.2ක සිට 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 9.2ක් සහ සියයට 10.1ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ළමුන් අතර පවත්නා අධි බර තත්ත්වයෙහි යම් යහපත් වර්ධනයක් 2022 වසරේ දී පෙන්නුම් කරයි.

ඉහත සමීක්ෂණයට අනුව, රට පුරා පවතින ළමා පෝෂණ විෂමතා තවදුරටත් තීව්‍ර කරමින් බොහෝ දිස්ත්‍රික්කවල ළමා මන්දපෝෂණ තත්ත්වය අයහපත් ලෙස වර්ධනය වී ඇත. ළමුන් අතර වයසට සරිලන උස නොමැති ළමුන්ගේ වැඩිම ප්‍රතිශතය වන සියයට 22.8 නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර, එහි අඩුම ප්‍රතිශතය වන සියයට 5.1 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තවද, අවුරුදු පහට අඩු ළමුන් අතර ඉහළ ම අඩු බර ළමුන් ප්‍රතිශතය වන සියයට 23.9 නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර, අඩු බර ළමුන්ගේ අඩුම ප්‍රතිශතය වන සියයට 9.8 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. රජයේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තිබුණ ද රට තුළ පෝෂණ විෂමතා අඛණ්ඩව පවතින බව මින් පිළිබිඹු වන අතර, මෙම විෂමතා මැඩලීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් නොගතහොත් ආර්ථික අර්බුදය මධ්‍යයේ මෙම විෂමතාවන් තවදුරටත් උග්‍ර වනු ඇත.

**රූප සටහන වි.ස. 5.2**
**දිස්ත්‍රික්ක මට්ටමේ අයහපත් වන ළමා මන්දපෝෂණ තත්ත්වය**




මූලය: පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

## රජයේ ප්‍රතිචාර

ආර්ථික සහ ආහාර අර්බුදය මගින් ජනගහනයේ පෝෂණ මට්ටම් මත ඇති කරන අහිතකර බලපෑම් මැඩ පවත්වා ගැනීමට සහ මන්දපෝෂණ තත්ත්වයන් තවදුරටත් පිරිහීම වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2022-2024 සඳහා වූ හදිසි පෝෂණ සැලසුමක් සකස් කරන ලදී. මෙම සැලැස්ම මගින් ආහාර සුලබතාවයෙහි හා මිල දී ගැනීමේ හැකියාවෙහි පවතින විෂමතා, අවදානමට ලක්විය හැකි ප්‍රජාව සඳහා වූ සෞඛ්‍ය පද්ධති සේවාවන්ගේ දුර්වලතා සහ පෝෂණ ගැටලු වළක්වාලීම සඳහා වූ සන්නිවේදන හා බලගැන්වීමේ ක්‍රියාවලියේ දුර්වලතා යන තීරණාත්මක ගැටලු සඳහා විසඳුම් ලබාදීම ඉලක්ක කරයි. ඒ අනුව, සියලුම පාර්ශ්වකරුවන්, හඳුනාගත් උපායමාර්ග සහ ප්‍රධාන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ වන අතර ම, ක්‍රියාවට නැංවීමේ සෑම අදියරයක දී එහි ප්‍රගතිය අධීක්ෂණය කෙරේ. මේ අතර, අඩු ආදායම්ලාභී පවුල්වල ගර්භණී මවුවරුන් සහ කිරිදෙන මවුවරුන්, කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන පවුල්, අවුරුදු පහට අඩු දරුවන් මෙන්ම, මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි ප්‍රජාව ඉලක්ක කරමින්, ජාත්‍යන්තර ආයතනවල ද සහාය ඇතිව රජය විසින් මූල්‍ය ආධාර වැඩසටහන් ගණනාවක් ක්‍රියාවට නංවන ලදී. මෙම වැඩසටහන් මගින් කුටුම්භවල ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම ඉලක්ක කරන අතර, පාසල් ආහාර වැඩසටහන් හරහා පාසල් ළමුන්ට සමබර ආහාර වේලක් ලබා දීමට ද කටයුතු කර ඇත. මේ අතර, පවුල් සෞඛ්‍ය කාර්යාංශය හරහා අනෙකුත් සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යන අතර, උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් සඳහා ආහාරමය පෝෂණ අතිරේක ලබාදීම ද අඛණ්ඩව සිදු කෙරිණි.

### ළමා මන්දපෝෂණය තුරන් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය

මේ දක්වා බලයට පැමිණි රජයයන් විසින් මන්දපෝෂණය දුරලීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, හදිසි සමාජ ආර්ථික කම්පන සඳහා ඔරොත්තු දීමට ප්‍රමාණවත් නොවේ. බහු ආංශික රාමුවක් තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ මන්දපෝෂණය තුරන්කරලීම ඉලක්ක කරගත් උපායමාර්ග නැවත සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව එමගින් අවධාරණය කරයි. ඒ සම්බන්ධව දැනට ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන්වල පවතින දුර්වලතා සඳහා විසඳුම් යොදමින්, කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් විසඳුම් සපයන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අවශ්‍ය වේ. සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාත්මක කිරීම සහ දැනට ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ වැඩසටහන් පුළුල් කිරීම වැනි කෙටි කාලීන විසඳුම් මගින් ආහාර මිල ගණන් ඉහළ යෑමෙන් ආදායමට වන බලපෑම් සඳහා විසඳුම් ලබාදීම කළ යුතු අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම සුබසාධන වැඩසටහන් ක්‍රමවත්ව ඉලක්කකරණය කිරීම සහ අවදානම් තත්ත්වයෙන් බැහැර වූ ප්‍රතිලාභීන් සුභසාධන වැඩසටහන් වලින් විධිමත්ව ඉවත්කිරීමේ ප්‍රවේශයක් තහවුරු කිරීම අවශ්‍ය වේ. රජයේ මූලිකත්වයෙන් සිදු කෙරෙන පෝෂණ මැදිහත්වීම් සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම හමුවේ, අවදානමට ලක්විය හැකි අංශ මුහුණ දී සිටින කුසගින්න අවම කිරීම සඳහා කෙටි කාලීන විසඳුම් ලෙස ආධාර සපයන නියෝජිතායතන සහ මිත්‍ර රටවලින් ආහාර ආධාර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කිරීම ඉතා තීරණාත්මක වන අතර, එවැනි වැඩසටහන් වල අධීක්ෂණය සහ ඇගයීම් පරදෘශ්‍යභාවයකින් සිදු කළ යුතුව ඇත. 'ප්‍රජා මුළුතැන්ගෙය' වැනි ප්‍රජා පදනම් වැඩසටහන් මගින් ඌන පෝෂණයට හේතුවන බොහෝ ගැටලු සඳහා විසඳුම් සැපයීමට පොදු වේදිකාවක් නිර්මාණය කරනු ලබන හෙයින්, එවැනි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම වඩාත් ප්‍රතිලාභදායක වේ. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් දක්වා ඇති මාතෘ සහ ළමා පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා වූ පද්ධති ප්‍රවේශය අනුව, ළමා මන්දපෝෂණය දුරලීම සඳහා වූ දිගු කාලීන උපාය මාර්ග, ප්‍රධාන වශයෙන් ආහාර සැපයුම් පද්ධතිය, සෞඛ්‍ය පද්ධතිය, ජල හා සනීපාරක්ෂක පද්ධතිය, අධ්‍යාපන පද්ධතිය සහ සමාජ ආරක්ෂණ පද්ධතිය යන පද්ධති මත පදනම් විය යුතු වේ. ඒ අනුව, පෝෂණීය සහ සුරක්ෂිත ආහාර සඳහා තිරසාර ප්‍රවේශය තහවුරු කෙරෙන ආහාර සැපයුම් පද්ධති වෙනුවෙන් කෙරෙන ප්‍රතිසංස්කරණ හා ආයෝජන ඉතා වැදගත් වන අතර, පවුල් සඳහා වඩාත් පෝෂණීය ආහාර තෝරා ගැනීම සඳහා අවස්ථා ලබා දිය යුතු වේ. මේ සම්බන්ධව දැරීමට හැකි මිලක් යටතේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා

ගැනීම තහවුරු කිරීම සඳහා රටේ ආහාර පද්ධතියෙහි සැලකිය යුතු පරිවර්තනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. නවෝත්පාදන සහ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ඉහළ නැංවීම හා සමගාමීව කෘෂි අංශයේ ඵලදායීතාව ඉහළ නැංවීම, පසු අස්වනු හානිය අවම කිරීම, කෘෂි අංශයේ එකතුකළ අගය ඉහළ නැංවීම, ආහාර පද්ධති වල ආනයන රැඳියාව අඩු කිරීම, කාලගුණයට ඔරොත්තුදෙන ආහාර භෝග හඳුන්වා දීම, විශේෂයෙන් ම සමෝධානික ගොවිතැන ප්‍රචලිත කිරීම හරහා පෝෂණ ගුණයෙන් පිරිපුන්, පුළුල් පරාසයක ආහාර ප්‍රභේද ප්‍රවර්ධනය, කෘෂි අංශයේ සහනාධාර සහ බදු ප්‍රතිතුලනය කිරීම සහ කෘෂි ආර්ථික පරිචයන් වැඩිදියුණු කිරීම මෙන්ම, හදිසි ආහාර අර්බුද තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් පරිදි ආහාර ස්වාරක්ෂක තොගයක් පවත්වාගෙන යෑම යනාදිය මේ යටතට ඇතුළත් වේ.

මහජනතාව අතර හිතකර පෝෂණ පිළිවෙත් දියුණු කිරීමට දායක වීමට අමතරව, මන්දපෝෂණය වැළැක්වීමේ සහ එයට ප්‍රතිකාර කිරීම සඳහා වූ සෞඛ්‍ය අංශයේ භූමිකාව ඉටු කිරීමට හැකි වන පරිදි සෞඛ්‍ය අංශය වැඩි දියුණු කළ යුතු වේ. ඊට අදාළව, මූලික සෞඛ්‍ය සහ පෝෂණ සේවාවන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් එම අංශ වෙත කෙරෙන නව ආයෝජන දිරිමත් කිරීම අත්‍යවශ්‍ය වන අතර, වඩාත් අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා මූලික පෝෂණ පැකේජ හඳුන්වාදීම කළයුතු වේ. තවද, අධ්‍යාපනික මට්ටම සහ මන්දපෝෂණය අතර පවතින දැඩි ප්‍රතිලෝම සම්බන්ධතාව සැලකීමේ දී, විශේෂයෙන් ම, අවදානමට ලක්විය හැකි ජන කොටස් ඉලක්ක කරමින් අධ්‍යාපනය මත ආයෝජන සිදු කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් ම, කාන්තාවන්ගේ අධ්‍යාපනය ඉලක්ක කරගත් ආයෝජන, ළමයින්ගේ පෝෂණ මට්ටම තීරණය කිරීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරන අතර, අධ්‍යාපනය තුළින් කාන්තාවන් සඳහා නිර්මාණය වන ආදායම් ඉඩ ප්‍රස්ථා කුටුම්භ වල පෝෂණ අවදානම් මඟ හරවා ගැනීමට උපකාරී වේ.

ආර්ථික අර්බුදය මධ්‍යයේ ළමා මන්දපෝෂණයට අදාළව අලුතින් නිර්මාණය වී ඇති අවදානම්වල පුළුල් හා දිගු කාලීන බලපෑම් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය තුරන් කරලීම සඳහා කෙටි හා මධ්‍ය කාලයේ සිට දිගු කාලය දක්වා දිවෙන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින් කටයුතු කළ යුතුවේ. ඒ අනුව, ළමුන්ගේ පෝෂණ තත්ත්වයන් නංවාලීම සඳහා ප්‍රතිපත්ති තීරණ ක්‍රියාවට නැංවීමේදී, රටේ සමස්ත ජනතාවගේ සහයෝගය මෙන්ම විශේෂයෙන් ම රජය, සෞඛ්‍ය පද්ධතිය, අහාර සැපයුම් පද්ධතියේ සහභාගීවන්නන් ඇතුළු ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමුහික සහ මනාව සම්බන්ධීකරණය වූ ප්‍රයත්නයන් ඉතා වැදගත් වේ. මෙවැනි සාමුහික ප්‍රයත්නයන් හරහා පෝෂණයට අදාළ ක්‍රමෝපායන් සැකසීමේදී පර්ශ්වකරුවන් අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම, දැනට පවතින පෝෂණ වැඩසටහන් වල ධාරිතාව ශක්තිමත් කිරීම, සහ එවැනි ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සිදු කළ හැකි අතර, පෝෂණය සඳහා ළමුන්ට ඇති අයිතිය සුරක්ෂිත කරලීම සඳහා දත්ත කේන්ද්‍රීය කරගත් සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සහතික කළ හැක.


මූලාශ්‍ර

1. Department of Census and Statistics (2016) Demographic and Health Survey Report [Online]. Available at: http://www.statistics.gov.lk/ (Accessed: 10 Feb 2023)
2. Family Health Bureau, Ministry of Health (2022) Nutritional Month Report [Online]. Available at: https://www.fhb.health.gov.lk/ (Accessed: 08 Feb 2023)
3. Food and Agriculture Organization of the United Nations (2013) The State of Food and Agriculture [Online]. Available at: https://www.fao.org/ (Accessed: 10 Feb 2023)
4. Jayawardena, P.(2020) A Proactive Path to Combat Malnutrition in Sri Lanka[Online]. Available at: https://www.ips.lk/ (Accessed: 15 Feb 2023)
5. Sachs, J. Lafortune, G. Kroll, C. Fuller, G. and Woelm, F. (2022) Sustainable Development Report 2022. From Crisis to Sustainable Development: the SDGs as Roadmap to 2030 and beyond [Online]. Available at: https://dashboards.sdgindex.org (Accessed: 10 Feb 2023)
6. United Nations Children's Fund (2020) Nutrition for Every Child. UNICEF Nutrition Strategy 2020-2030 [Online]. Available at: https://www.unicef.org/ (Accessed: 25 Feb 2023)
7. Weerahewa, J. (2018) Food Policies and Nutrition Transition in Sri Lanka: Historical Trends, Political regimes, and options for Interventions [Online]. Available at https://www.researchgate.net/ (Accessed: 19 Feb 2023)
8. World Food Programme (2022) Sri Lanka Food Security Monitoring - Remote Household Food Security Survey [Online]. Available at: https://reliefweb.int/ (Accessed: 01 Mar 2023)
9. World Health Organization (2016) Strategic Action Plan to reduce the double burden of malnutrition in the South-East Asia Region 2016–2025 [Online]. Available at: https://www.who.int/ (Accessed: 22 Feb 2023)


ක්‍රියාත්මක වන පරිදි, තවත් වසරකින් දීර්ඝ කරන ලද අතර, එම ප්‍රතිපත්තිමය තීරණයෙහි වලංගුභාවය 2023 වසරේ දෙසැම්බර් මාසයේ 31 වන දින දක්වා පවතී. මීට අමතරව, සෞඛ්‍ය අංශ සේවකයන් ඇතුළු රාජ්‍ය සේවකයන්ට විදේශ රැකියා සඳහා වසර පහක වැටුප් රහිත නිවාඩුවක් ලබා ගැනීමට අවසර ලබා දීමට රජය තීරණය කළේය. කෙසේ වෙතත්, ආර්ථික අර්බුදය මධ්‍යයේ සෞඛ්‍ය අංශයේ ඉහළ නිපුණතා සහිත පිරිස් රටින් පිටට සංක්‍රමණය වීමේ ප්‍රවණතාව ඉහළ යෑම හේතුවෙන් ඉදිරි කාලසීමාව තුළ මහජන සෞඛ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් එය දැඩි බලපෑම් ඇති කළ හැකි අතර, එමගින් ඉහළ නිපුණත්වයක් සහිත වෛද්‍ය වෘත්තිකයන් සහ විශේෂඥයින් රට තුළ රඳවා ගැනීමට ඉතා ඉක්මන් ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක් ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කෙරෙයි.

**ශ්‍රී ලංකාවේ රෝග වැළැක්වීම සහ රෝග නිවාරණ යන දෙඅංශයෙහිම සෞඛ්‍ය සේවා සැපයීමට අදාළව පෞද්ගලික අංශය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.** 2022 වසර අවසන් වන විට සමස්ත ඇඳන් සංඛ්‍යාව 5,602කින් සමන්විත ලියාපදිංචි පෞද්ගලික රෝහල් සංඛ්‍යාව 250ක් වූ අතර, වසර තුළ දී නව පූර්ණ කාලීන පෞද්ගලික සත්කාරක

ආයතන/බෙහෙත් ශාලා/වෛද්‍ය සායන හයක් ස්ථාපිත කරන ලදී. කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීමෙහිලා රජය විසින් දරන ප්‍රයත්නයට සමගාමීව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන 25ක් සහ කොවිඩ්-19 ප්‍රතිකාර මධ්‍යස්ථාන තුනක් පෞද්ගලික රෝහල් විසින් ක්‍රියාත්මක කරන ලද අතර, 2022 වසරේ දී පී.සී.ආර් පරීක්ෂණ සහ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණ සිදුකිරීමට පුද්ගලික රසායනාගාර 13කට බලය පවරන ලදී. වෛද්‍ය සැපයුම් හිඟතාව මධ්‍යයේ රජයේ රෝහල් මගින් සපයනු ලබන විධිමත් සෞඛ්‍ය සේවාවල සීමාවන් සැලකිල්ලට ගනිමින්, 2022 වසර තුළ ජනතාවගෙන් බහුතර පිරිසක් පෞද්ගලික රෝහල්වලින් සපයනු ලබන සේවා වෙත යොමු විය. කෙසේ වෙතත්, වෛද්‍ය සැපයුම්, ඖෂධ, රසායනාගාර පරීක්ෂණ සහ උපදේශන ගාස්තු ඉහළ යෑමත් සමඟ පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් නියාමනය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයේ දුර්වලතා පිළිබිඹු කරමින්, මෙම පෞද්ගලික වෛද්‍ය සේවාවන්හි ගාස්තු අය කිරීම් විශාල ලෙස ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික සෞඛ්‍ය සේවා වෙත යොමු වන පුද්ගලයන්, විශේෂයෙන් ම මැදි ආදායම්ලාභීන්, එම පහසුකම් ලබා ගැනීමෙන් ඉවත් වීම වසර තුළ දී නිරීක්ෂණය විය. මෙම පසුබිම තුළ, සැමට සාධාරණ සෞඛ්‍ය ප්‍රවේශයක් සහතික කිරීම සඳහා, බොහෝ දුරට අවදානමට ලක් විය හැකි ජන කණ්ඩායම් සඳහා වූ රජයේ සෞඛ්‍ය සේවා ප්‍රතිලාභ වෙත බලපෑමක් නොමැතිව රජයේ සෞඛ්‍ය සේවා සැපයුමට අනුපූරකයක් ලෙස පෞද්ගලික සෞඛ්‍ය සේවා අංශය පුළුල් කිරීම සඳහා එම අංශය නියාමනය ශක්තිමත් කිරීම සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් සම්බන්ධ ප්‍රතීතන සහතික විධිමත් කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති අත්‍යවශ්‍ය වේ.

### අධ්‍යාපනය

**අධ්‍යාපන පද්ධතිය කෙරෙහි බලශක්ති අර්බුදය හේතුවෙන් ඇති වූ අවහිරතා මෙන්ම කොවිඩ්-19 මගින් ඇති වූ බාධා අවම වීමත් සමඟ 2022 වසරේ දෙවන භාගයේ දී අධ්‍යාපන ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය.** කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ සිට පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන මධ්‍යස්ථාන වරින්වර වසා දැමීමෙන් අනතුරුව, 2022 වසර ආරම්භයේ දී අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කළ ද, දේශීය ඉන්ධන සැපයුම්වල දැඩි හිඟතාව සමඟ ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ දෙවන කාර්තුවේ මුල් භාගයේ දී අධ්‍යාපන ක්‍රියාකාරකම් නැවත වරක් අඩාල විය. දිවයින පුරා දක්නට ලැබුණු ප්‍රවාහන දුෂ්කරතා මධ්‍යයේ, 2022 වසරේ ජූනි මාසය මැද භාගයේ දී අධ්‍යයන කටයුතු මංගත ක්‍රමවේද වෙතට යොමු කෙරිණි. කෙසේ වෙතත්, වසර තුළ දී විදුලිය වරින්වර කප්පාදු කිරීම් හේතුවෙන් මෙම මංගත අධ්‍යාපනික ක්‍රමවේදයන්ට ද අහිතකර බලපෑම් ඇති විය. ඉන්ධන සැපයුමට අදාළ ගැටලුවලට යම් විසඳුම් ලබා දීමත් සමඟ අධ්‍යාපනික ක්‍රියාකාරකම් 2022 වසරේ දෙවන භාගය වන විට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වූ අතර, 2022 වසරේ අගෝස්තු මාසයේ සිට අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කිරීමට හැකි විය. වසර තුළ දී අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි සිදු කිරීම පූර්ණ වශයෙන් නැවත ආරම්භ වුව ද, 2020 වසරේ සිට අධ්‍යයන කටයුතුවලට වරින්වර ඇති වූ බාධා හේතුවෙන් නිර්මාණය වූ ඉගෙනුම් අවස්ථා අහිමිවීමේ බලපෑම අඛණ්ඩව පවතී. අධ්‍යාපන යටිතල පහසුකම් සහ තාක්ෂණය ආශ්‍රිත යටිතල පහසුකම් සම්බන්ධයෙන් දැනටමත් පවතින විෂමතා සැලකිල්ලට ගැනීමේදී, මෙවැනි අවහිරතා මගින් අධ්‍යාපනික ප්‍රතිඵල සම්බන්ධයෙන් දිගු කාලීන අහිතකර බලපෑම් ඇති කිරීමට හැකියාව ඇති අතර, එය විවිධ ආර්ථික හා සමාජීය මට්ටම්වල සහ භූගෝලීය ප්‍රදේශ අනුව ළමුන් අතර අධ්‍යාපනික ප්‍රතිඵලවල විෂමතා පුළුල් වීමට හේතු විය හැකිය. ශ්‍රී ලංකාවේ 3වන ශ්‍රේණියේ ළමුන්ගේ භාෂා සාක්ෂරතාව හා ගණිතයට අදාළ මූලික කුසලතා මට්ටම් ඇගයීම සඳහා 2021-2022 කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කළ අධ්‍යනයකට අනුව, නියැදිය තුළ භාෂා සාක්ෂරතාවට අදාළ මූලික කුසලතා සාක්ෂාත් කරගත් ළමුන්ගේ ප්‍රතිශතය සියයට 6ක් පමණක් වන අතර, ගණිතයට අදාළ මූලික කුසලතා සාක්ෂාත් කරගත් ප්‍රතිශතය ද සියයට 7ක් වන පහළ මට්ටමක පවතී. තවද, අවදානමට ලක්විය හැකි කුටුම්භවල ළමුන් පාසල් හැරයාම ඉහළ යෑම සඳහා කොවිඩ්-19 ව්‍යාප්ත වීමෙන් අනතුරුව පාසල් දීර්ඝ කාලයක් පුරා වසා තැබීම සහ රට තුළ පැවති පෙර නොවූ අන්දමේ ආර්ථික අර්බුදය මෙන්ම, එමගින් අනෙකුත් අංශවලට ඇති කළ බලපෑම් හේතු විය. 2020 වසර සඳහා වන නවතම දත්තවලට අනුව, ප්‍රාථමික අංශයේ ළමුන් පාසල් හැර යාම, 2019 වසරේ වාර්තා වූ 8,834 සිට 9,269ක් දක්වා ඉහළ ගියේය. මෙවැනි පසුබිමක් තුළ, අර්බුදකාරී අවස්ථාවලදී මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ, අවදානමට ලක්විය හැකි කුටුම්භයන් අධ්‍යාපන වියදම් කපා හැරීම එක් ආර්ථික උපාය මාර්ගයක් ලෙස තෝරා ගත් බැවින්, 2022 වසරේ දී පාසල් හැර ගිය සංඛ්‍යාව තවදුරටත් ඉහළ යෑමේ

හැකියාවක් පවතී. මේ අතර, අඩු ආදායම්ලාභී කුටුම්භවල ළමුන්, ලිපි ද්‍රව්‍ය හා පාසල් සැපයුම් හිඟතාව මෙන්ම, 2022 වසර තුළ ගෘහ ඒකකවල මූල්‍ය දුෂ්කරතා මධ්‍යයේ උද්ධමනය ඉහළ යෑම හමුවේ පාසල් උපකරණවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් තවදුරටත් දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, එමගින් අධ්‍යාපනික ප්‍රතිඵලවල අසමානතා පුළුල් වීමේ අවදානමක් පෙන්නුම් කෙරෙයි. අනෙක් අතට, විකල්ප ඇගයීම් ක්‍රම අනුගමනය කිරීම හෝ විෂය නිර්දේශ සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස්කම් සිදු කිරීම වෙනුවට, ජාතික මට්ටමේ විභාග කල් දැමීම මගින් කෙටි කාලීන වශයෙන් සිසුන්ගේ අධ්‍යයන ප්‍රගතියට බාධාවක් ඇති වන අතර, දිගුකාලීන වශයෙන් රටේ ඵලදායී මානව ප්‍රාග්ධන පදනමක් වර්ධනය කිරීම කෙරෙහි ද මෙමගින් බලපෑමක් ඇති කරයි. පසුගිය වසර තුනක කාලය තුළ සිසුන් විසින් අඛණ්ඩව මුහුණ දුන් දුෂ්කරතාවල ස්වභාවය අනුව, රාජ්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ ඉගෙනීම් කටයුතු සිදු කරනු ලබන සෑම මට්ටමකම සිසුන්ගේ අධ්‍යාපනික ප්‍රතිඵල කෙරෙහි මෙම බාධා මගින් වූ බලපෑම සහ උසස් අධ්‍යාපනය හැදෑරීමේදී හා රැකියා අවස්ථා හිමි වීමේදී මෙවැනි බාධා මගින් ජීවිත කාලය පුරාවටම ඇති කෙරෙන බලපෑම් පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් අනාගත ප්‍රතිපත්ති සකස් කළ යුතුය. එබැවින්, එක් එක් අංශ අනුව රටේ ප්‍රමුඛතා පෙළගස්වමින්, මංගත අධ්‍යාපනික ප්‍රතිඵලවල ගුණාත්මකභාවය සහ පවතින යටිතල පහසුකම් පද්ධතිය වැඩිදියුණු කිරීම, නව ඇගයීම් ක්‍රම, සහ සියලු අධ්‍යාපනික මට්ටම් තුළ ශ්‍රම බලකායේ නිපුණතා ඉහළ නැංවීම සඳහා විෂය නිර්දේශවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සාමූහික උත්සාහයන් අවශ්‍ය වේ.

**2022 වසරේ දී, සැමට සමාන අධ්‍යාපන අවස්ථා සඳහා වන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සේවාවල ගුණාත්මකභාවය, පාලනය සහ සේවා සැපයීම ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** 2022 වසර තුළ දී, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව විෂයමාලාව සහ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, අනාගත ඉගෙනුම් අවශ්‍යතා හඳුනා ගැනීම, අහිමි වූ ඉගෙනුම් අවස්ථා සිසුන්ට යළි ලබා දීම සහ අත්‍යවශ්‍ය අධ්‍යාපනික කුසලතා ලබා දීමට සහාය වීම මෙන්ම, ගුරු සංවර්ධන ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම සහ එමගින් ඉදිරි කාලය තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමවේදයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් වත්මන් අධ්‍යාපන ක්‍රමය අඛණ්ඩව සමාලෝචනය කරන ලදී. ජාතික අධ්‍යාපන ආයතනය, 2024 වසරේ දී 1, 6 සහ 10 ශ්‍රේණි සඳහා තෝරාගත් පාසල්වල නියමු ව්‍යාපෘතියක් ලෙස දියත් කිරීමට අපේක්ෂා කෙරෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු කළේය. 'නව ජාතික පාසල් සංවර්ධන වැඩසටහන' සහ 'ළඟම පාසල හොඳම පාසල' ව්‍යාපෘතිය වැනි නව වැඩපිළිවෙළ ද වසර තුළ දී ක්‍රියාත්මක විය. දිවයින පුරා පාසල් 525ක් තුළ උසස් පෙළ අධ්‍යාපනය සඳහා වෘත්තීය විෂය ධාරාව පිරිනැමීමත් සමඟ, 'වසර 13ක අනිවාර්ය අධ්‍යාපන' ප්‍රතිපත්තිය 2022 වසරේ දී තවදුරටත් ශක්තිමත් විය. 2022 වසරේ දී වෘත්තීය විෂය ධාරාව

### 3.11 සංඛ්‍යා සටහන
### සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ

| ශීර්ෂය | 2021 (අ) | 2022 (ආ) |
|---|---|---|
| 1. මුළු පාසල් සංඛ්‍යාව | 11,088 | 11,082 |
| රජයේ පාසල් | 10,146 | 10,134 |
| ප්‍රාථමික පාසල් | 3,893 | 3,883 |
| ද්විතීයික පාසල් | 6,253 | 6,251 |
| එයින්, ජාතික පාසල් | 396 | 396 |
| වෙනත් පාසල් | 942 | 948 |
| පිරිවෙන් | 819 | 823 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 123 | 125 |
| 2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ඈ) | 4,260,466 | 4,236,207 |
| රජයේ පාසල් | 4,048,937 | 4,024,207 |
| වෙනත් පාසල් | 211,529 | 212,000 |
| පිරිවෙන් | 70,310 | 70,500 |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 141,219 | 141,500 |
| ජාත්‍යන්තර පාසල් | ලැ.නො. | ලැ.නො. |
| 3. මුළු ගුරුවරු සංඛ්‍යාව (ඈ) | 256,676 | ලැ.නො. |
| රජයේ පාසල් | 241,054 | ලැ.නො. |
| වෙනත් පාසල් | 15,622 | ලැ.නො. |
| පිරිවෙන් | 7,347 | ලැ.නො. |
| පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ) | 8,275 | ලැ.නො. |
| ජාත්‍යන්තර පාසල් | ලැ.නො. | ලැ.නො. |
| 4. නව ඇතුළත්කර ගැනීම් (ඉ) | 304,105 | 301,519 |
| 5. ශිෂ්‍ය/ගුරු අනුපාතය | | |
| රජයේ පාසල් | 17 | ලැ.නො. |
| වෙනත් පාසල් | 14 | ලැ.නො. |
| ජාත්‍යන්තර පාසල් | ලැ.නො. | ලැ.නො. |
| 6. ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (1-5 ශ්‍රේණි) | ලැ.නො. | ලැ.නො. |
| 7. ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (6-11 ශ්‍රේණි) | ලැ.නො. | ලැ.නො. |
| 8. වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි) | ලැ.නො. | ලැ.නො. |
| 9. ගුරු පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 8 | 8 |
| 10. වසර තුළ දී පුහුණු කළ ගුරුවරු සංඛ්‍යාව | ලැ.නො. | ලැ.නො. |
| 11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 19 | 19 |
| පුහුණුව ලත් මුළු ගුරුවරු සංඛ්‍යාව | ලැ.නො. | ලැ.නො. |
| වසර තුළ දී පුහුණුව නිමකළ ගුරු සංඛ්‍යාව | ලැ.නො. | ලැ.නො. |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) රජය විසින් අනුමත පෞද්ගලික පාසල් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ පාසල් (මෙයට සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ජාත්‍යන්තර පාසල් අයත් නොවේ)

(ඈ) ජාත්‍යන්තර පාසල්වල දත්ත ඇතුළත් නොවේ

(ඉ) රජයේ පාසල් සඳහා පමණි

මූලය: අධ්‍යාපන අමාත්‍යාංශය

3

යටතේ අධ්‍යාපනය හදාරමින් සිටි සිසුන් 8,000ක් පමණ ආයතනික පුහුණුව සඳහා යොමු කරන ලද අතර, එම වසර තුළ දී, උසස් පෙළ අධ්‍යාපන විෂය ධාරාවේ හත්වැනි විෂය ලෙස වෘත්තීය අධ්‍යාපන විෂය හඳුන්වා දීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. මේ අතර, වසර තුළ දී අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි සිදු කිරීමට ඇති වූ බාධා මධ්‍යයේ, 2021 වසරේ සිට ක්‍රියාත්මක වූ මංගත අධ්‍යාපනික වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින්, අවශ්‍ය පරිදි මිශ්‍ර ඉගෙනුම් ක්‍රම හරහා අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කළේය. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ඉහළ නැංවීම සඳහා 'මූඩ්ල්' (Moodle) ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා 'සවන්දීමේ සහ කථන කුසලතා වැඩිදියුණු කිරීම සහ තක්සේරු කිරීම' නම් පුහුණු වැඩසටහන පවත්වන ලද අතර, 2022 වසරේ දී දිවයින පුරා ඉංග්‍රීසි භාෂා පුහුණුකරුවන් සහ ඉංග්‍රීසි ගුරුවරුන් 150ක් පමණ පුහුණු කරන ලදී. ජර්මානු සහ ප්‍රංශ වැනි විදේශ භාෂා ප්‍රවීණතාව වර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් වසර තුළ දී අධ්‍යාපන අමාත්‍යාංශයෙහි 'ඊ-තක්සලාව' ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කරන ලදී. 2021 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ සියලුම ජාතික මට්ටමේ විභාග 2022 වසරේ මුල් භාගයේ දී පැවැත්වීමට රජය සමත් වූ අතර, 2022 වසරේ අගෝස්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය, පිළිවෙළින්, 2022 වසරේ දෙසැම්බර් සහ 2023 වසරේ ජනවාරි දක්වා කල් දමන ලදී. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවැත්වීමට නියමිතව තිබූ සාමාන්‍ය පෙළ විභාගය, සැලකිය යුතු සහනයක් ලබාදීමකින් තොරව, 2023 වසරේ මැයි මාසයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

**2022 වසරේ දී මංගත සහ භෞතික ලෙස මිශ්‍ර යාන්ත්‍රණ හරහා අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑම සහතික කිරීමට උසස් අධ්‍යාපන අංශය ප්‍රයත්න දැරූ අතර, රටේ පවතින උසස් අධ්‍යාපන යටිතල පහසුකම් පද්ධතිය ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** වසර තුළ දී, කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිට ස්ථාපිත කරන ලද ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN) යන මංගත අධ්‍යාපනික ක්‍රමවේදය යටතේ අනුගමනය කරන ලද ඉගෙනුම් ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි පවත්වාගෙන යෑම හරහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආර්ථික අවහිරතා මගින් ඇති කෙරෙන අහිතකර ප්‍රතිඵල අවම කරමින් රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් සිය අධ්‍යාපන කටයුතු සිදු කරන ලදී. ආර්ථික අර්බුදය මගින් ඇති කරන ලද මූල්‍යමය අවහිරතා මධ්‍යයේ වුව ද, අධ්‍යාපනික කටයුතු අඛණ්ඩව සිදු කිරීම සහතික කරන අතරම, අධ්‍යාපන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට බලධාරීන් කැපවී ක්‍රියා කළේය. ඒ අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ නව පරිගණක පීඨ දෙකක් සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වසර තුළ දී අනුමැතිය ලබා දුන් අතර, විශ්වවිද්‍යාල අටක් තුළ නව දෙපාර්තමේන්තු 14ක් ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය හිමි විය. තවද, ප්‍රථම උපාධි වැඩසටහන්, විශේෂ උපාධි වැඩසටහන්, පශ්චාත් උපාධි වැඩසටහන් සහ බාහිර උපාධි වැඩසටහන් ආවරණය වන පරිදි නව උපාධි වැඩසටහන් 54ක් පමණ 2022 වසරේ දී අනුමත කරන ලදී. මේ අතර,

**3.12 සංඛ්‍යා සටහන**

**විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික ලක්ෂණ (අ)**

| ශීර්ෂය | 2021 (ආ) | 2022 (ඇ) |
|---|---|---|
| 1. විශ්වවිද්‍යාල සංඛ්‍යාව | 17 | 17 |
| 2. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | 19 | 19 |
| 3. ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි අපේක්ෂක) (ඈ) | | |
| විශ්වවිද්‍යාල (ඉ) | 119,068 | 128,638 |
| ආයතන | 3,611 | 3,712 |
| විවෘත විශ්වවිද්‍යාලය | 28,824 | 28,591 |
| 4. මුළු කාර්යමණ්ඩලය (සියලුම විශ්වවිද්‍යාලවල) | | |
| අධ්‍යයන | 7,004 | 7,204 |
| අනධ්‍යයන | 13,164 | 13,150 |
| 5. ශිෂ්‍ය/ගුරු අනුපාතය | 19.4 | 20.2 |
| 6. වයස් විශේෂිත උපාධි අපේක්ෂක ඇතුළත් වීමේ අනුපාතය (අවුරුදු 18-22) (ඈ) | 8.9 | 9.3 |
| 7. අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම | | |
| ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ප්‍රමාණය (%) | 62.47 | 62.89 |
| සුදුසුකම් ලැබූවන්ගෙන් ඇතුළත් වූ ප්‍රමාණය (%) | 22.58 | ලැ.නො. |
| 8. උපාධිලත් සංඛ්‍යාව (ඊ) | 36,012 | ලැ.නො. |
| ප්‍රථම උපාධි | 25,890 | ලැ.නො. |
| පශ්චාත් උපාධි | 10,122 | ලැ.නො. |
| 9. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුළත් වීම (උ) | 43,927 | ලැ.නො. |
| 10. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | 194,366 | 171,497 |

මූලයː විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) බාහිර උපාධි පාඨමාලා ඇතුළත් නොවේ
(ඉ) විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ
(ඊ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් වේ
(උ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ සියලුම විශ්වවිද්‍යාලවල තෙවන වසරේ සිසුන් සඳහා ජාතික මට්ටමේ විභාගයක් ලෙස ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) හඳුන්වා දීමට පියවර ගන්නා ලදී. මෙම විභාගය සමත් වූ පසු ජාතික මට්ටමේ සහතිකයක් පිරිනැමීමට සැලසුම් කර ඇත. මීට අමතරව, කලා, මානව ශාස්ත්‍ර සහ සෞන්දර්ය විෂය ධාරාවන් යටතේ අධ්‍යාපනය හදාරණ උපාධි අපේක්ෂකයින්ගේ අනාගත රැකියා අවස්ථා ඉහළ නැංවීමේ අරමුණින්, විශ්වවිද්‍යාල තුළ මානව ශාස්ත්‍ර, කලා සහ සෞන්දර්ය කලා පීඨවල වෙනම තොරතුරු තාක්ෂණ අංශ පිහිටුවීමේ ව්‍යාපෘතියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී.

**ශ්‍රම වෙළඳපොළ ගතික ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි තෘතීයික අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය 2022 වසරේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.** 2022 වසර අවසානය වන විට, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 24ක් පැවති අතර, එම ආයතන මගින් ප්‍රතීතනය ලත් උපාධි වැඩසටහන් 221ක් පිරිනමනු ලබයි. වසර තුළ දී, එක් නව ආයතනයක් උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගැනුණු අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන නව උපාධි වැඩසටහන් 34ක් ද පිළිගැනිණි. මේ අතර, 2022 වසර තුළ නව උපාධි වැඩසටහන් කිහිපයක් සහ නව ආයතන පිළිබඳ සමාලෝචන සිදු කෙරෙමින් පැවතුණි. උපාධි ප්‍රදානය කරන ආයතන සඳහා වන අවම ප්‍රමිතීන් නිශ්චය කර ගැනීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල විෂයමාලාව සමාලෝචනය කිරීම මෙම වසර තුළ දී අවසන් කරන ලදී.

**කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය, ආර්ථිකයේ නූතන අධ්‍යාපනික කුසලතා අවශ්‍යතා සපුරාලීම සඳහා වන ඉඩ ප්‍රස්ථා ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කළේය.** 2022 වසර අවසානය වන විට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපනය ලබා දීමේ නිරත ලියාපදිංචි ආයතන 1,136ක් තිබූ අතර, ඉන් 526ක් රාජ්‍ය ආයතන වන අතර, 610ක් රාජ්‍ය නොවන අංශයේ ආයතන විය. මෙම ආයතන හරහා විවිධ තාක්ෂණික සහ වෘත්තීය විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රතීතනය කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපන පාඨමාලා 3,043ක් පිරිනමනු ලැබීය. වසර තුළ දී, සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 117,954ක් නිකුත් කරන ලදී. ආර්ථික අර්බුදය මගින් ඇති කරන ලද අවහිරතා මධ්‍යයේ වුව ද, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින්, පුහුණු කිරීමේ, ඇගයීම් සිදු කිරීමේ සහ සහතික කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා අඛණ්ඩව පියවර ගන්නා ලදී. බොහෝ පුහුණු ආයතන මිශ්‍ර අධ්‍යාපන ක්‍රම අඛණ්ඩව භාවිතා කළ අතර, කාලය අවම කර ගැනීම මෙන්ම, ගමනාගමන කටයුතු වෙනුවෙන් වන මූල්‍ය පිරිවැය, නවාතැන් පිරිවැය සහ පහසුකම් සැපයීමේ පිරිවැය අඩු කිරීම සඳහා නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමවේදය (FLM) ප්‍රවර්ධනය කරන ලදී. මේ අතර, ගෝලීය රැකියා වෙළඳපොළ තුළ 'සාත්තු සේවක' අංශය සඳහා ශීඝ්‍රයෙන් වර්ධනය වන ඉල්ලුම හඳුනා ගනිමින්, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 'සාත්තු සේවක' පුහුණු පාඨමාලා පිරිනමන පුහුණු ආයතන සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි පාලක සභාව විසින් ආවරණ අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි පාලක සභාව විසින් 2022 වසරේ නොවැම්බර් මස 01 වන දින සිට ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් කිහිපයක් වෙත සේවය මත පුහුණුව (On-the-Job Training) සඳහා පහසුකම් සලසමින් 05/2022 දරන ජාතික වෘත්තීය සුදුසුකම් (National Vocational Qualification) චක්‍රලේඛය නිකුත් කරන ලද අතර, එමගින් අනාගත රැකියා අවස්ථා සඳහා අනුගත වීම වේගවත් කෙරෙනු ඇත.

3

**3.13 සංඛ්‍යා සටහන**

**තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ මූලික ලක්ෂණ**

| ශීර්ෂය | 2021 | 2022 (අ) |
|---|---|---|
| 1. ලියාපදිංචි කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සංඛ්‍යාව (ආ) | **1,071** | **1,136** |
| රාජ්‍ය | 478 | 526 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 593 | 610 |
| 2. පිළිගත් පාඨමාලා සංඛ්‍යාව | **3,014** | **3,043** |
| රාජ්‍ය | 2,387 | 2,370 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 627 | 673 |
| 3. ප්‍රදානය කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් සංඛ්‍යාව | **45,033** | **117,954** |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 4,633 | 9,782 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 7,441 | 50,029 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 17,253 | 25,432 |
| ජාතික තරුණ සේවා සභාව | 3,897 | 4,903 |
| පෞද්ගලික ආයතන | 11,809 | 27,808 |

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී

මූලය: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

### නිවාස හා නාගරික සංවර්ධනය

**දැඩි රාජ්‍ය මූල්‍ය අවකාශය සහ අමුද්‍රව්‍යවල සැපයුම් හිඟය මෙන්ම, වසර තුළ දී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදවුම් පිරිවැය ඉහළ යෑමෙහි බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී රජයේ නිවාස සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය.** රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මැදි ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිවල මූලික කටයුතු නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මෙම වසර තුළ සිදු කරන ලදී. කෙසේ වෙතත්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ වූ වත්තල හා නිට්ටඹුව ප්‍රදේශවල මැදි ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා කඩුවෙල ප්‍රදේශවල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව ප්‍රධාන ව්‍යාපෘති හතරක් රජය මුහුණ දුන් මුදල් ප්‍රවාහ දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ දී තාවකාලිකව නවතා දමන ලද අතර, හික්කඩුව සහ නාවලපිටිය ප්‍රදේශයේ සැලසුම් කර තිබූ අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ද අයවැය ප්‍රතිපාදන සීමා වීම හේතුවෙන් නතර කෙරිණි. කෙසේ වෙතත්, ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් වතු ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ඉන්දීය රජයේ මූල්‍ය ආධාර යටතේ නිවාස ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, මීට සමාන ආකාරයේ ව්‍යාපෘති කිහිපයක් ද රජයේ ආධාර යටතේ මෙම වසර තුළ ක්‍රියාත්මක විය. මේ අතර, 'ඔබට ගෙයක් - රටට හෙටක්', 'මිහිඳු නිවහන' සහ 'විරු සුමිතුරු' නිවාස ව්‍යාපෘතිවලට අදාළ සංවර්ධන කටයුතු මධ්‍යස්ථ වේගයකින් සිදු විය.

**ආර්ථික අර්බුදය උග්‍ර වීම හා ආශ්‍රිත මූල්‍ය අවහිරතා මධ්‍යයේ 2022 වසරේ දී රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති මන්දගාමී වේගයකින් අඛණ්ඩව සිදු විය.** නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන (සියක් නගර) යටතේ නගර අලංකරණය සහ නාගරික සංවර්ධන කටයුතු ඇතුළුව රටේ පවතින යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති 180ක් පමණ අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. හෝමාගම තාක්ෂණ නගරයේ (Tech City) මාර්ග පහක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කොට්ටාව සිට මාහේනවත්ත දක්වා දිවෙන නව පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම වසර තුළ දී අවසන් කරන ලදී. රාජ්‍ය ආයතන සංවර්ධන ව්‍යාපෘති, බේරේ වැව ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය සහ යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු තවත් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ද 2022 වසර තුළ දී ක්‍රියාත්මක විය. කොළඹ අගනගර ආශ්‍රිත කලාපයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ සංවර්ධන කටයුතු ද වසර තුළ අඛණ්ඩව සිදු වූ අතර, 2022 වසර අවසානයේ දී සියයට 90.0ක සමුච්චිත ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය. තවද, නාගරික ගංවතුර ආපදා ආශ්‍රිත ගැටලු විසඳීම සහ කොළඹ අගනගර ආශ්‍රිත කලාපය ලෝක මට්ටමේ නගරයක් බවට සංවර්ධනය කිරීම අරමුණු කරගත් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2022 වසර අවසන් වන විට සියයට 99.6ක භෞතික ප්‍රගතියක් වාර්තා කළේය. තවද, ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු, කොළඹ නෙළුම් කුළුණ 2022 වසරේ පෙබරවාරි මස 28 වන දින ශ්‍රී ලංකා රජයට භාර දෙන ලද අතර, ඒ අනුව එහි මෙහෙයුම් කටයුතු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද කොළඹ නෙළුම් කුළුණ (පුද්ගලික) සමාගම වෙත පවරා ඇත. කොළඹ නෙළුම් කුළුණ 2022 වසරේ සැප්තැම්බර් මාසයේ මැද භාගයේ සිට මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලද අතර, නෙළුම් කුළුණ පරිශ්‍රය තුළ විනෝදාස්වාද කලාපයක් සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයින් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා සිදු විය.

**වැදගත් සංධිස්ථාන කිහිපයක් සාක්ෂාත් කරමින් කොළඹ වරාය නගරය සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් 2022 වසරේ දී අඛණ්ඩව සිදු විය.** ඒ අනුව, සමස්ත ව්‍යාපෘතිය සඳහා අදාළ වන සංවර්ධන පාලන රෙගුලාසි 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර, ක්‍රමෝපායික වැදගත්කමක් සහිත ව්‍යාපාර, අක්වෙරළ සමාගම්, බලයලත් පුද්ගලයන් සහ තීරුබදු රහිත පාරිභෝගික වෙළෙඳාම් කටයුතු සම්බන්ධ ප්‍රධාන රෙගුලාසි 2022 වසරේ දී සකස් කර අවසන් කරන ලදී. කෙසේ වෙතත්, වරාය නගරය තුළ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලයක් සහ ජාත්‍යන්තර පාසලක් පිහිටුවීමේ වැදගත්කම සලකා බලමින්, 2022 වසර අවසාන කාලයේ දී සංවර්ධන පාලන රෙගුලාසි සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. ආසියානු කලාපයේ ප්‍රථම තීරුබදු රහිත සාප්පු සංකීර්ණයෙහි (Downtown Duty-Free Mall) යටිතල පහසුකම් ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද අතර, 2023 වසරේ මැද භාගයේ දී දියත් කිරීමට සැලසුම් කර ඇති කොළඹ වරාය නගරයෙහි තීරුබදු රහිත මඟී ප්‍රවේශ පද්ධතිය ද සංවර්ධනය කිරීමේ කටයුතු වසර තුළ දී සිදු විය. කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම විසින් බිම් කොටස් 74කින් බිම් කොටස් 42කට අදාළව මූලික ඉඩම් සැකසීම සහ තාක්ෂණික කටයුතු අවසන් කිරීමත් සමඟ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවට ව්‍යාපෘති සමාගම වෙත සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කිරීමට හැකියාව හිමිවුණු අතර, කොළඹ වරාය නගරයේ මරීනා

දිස්ත්‍රික්කයේ බිම් කොටස් හයක් වසර තුළ දී අලෙවි කරන ලදී. අදාළ සියලු රෙගුලාසි සහ පූර්ව මෙහෙයුම් අවශ්‍යතාවලට අනුකූලව බැංකු කටයුතු ආරම්භ කිරීම සඳහා රාජ්‍ය බැංකු දෙකක් ඇතුළුව බැංකු හතරක් සඳහා බලපත්‍ර ලබා දෙන ලදී. කොමිෂන් සභාව විසින් ආයෝජක වීසා, රැකියා වීසා සහ නේවාසික වීසා යනුවෙන් වීසා වර්ග තුනක් හඳුන්වා දී ඇති අතර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග එක්ව වීසා අයදුම් කිරීමේ සහ අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරමින් ස්වයංක්‍රීයකරණය කර ඇත. තවද, කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයේ අදියර I, මරිනා වෝටර්ෆ්‍රන්ට් වාණිජ මධ්‍යස්ථානය ඉදිකිරීම, මරිනා හෝටලය සහ අධි සුඛෝපභෝගී නිවාස ඇතුළු ව්‍යාපෘති කිහිපයක් සඳහා සෞදි අරාබිය පදනම් කරගත් සමාගමකින් ආයෝජන සහාය ලබා ගැනීම සඳහා 2023 වසරේ මුල් භාගයේ දී සාකච්ඡා පැවැත්විණි.

## සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

**ආර්ථික අවපාතය මධ්‍යයේ බහුවිධ අංශයන්ගෙන් පැනනැගුණු ආර්ථික අවදානම් ඉහළ යෑම සමඟ දරිද්‍රතාවය තුරන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය මන්දගාමී වී ඇත.** ජාතික මට්ටමින් දරිද්‍රතාවය තුරන් කිරීමෙහිලා ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ඇතත්, බහුවිධ මානයන්ට අනුව පවතින සැලකිය යුතු මට්ටමේ ආදායම් විෂමතා හේතුවෙන්, ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් තවමත් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ යාවත්කාලීන කරන ලද දරිද්‍රතා රේඛාවට අනුව, ජනගහනයෙන් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ප්‍රතිශතය 2002 වසරේ වාර්තා වූ සියයට 46.8ට සාපේක්ෂව 2019 වසර වන විට සියයට 14.3ක් දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, 2019 වසරේ දී ග්‍රාමීය අංශයේ සියයට 15.0ක් සහ නාගරික අංශයේ සියයට 6.0ක් ලෙස පැවති දරිද්‍රතා මට්ටම් හා සැසඳීමේදී වතු අංශයේ දරිද්‍රතා මට්ටම සියයට 33.8ක් ලෙස ඉහළ මට්ටමක පැවති අතර, එමගින් මෙම අංශ අතර පවතින සැලකිය යුතු විෂමතා පිළිබිඹු කෙරෙයි. 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව, ජනගහනයෙන් දුප්පත්ම සියයට 20 සඳහා රටේ සමස්ත ගෘහ ඒකක ආදායමෙන් සියයට 4.6ක් පමණක් ද, ජනගහනයෙන් ධනවත්ම සියයට 20 සඳහා සමස්ත ගෘහ ඒකක ආදායමෙන් සියයට 51.3ක් පමණ ද හිමිව ඇති අතර, එමගින් රටේ අඛණ්ඩව පවතින ආදායම් විෂමතාව පිළිබඳ ගැටලුවේ බරපතළකම නැවතත් තහවුරු කෙරෙයි. දරිද්‍රතාවයට අදාළ මෙම සංඛ්‍යාලේඛන මගින්, මෑතකාලීන ආර්ථික අර්බුදයට පෙර ද රටේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් දරිද්‍රතාවයෙන් පසුවුණු බව පෙන්නුම් කරනු ලබයි. මෙවැනි පසුබිමක් තුළ, කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම ජනගහනය තුළ දරිද්‍රතාවයෙන් පසුවුණු කාණ්ඩ බොහෝ දුරට ආර්ථික කම්පනවලට මුහුණ දී ඇති අතර, 2022 වසර තුළ දී අයහපත් වූ සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඔවුන්ගේ අවදානම් තවදුරටත් ඉහළ ගොස් ඇත. ආර්ථික කටයුතු සඳහා අඛණ්ඩව ඇති වූ අවහිරතා සහ ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම සමඟ, ඒ ආශ්‍රිතව ආදායම් මට්ටම් හා රැකියා අවස්ථා කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම හේතුවෙන් ආර්ථික අර්බුදයට පෙර යහපත් මට්ටමේ ජීවන තත්ත්වයක් පවත්වාගත් ජනගහනයේ ඇතැම් කොටස් ද දරිද්‍රතා රේඛාව ආසන්නයට තල්ලු වී ඇත. මේ අතර, පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම, අවදානමට ලක්විය හැකි කුටුම්භ කෙරෙහි දැඩි බලපෑමක් සිදු කර ඇති අතර, එය පෙර පැවති ආදායම් විෂමතා උත්සන්න කර ඇත. ජනගහනය වර්තමානයේ මුහුණ දෙමින් සිටින අවදානම පිළිබිඹු කරමින්, ජාතික දරිද්‍රතා රේඛාව 2022 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට රුපියල් 13,777.00ක් දක්වා ආසන්න වශයෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 74.1කින් ඉහළ ගිය අතර, ඒ සඳහා 2022 වසර තුළ උද්ධමනයෙහි ඉහළ යෑම හේතු විය. නාගරික ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන්ගේ ජීවන වියදමට උද්ධමනය මගින් සිදු කරන විෂම බලපෑම ඉස්මතු කරමින්, දිස්ත්‍රික් දරිද්‍රතා රේඛා, පිළිවෙළින්, රුපියල් 13,311.00ක් සහ රුපියල් 13,174.00ක්ව පැවති කිලිනොච්චිය සහ මොණරාගල වැනි ග්‍රාමීය දිස්ත්‍රික්ක හා සසඳන විට, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල දරිද්‍රතා රේඛාව රුපියල් 14,500.00 සීමාව ඉක්මවා ගියේය.

**දීර්ඝ කාලයක් පුරා පැවති ආර්ථික අර්බුදය සහ ඒ ආශ්‍රිත ආර්ථික අවහිරතා හේතුවෙන් ගෘහ ඒකකවල මූල්‍යමය ශක්‍යතාව අහිමි වීම පමණක් නොව, ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර ආහාර අනාරක්ෂිතභාවය සහ මන්දපෝෂණය ද ඉහළ ගොස් ඇත.** 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ලෝක ආහාර වැඩසටහන සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය එක්ව නිකුත් කරන ලද භෝග සහ ආහාර සුරක්ෂිතතා තක්සේරු මෙහෙයුමේ විශේෂ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ මිලියන 6.3ක ජනතාවක් මධ්‍යස්ථ හා උග්‍ර ආහාර අනාරක්ෂිතභාවයට මුහුණ දී සිටින බව ඇස්තමේන්තු කර ඇත. ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආධාරයක් සහ ජීවිකාව

සරි කර ගැනීම සඳහා ප්‍රමාණවත් සහායක් නොමැතිව, මෙම පුද්ගලයින්ගේ තත්ත්වය තවදුරටත් අයහපත් විය හැකිය. මෙවැනි පසුබිමක් තුළ, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් පිරිනමන සහනදායි ණය වැඩසටහන යටතේ ණය ඉල්ලුම් කිරීම සඳහා ප්‍රතිලෝම ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කළ අතර, එමගින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙතින් ලබා දෙන සහනදායී මූල්‍යනය සඳහා වන ප්‍රවේශය ඇති කර ගැනීමටත්, ආර්ථිකය ස්ථාවර කිරීමට සහ කුසගින්න හා දරිද්‍රතාවයෙන් ආරක්ෂා වීම සඳහා වෙනත් බහුපාර්ශ්වික සංවර්ධන ආයතනවලින් සහාය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා නිර්මාණය වීමත් සිදු විය.

**ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස නව දරිද්‍රතා කණ්ඩායම් නිර්මාණය වීමට ඇති ප්‍රවණතාවය මධ්‍යයේ, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඉලක්ක කර ගැනීම ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී.** ඒ අනුව බහුපාර්ශ්වික නියෝජිතායතනවල තාක්ෂණික සහාය ඇතිව 'කිසිවෙක් අතහැරෙන්න දෙන්න එපා' (Leave No One Behind) වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් ස්ථාපිත කිරීම කඩිනම් කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පියවර ගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ, ලෝක බැංකුවේ සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ මූල්‍ය ආධාර ඇතිව, 2023 වසරේ ජූනි මාසය අවසන් වන විට සුබසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට සහ ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන යටතේ සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් සඳහා සුදුසුකම් තීරණය කිරීමට අදාළ තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2022 වසර තුළ සිදු කරන ලද අතර, නිවෙස් වෙත ගොස් දත්ත තහවුරු කර ගැනීම 2023 වසරේ මුල් කාලයේ දී ආරම්භ විය. තවද, සුබසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය සඳහා දත්ත එක්රැස් කිරීමේ මූලික ක්‍රියාපටිපාටිය 2022 වසර තුළ දී අඛණ්ඩව සිදු කරන ලද අතර, වසර අවසාන වන විට අයදුම්කරුවන් 3,726,596ක් පිළිබඳ මූලික තොරතුරු ලියාපදිංචි කර ඇත. මෙම වැඩසටහන මගින්, සමාජ සුබසාධන ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් පිළිබඳ අඛණ්ඩ තක්සේරුවක් සිදු කිරීම සහ අවසානයේ දී ඔවුන්ගේ ගෘහ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම මගින් සුබසාධන වැඩසටහන්වලින් ඉවත් වීමට නිසි යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම අරමුණු කරයි. 2023 වසරේ මුල් කාලයේ දී, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ තවත් ප්‍රධාන රාජ්‍ය ආයතන කිහිපයක සහයෝගය ඇතිව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, ආර්ථික අර්බුදය මගින් ජීවන තත්ත්වයන් මත කර ඇති බලපෑම තක්සේරු කිරීම සඳහා ගෘහස්ථ සමීක්ෂණයක් පැවැත්වීමට පියවර ගන්නා ලදී. අපේක්ෂිත ප්‍රතිලාභීන් වෙත සහනාධාර නිසි කාලයට ලැබෙන බව සහතික කිරීම සඳහා අවශ්‍යතා ඇති පුද්ගලයන් හඳුනා ගැනීමට සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් කඩිනමින් සැකසීමේ අවශ්‍යතාවයක් පවතී. සුබසාධන වැඩසටහන් ඩිජිටල්කරණය කිරීම ඇතුළුව සහනාධාරලාභීන් පිළිබඳ එවැනි දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම මගින් දත්තවල ගුණාත්මකභාවය, ප්‍රමාණවත් බව සහ කාලානුරූපී බව වැඩිදියුණු වීම හරහා, දිළිඳුකම තුරන් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මැදිහත්වීම් වඩාත් ඵලදායී කරනු ඇති අතර, අනාගතයේ දී සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ශක්තිමත් කෙරෙනු ඇත.

**3.14 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම**

| වර්ෂය | දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන | | පෝෂණ දීමනා වැඩසටහන (අ) | |
|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව (ආ) | වටිනාකම (රු. මිලියන) (ඇ) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආ) | වටිනාකම (රු. මිලියන) |
| 2018 | 1,384,021 | 39,239 | 329,047 | 5,490 |
| 2019 | 1,800,182 | 44,660 | 300,246 | 5,279 |
| 2020 | 1,770,086 | 52,434 | 238,034 | 4,751 (ඈ) |
| 2021 | 1,760,485 | 55,400 | 250,848 | 5,248 |
| 2022 (ඉ) | 1,760,485 | 120,988 (ඊ) | ලැ.නො. | 3,690 |

(අ) ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සඳහා
(ආ) වසර අවසානයේ දී
(ඇ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව
(ඈ) සංශෝධිත
(ඉ) තාවකාලික
(ඊ) බහුපාර්ශ්වික ආධාර යටතේ ලබාදුන් සහනාධාර ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**අඩු ආදායම්ලාභී ගෘහ ඒකකවල සමාජ ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා වසර තුළ දී දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සමාජ ආරක්ෂිත ජාල වැඩසටහන් රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්, රජයේ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන වන සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ රුපියල් බිලියන 120කට ආසන්න මුදලක් ප්‍රතිලාභී පවුල් මිලියන 1.7ක් සහ දැනට සමෘද්ධි ඇතුළු අනෙකුත් සහනාධාර ප්‍රතිලාභ සඳහා පොරොත්තු ලේඛනවල සිටින පවුල් අතර බෙදා දෙන ලදී. වසංගතය මගින් දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් වලට ඇති කළ විෂමාකාර හා ක්ෂණික බලපෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසර සඳහා වන රජයේ අයවැයට අනුකූලව, රජය විසින් ප්‍රතිලාභී පවුලකට ලබා දෙන මාසික සමෘද්ධි දීමනාව 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට සියයට 28කින් පමණ ඉහළ නංවන ලදී. ඒ අනුව, පවුලකට රුපියල් 3,500ක්, රුපියල් 2,500ක් සහ රුපියල් 1,500ක් බැගින් වූ පවුල් ඒකක දීමනා, පිළිවෙළින්, එක් පවුලකට රුපියල් 4,500ක්, රුපියල් 3,200ක් සහ රුපියල් 1,900ක් දක්වා ඉහළ නැංවූයේය. බහුපාර්ශ්වික නියෝජිතායතනවල මූල්‍ය සහාය ඇතිව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ මැයි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලසීමාව තුළ හදිසි මුදල් ප්‍රදාන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ දැනට සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් සහ සමෘද්ධි ප්‍රතිලාභ සඳහා පොරොත්තු ලේඛණ වල සිටින පවුල් මෙන්ම, වැඩිහිටි, ආබාධිත හා වකුගඩු රෝග කාණ්ඩ යටතේ සහනාධාර යෝජනා ක්‍රම සඳහා පොරොත්තු ලේඛනවල සිටි පුද්ගලයන් සඳහා රුපියල් 3,000ක සිට රුපියල් 5,000ක් දක්වා දීමනා ලබා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ, ලෝක බැංකුවේ මූල්‍ය සහාය ඇතිව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභී පවුල් මිලියන 2.6ක් අතර රුපියල් බිලියන 38.5ක් පමණ බෙදා දී ඇති අතර, ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිලාභී පවුල් මිලියන 3.0 අතර රුපියල් බිලියන 45.5ක් බෙදා දීම සඳහා මූල්‍ය ආධාර ලබා දී ඇත. තවද, ලෝක ආහාර වැඩසටහනෙහි සහාය ඇතිව, අඩු ආදායම්ලාභී ගර්භණී සහ කිරිදෙන මව්වරුන්, කාන්තාවන් ගෘහ මූලිකත්වය සහිත පවුල්, අවුරුදු පහට අඩු දරුවන් සහ මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි පවුල්වල පෝෂණ යහපැවැත්ම සහතික කිරීම සඳහා තවත් මූල්‍ය ආධාර වැඩසටහනක් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් අම්පාර, යාපනය, මන්නාරම, මොණරාගල, ගාල්ල, මුලතිව් සහ නුවර එළිය දිස්ත්‍රික්කවල තෝරාගත් පවුල් 41,710ක් ආවරණය කළ අතර, එමගින් 2022 වසර අවසන් වන විට ලබා දී ඇති මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 625.7කි. මේ අතර, වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින පවුල් ආවරණය වන පරිදි, 2022 වසරේ අගෝස්තු මාසයේ දී කළුතර දිස්ත්‍රික්කයේ එක් පවුලකට රුපියල් 10,000 බැගින් ඍජු මුදල් ආධාරයක් ලබා දෙන ලදී. ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ජීවනෝපාය, සමාජීය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩසටහන් රාශියකට ද වසර තුළ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධ විය. අරමුදල් ලබාදීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, පාරිභෝගික සම්බන්ධතා මොඩියුලය (CRM) සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කිරීම, සමෘද්ධි නිලධාරීන් සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීම සහ ප්‍රතිලාභීන් සඳහා තවත් බැංකු අවස්ථා වැනි නව උපාය මාර්ග අනුගමනය කරන ලදී. අර්බුදය හේතුවෙන් තම ජීවනෝපායයන් අහිමි වූ පවුල් සඳහා මූල්‍යමය සහන ලබා දීම සඳහා ධීවර කර්මාන්තයේ නියැළෙන කුඩා බෝට්ටු හිමියන්ට සහ විදුලිය නොමැති වතු අංශයේ පුද්ගලයන්ට භූමිතෙල් සහනාධාරයක් ලබා දීම ඇතුළු තවත් සමාජ සුබසාධන වැඩසටහන් කිහිපයක් රජය විසින් වසර තුළ දී හඳුන්වා දෙන ලදී. මීට අමතරව, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ ළමුන් අතර මන්දපෝෂණය ආශ්‍රිත නව අවදානම් ඇති වීම වැළැක්වීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන මධ්‍යස්ථාන සවිබල ගැන්වීම සඳහා බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මේ අතර, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සායනවල ලියාපදිංචි වූ ගර්භණී සමයේ අවසාන මාස හය ගතවන ගැබිණි මව්වරුන් සහ කිරිදෙන සමයේ මුල් මාස හතරෙහි පසුවන මව්වරුන් සඳහා රුපියල් 2,000ක පෝෂණ දීමනාව අඛණ්ඩව ලබා දෙන ලදී. ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය ඇතිව, පෙර පාසල් වයසේ පසුවන අඩු බරින් යුත් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන ද මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

**පසුගිය දශක කිහිපය තුළ බලයට පත් රජයන් විසින්, දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළ ද, ශ්‍රී ලංකාව තවමත් විවිධ මානයන්ට අනුව සැලකිය යුතු අන්දමේ ආදායම් විෂමතාවලට**

3

**මුහුණ දෙන බැවින් ජනතාව සමාජ ආර්ථික අර්බුදවලට පහසුවෙන් ලක් වීමේ වැඩි අවදානමක් ඇත.** එබැවින්, සෑම අංශයකටම ප්‍රතිලාභ හිමිවෙන පරිදි සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා වන රටේ සංවර්ධන ඉලක්කය තුළ ප්‍රධාන පියවරක් වන, දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රවේශයන් පිළිබඳව නැවත සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව පවතී. ජාතික මට්ටමින් සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් ස්ථාපිත කිරීම මගින් අවශ්‍යතා ඇති කොටස් වෙත සම්පත් ලබා දීම සිදු වනු ඇති බැවින් එය මනා සම්පත් උපයෝජනයකට සහාය වනු ඇත. සහනාධාරලාභීන්ගේ නාම ලේඛනය නිතිපතා යාවත්කාලීන කිරීම සඳහා වැඩි නම්‍යශීලී බවක් ඇති කරගත යුතු වේ. මීට අමතරව, කෙටි කාලීනව ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් මත ඇති කෙරෙන පීඩනය අවම කිරීම සඳහා කටයුතු කරන අතර, මනාව ඉලක්කගත ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම හරහා මෙම ජන කණ්ඩායම්වල ඔරොත්තු දීමේ හැකියාව දිගුකාලීනව ඉහළ නංවාලීම කෙරෙහි රජය අවධානය යොමු කළ යුතු අතර, එමගින් අනාගතයේ දී එම ජන කොටස් රජයේ සහනාධාර වැඩසටහන් මත පදනම් වීම අවම කෙරෙනු ඇත. තවද, ජනගහන වර්ධනයේ වෙනස්වීම් මෙන්ම ස්වාභාවික විපත් ඇතිවීම, හදිසි සෞඛ්‍ය අවස්ථා ආදිය දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රතිපත්ති තුළින් සැලකිල්ලට ගත යුතුය. වයස්ගත ජනගහනය ඉහළ යෑමේ පසුබිම තුළ මෙන්ම, ජනගහනයෙන් විශාල කොටසක්, අවිධිමත් අංශයේ සේවයේ නියුතු තත්ත්වයක් තුළ විශේෂයෙන් ම රජයට අමතර මූල්‍ය පීඩනයක් ඇති නොවන පරිදි විශ්‍රාම අරමුදලක් ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින් විශ්‍රාමික කාල සීමාව තුළ මෙම පිරිසගේ අනාගතය සුරක්ෂිත කිරීමට සහාය සලසනු ඇත. තවද, ප්‍රමුඛතා පදනමක් මත අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශයේ විෂමතා ඉහළ යෑම අවම කළ යුතු අතර, එමගින් ආර්ථිකයේ අවදානමට ලක් විය හැකි ජන කොටස් මුහුණ දෙන දරිද්‍රතාවයේ විෂම චක්‍රීය ප්‍රවණතාව වළක්වාලිය හැකිය. ආර්ථික අර්බුදය හමුවේ, උත්සන්න වෙමින් පවතින දරිද්‍රතා මට්ටම් පාලනය කිරීම සඳහා කෙටි හා දිගු කාලීන වශයෙන් ප්‍රතිපත්ති රාමුවක් සකස් කළ යුතු අතර, එමගින්, අපේක්ෂිත ආර්ථික වර්ධනයේ යථා තත්ත්වයට පත්වීමෙහි සහ ආර්ථික ප්‍රගතියේ ප්‍රතිලාභ රටේ සියලුම පුරවැසියන්ට සමානව බෙදී යෑම සහතික කළ හැකි වනු ඇත. විශේෂයෙන් ම, අවදානමට ලක්විය හැකි කාණ්ඩ සඳහා වන සුබසාධන පැකේජ ලබාදීමේදී දේශපාලනික සහ අනෙකුත් මැදිහත් වීම් අවම කළ යුතුය.

## පරිසරය

**රටේ වත්මන් සහ අනාගත පාරිසරික තිරසාරභාවය ආරක්ෂා කිරීම සඳහා වන ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු ඉදිරි පියවරක් තබමින් 2022 වසරේ දී ජාතික පරිසර ප්‍රතිපත්තිය සාර්ථකව දියත් කරන ලදී.** භූමිය හා ජල සම්පත්, ජෛව විවිධත්වය හා පරිසර පද්ධති, වෙරළ හා සමුද්‍ර සම්පත්, පරිසර දූෂණය වැළැක්වීම, පාලනය හා කසළ කළමනාකරණය, දේශගුණ විපර්යාස හා ගෝලීය පාරිසරික අභියෝග, නිර්මිත පරිසරය හා හරිත සංවර්ධනය සහ විවිධ අංශ හා සම්බන්ධ වන ගැටලු සහ අභියෝග යන තේමා යටතේ ක්ෂේත්‍ර හතක් පුරා යෝජිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලින් සමන්විත වන ජාතික පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා මූලිකත්වය ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසරේ ජූනි මාසයේ දී පරිසර අමාත්‍යාංශය වෙත අනුමැතිය ලබා දෙන ලදී. මනාව නිර්වචනය කරන ලද ප්‍රතිපත්තිමය රාමුවක් හරහා ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට හැකියාව ලැබෙන පරිදි, ජාතික පරිසර ප්‍රතිපත්තිය මගින් පාරිසරික සම්පත් තිරසාර ලෙස භාවිතය, කළමනාකරණය සහ ආරක්ෂා කිරීම සහතික කිරීම අපේක්ෂා කෙරේ. තවද, ජාතික පරිසර ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යුතුව, ජාතික පරිසර ප්‍රතිපත්තියෙහි ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාවට නැංවිය හැකි ක්‍රියා බවට පරිවර්තනය කිරීමේ උපාය මාර්ග හඳුනා ගනිමින්, 2022-2030 වසර සඳහා වන ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම මෙම වසර තුළ දී අවසන් කරන ලදී.

**ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේදී ස්වභාවික සම්පත් තිරසාර හා කාර්යක්ෂම අන්දමින් භාවිත කිරීම කෙරෙහි ඇති අවධානය ශක්තිමත් කිරීම සඳහා පියවර කිහිපයක් තව දුරටත් ක්‍රියාත්මක කිරීමට රජය සහ පරිසර අමාත්‍යාංශය විසින් ඉහළ කැපවීමකින් යුතුව කටයුතු කරන ලදී.** 2050 වසර වන විට කාබන් විමෝචනය ශුද්ධ වශයෙන් ශුන්‍ය තත්ත්වය කරා ළඟා කර ගැනීමට 'දේශගුණික සෞභාග්‍ය සැලැස්ම' (Climate Prosperity Plan) එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවට (COP27) ශ්‍රී ලංකාව විසින් 2022 වසරේ දී ඉදිරිපත් කරන ලදී. දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම වේගවත් කිරීම සහ හරිතාගාර වායු විමෝචනය අවම කරන අතර, ශ්‍රී ලංකාව වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ජාතික ආයෝජන උපාය මාර්ගය ලෙස 'දේශගුණික සෞභාග්‍ය සැලැස්ම' ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, බලශක්ති කාර්යක්ෂමතාව, පුනර්ජනනීය බලශක්ති

භාවිතය සහ සිසිලනය සඳහා තිරසාර විසඳුම් ලබා දීම ඇතුළු සිසිලන අංශය (වායු සමීකරණ සහ ශීතකරණ) වැඩිදියුණු කිරීම හරහා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම අරමුණු කරගත් ජාතික සිසිලන ප්‍රතිපත්තියට අදාළ පළමු කෙටුම්පත 2022 වසරේ දී අවසන් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය මගින්, හයිඩ්‍රොෆ්ලෝරොකාබන් පියවරෙන් පියවර සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් ගිවිසුමට (Montreal protocol) සිදු කරන ලද කිගාලි සංශෝධනය (Cigali Amendment) සඳහා අනුගත වීමට සහාය සපයනු ඇත. රටෙහි සුවිශේෂී ජෛව විවිධත්වයෙන් යුතු පරිසරය ආරක්ෂා කර ගැනීමේ ප්‍රයත්නයේ තවත් වැදගත් ඉදිරි පියවරක් ලෙස, 2022 වසරේ දී, 'ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය' සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලද අතර, එමගින් ඉහළ ජෛව විවිධත්වයෙන් යුත් ප්‍රදේශ, තෙත්බිම් සහ වෙරළබඩ කලාප ඇතුළු පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

**මධ්‍යම පරිසර අධිකාරිය වසර තුළ දී පරිසරය සුරැකීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළේය.** ජාතික දූෂණ විමෝචක (විසර්ජන) සහ විමෝචන අවශ්‍යතාවලට අනුකූලව, විශේෂිත කාර්මික කටයුතු හරහා පරිසරය වෙත දූෂණ විමෝචක මුදා හැරීම වැළැක්වීම සහ අවම කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ දී, බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත කටයුතු සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර රෙගුලාසි, පිළිවෙළින්, අංක 2264/18 සහ අංක 2264/17 දරන ගැසට් නිවේදන මගින් සංශෝධනය කරන ලදී. 2022 වසර අවසානය වන විට, කර්මාන්ත 19,160ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන ඇති අතර, ආයෝජන මණ්ඩල කලාපයේ කර්මාන්ත 786ක් ද පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලියට අදාළව කටයුතු කර ඇත. තවද, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (Environmental Impact Assessments) සහ මූලික පාරිසරික විමර්ශන (Initial Environmental Examinations) හරහා ව්‍යාපෘති මගින් ඇති විය හැකි පාරිසරික බලපෑම තක්සේරු කිරීමට අදාළව සිය කාර්යභාරය ඉටු කරමින්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 වසරේ දී පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා 7ක් සහ මූලික පාරිසරික විමර්ශණ වාර්තා 237ක් අනුමත කරන ලදී.

**පාරිසරික කළමනාකරණයට අදාළ අධිකාරීන් විසින් ජාතික ආපදා සඳහා වන සූදානම ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී.** ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2019 වසරේ දී ආරම්භ කරන ලද වායු තත්ත්ව අධීක්ෂණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ වසර තුළ දී, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහාය ඇතිව කුරුණෑගල, අනුරාධපුර සහ යාපනය නගරවල සංවේදක පාදක කරගත් වායු තත්ත්ව නිරීක්ෂණ උපකරණ ඒකක ස්ථාපනය කරන ලද අතර, දැනට ක්‍රියාත්මක වන වායු තත්ත්ව නිරීක්ෂණ වැඩසටහන ශක්තිමත් කරන ලදී. මේ අතර, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී, අන්තර්-දේශසීමා වායු දූෂණය හේතුවෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශවල වායුගෝලයේ ගුණාත්මකභාවයේ පිරිහීමක් වාර්තාවීමත් සමඟ, ඒ පිළිබඳව අවධානයෙන් සිටින ලෙස මහජනතාවට දැනුම්දෙන ලදී. එවැනි අභියෝග සඳහා නිරාවරණය වීමට ශ්‍රී ලංකාවට පවතින වැඩි ඉඩකඩ සහ එවැනි තත්ත්වයන් තුළ අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සඳහා ස්ථාපිත රාමුවක් නොමැති වීමේ ගැටලුව හඳුනා ගනිමින්, පරිසර අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරිය සහ තවත් පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකු සමඟ එක්ව, හදිසි ප්‍රතිචාර ක්‍රියාකාරී සැලැස්මක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. එවැනි අභියෝගාත්මක කාල සීමාවන් තුළ සීමා කළ හැකි දේශීය වායු විමෝචක ප්‍රභවයන් මෙම සැලැස්ම යටතේ හඳුනා ගනී. තවද, ස්වභාවික විපත්වල සමාජ ආර්ථික බලපෑම අවම කිරීම සඳහා බලධාරීන් විසින් මෙම වසර තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන්වල නිරත විය. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී පූර්ව සූදානමක් ඇති කිරීම සඳහා සාමාන්‍ය ජනතාවට, අදාළ ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට කාලගුණ අනතුරු ඇඟවීම් සහ නිවේදන 568ක් නිකුත් කළේය. මේ අතර, නාය යෑම් අවදානම අවම කිරීම පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි වැඩසටහන යටතේ 2022 වසරේ දී නුවර එළිය සහ කොළඹ දිස්ත්‍රික්කයේ තවත් නාය යෑම් ස්ථාන දෙකක නාය යෑමේ අවදානම අවම කිරීමට කටයුතු කළ අතර, වසර තුළ දී මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල වර්ග කිලෝමීටර් 480ක් ආවරණය කරමින් නාය යෑම් කලාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව සිදු කරන ලදී.

**ලෝකය වඩාත් ශීඝ්‍රයෙන් චක්‍රීය ආර්ථික ක්‍රමයක් වෙත සහ එයින් ඔබ්බට ගමන් කරමින් සිටී.** ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් දේශගුණික විපර්යාසවල

3

බලපෑම්වලට මුහුණ දී ඇති අතර, එහි බලපෑම් පිළිබඳව ඉහළ අවබෝධයක් පවතී. දේශගුණික වෙනස්වීම්වල දරුණු ව්‍යසනයන්වලට ලක්වීමේ ඉහළ අවදානමක් ඇති රටවලට අරමුදල් ලබාදීමට 2015 පැරිස් ගිවිසුම, 2021 වසරේ එක්සත් ජාතීන්ගේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ සම්මේලනය (COP26) සහ 2022 වසරේ එක්සත් ජාතීන්ගේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ සම්මේලනය (COP 27) සූදානමින් සිටී. මේ පිළිබඳව අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව ද දේශගුණික වෙනස්වීම්වල බලපෑම් සඳහා සූදානම් වීමට විස්තීර්ණ රාමුවක් සැකසිය යුතු අතර, ඉහත කී සමුළුවලදී එකඟ වූ යහපාලන මූලධර්ම සඳහා ද අනුකූල විය යුතුය. පුළුල් වශයෙන් එකඟ වූ මූලධර්ම සමඟ අනුකූල විය යුතු ශ්‍රී ලංකාවේ එක් ක්ෂේත්‍රයක් වන්නේ ආර්ථික යටිතල පහසුකම් අංශයයි. විශේෂයෙන් ම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඇතුළු සුවිශේෂී ලෙස හඳුනාගත් ව්‍යාපෘති සඳහා එවැනි අනුකූලත්වයක් සහිත රටවලට අරමුදල් ලබාගත හැක. මෙය ඉතා කල් ගතවන ක්‍රියාවලියක් හේතුවෙන් ගෝලීය වශයෙන් වූ සම්මුතීන් පිළිබඳව ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතු වේ.

3